ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 අගෝස්තු 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 නොවැම්බර් 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | මෙම වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|
| මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂ ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ හා නොගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භ ශේෂය රු.600,049,065 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 1.6.1(ඈ)(i) දේපල පිරියත හා උපකරණ |

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
| --- | --- | --- |
| 1.6.2.1(ඇ)මූල්‍ය නොවන වත්කම් | දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. | 1.6.1(ඇ)(v) දේපළ පිරියත හා උපකරණ |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගල්ගමුව පුහුණු අභ්‍යාස ආයතන විසින් 2020-2022 වර්ෂ තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් 31 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු. 1,391,419 ක මුදලක් රාජ්‍ය ආදායමට බැර කිරීම වෙනුවට තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම සඳහා තාවකාලිකව රඳවාගන්නා අංක 6000-0-0-13-0-36-0-0 දරන තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. මේ හේතුවෙන් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 6000-0-0-13-0-36-0-0 දරන පොදු තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබූ ගල්ගමුව පුහුණු අභ්‍යාස ආයතනය විසින් 2020 – 2022 වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් 31 ක් වෙනුවෙන් ලැබී තිබූ රු.1,391,419ක මුදලින් රු.971,241 ක මුදලක් මේ වන විට රජයේ ආදායමට බැර කර ඇති අතර ඉතිරි මුදල නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | තැන්පත් ගිණුමේ රඳවාගනිමින් අනුමත අරමුණට පරිබාහිර කාර්යයන් සඳහා තැන්පත් ගිණුම් භාවිතා නොකළ යුතුය. ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් තැබිය යුතුය. මීට අදාළ ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයට ලක් කර අවශ්‍ය සංශෝධන සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

#### (ආ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම සම්බන්ධව භාණ්ඩාගාර ලේකම් නිකුත් කළ 2017 ජුනි 28 දිනැති අංක 01/2017 | මෙම රු.2,302,735,391 යන අගයෙන් රු.2,006,672,433 ක මුදලක් දැනට ක්‍රියාත්මක උමා ඔය ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම් වේ. මෙම ව්‍යාපෘතිය සඳහා 2022 ට පෙර වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ වියදම් දැරූ අතර 2022 | සියලුම මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර සහතික කිරීමට පෙර ඒ පිළිබඳ තහවුරු කිරීම |

| | | | |
|---|---|---|---|
| | දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ වැය විෂය අංක 2103 (යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ), 2104 (ගොඩනැගිලි සහ ඉදිකිරීම්), 2105 (ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්) හා 2506 (යටිතල පහසුකම් සංවර්ධනය) යටතේ රු.3,924,893,334 ක් වැයකර තිබුණු නමුත් 2022 වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ලෙස රු.1,622,157,943 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව 2022 වර්ෂය තුළ මූලධන වියදම් ලෙස වැයකර තිබුණු රු.2,302,735,391කට අදාළ මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ වත්කම් ද එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ජනවාරි මස සිට වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන වෙන් වී තිබුණි. ඒ අනුව මෙම වියදම් අමාත්‍යාංශය යටතේ ප්‍රාග්ධනිත කරනවාද දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාග්ධනිත කරනවාද යන්න පිළිබඳව පැහැදිලි කිරීමක් නොතිබූ අතර, එබැවින් 2022 වර්ෂයේ මෙම අගය දෙපාර්තමේන්තු ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත නොකරන ලදී. දැනට මේ පිළිබඳ වාරිමාර්ග අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා ගෙන 2023 වර්ෂයේ දෙපාර්තමේන්තු ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලබයි.<br>ඉතිරි රු.296,062,957ක අගය වර්ෂය තුළ ප්‍රාග්ධනිත කර ඇති ඇති අතර ස්ථාවර වත්කම් ලෙස ජලාශ යටතේ ගිණුම් ගත වී ඇත. | සඳහා අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දිය යුතුය. |
| (ii) | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වත්කම් සංකේත අංක 6141403 යටතේ ජලාශ සඳහා සිදුකළ යුතු රු. 645,032,909 ක වටිනාකම් එකතු කිරීම තහවුරු කළහැකි ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ව්‍යාපෘති සඳහා වර්ෂය තුළ දරනු ලැබූ වියදම්, CIGAS ගිණුම් පද්ධතිය යටතේ ස්වයංක්‍රීයව මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම් ගත වීමක් සිදු නොවන බැවින්, එම වියදම් ආරම්භක ශේෂයට එකතු කිරීම හෝ හුවමාරු කිරීම් ලෙස ගිණුම් ගත කරනු ලැබේ. සඳහන් කර ඇති අගයන් ආරම්භක ශේෂ ලෙස ගිණුම් ගත කර ඇත. | වත්කම් සඳහා සිදු කළ එකතු කිරීම් පිළිබඳ තොරතුරු හා තහවුරු ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | පරිසර අමාත්‍යාංශය, ජලසම්පාදන අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ඒවායේ වැය ශීර්ෂවල ප්‍රතිපාදන යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙනුවෙන් වැයකරන ලද රු.2,030,061,729 ක මූලධන වියදම් නිශ්චිතව හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වල වැය ශීර්ෂ යටතේ ස්ථාවර වත්කම් සඳහා දරනු ලබ වියදම් ප්‍රාග්ධනිත කිරීම සඳහා එම වත්කම් දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව පවරා දිය යුතුය. නැතහොත් ස්ථාවර වත්කම් ද්විත්ව ගණනය විය හැකිය. සඳහන් කර ඇති ආයතන මඟින් දරනු ලැබූ වියදම් දැනට නීත්‍යානුකූලව පවරා දී නොමැති බැවින් මෙම වියදම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත | වාරිමාර්ග දෙපාර්තමේන්තුව උදෙසා වෙනත් වැය ශීර්ෂ ප්‍රතිපාදනවලින් දරනු ලබන මූලධන වියදම් හඳුනා ගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

කර නොමැත.

**(ඇ) තැන්පතු**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අනුමත අයවැයට පරිබාහිරව ආදායම් රැස්කිරීම හා වියදම් දැරීම අනුමත නොකරන බැවින් විශේෂ අවස්ථාවකදී පාර්ලිමේන්තුවේ සම්මත කෙරෙන පනතකින් හැර වෙනත් කිසිදු ආකාරයක අරමුදල් ඇති කළ නොහැකි වුවද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කුඩා ජලවිදුලි බලාගාර ඉදිකිරීම, වැලි ඉවත් කිරීම ඇතුළු වෙනත් ආර්ථික කටයුතු සඳහා බලපත්‍ර ලබා දීම හා විවිධ රාජ්‍ය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම වෙනුවෙන් රු.10,000ක් බැගින් වූ ගාස්තුවක් අයකර, එය අංක 6000-0-0-13-0-36-0-0 දරන, තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම සඳහා තාවකාලිකව රඳවාගන්නා තැන්පත් ගිණුමේ තැන්පත් කර, විධිමත් අධිකාරි බලයකින් තොරව වියදම් දරා තිබුණි. මෙම තැන්පත් ගිණුම තුල කුඩා ජලවිදුලි බලාගාර ඉදිකිරීම, වැලි ඉවත් කිරීම ඇතුළු වෙනත් ආර්ථික කටයුතු සඳහා ලැබී තිබූ ගාස්තු වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,008,171 ක ශේෂයක් පැවති අතර මු.රෙ 569 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ අදාළ කාර්යයන් තුළින් එක්රැස් කළ ආදායම් හා දරන ලද වියදම් පිළිබඳ නිශ්චිතව හඳුනාගත හැකි පරිදි ගිණුම් තබා නොතිබුණි. | 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/28 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව පත්කරන ලද ජනාධිපති කාර්ය සාධන බලකාය නිකුත් කරන ලද "ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිතා කරන ඛනිජ කැණීම්, ප්‍රවාහන සහ වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහය අනුව සියලුම අදාළ රාජ්‍ය ආයතන නිර්දේශ ලබාදීම සඳහා ගාස්තු අය කරනු ලැබේ". ඒ අනුව වාරිමාර්ග දෙපාර්තුමේන්තුව නිර්දේශ නිකුත් කිරීම සඳහා රු. 10,000 ක් අය කරනු ලැබේ. එසේම වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් 2019.02.25 දිනැති ලිපියෙන් වැලි කැණීම් නිර්දේශ ලබාදීම සඳහා (ක්ෂේත්‍ර පරීක්ෂාවන් සඳහා) රු. 10,000 ක මුදලක් පරිපාලන වියදම් ලෙස අයකර ගැනීමට උපදෙස් ලබාදී ඇත.<br>දෙපාර්තමේන්තුවේ වියදම් සඳහා වූ වාර්ෂික ප්‍රතිපාදන මෙවැනි අතිරේක නිර්දේශ ලබාදීම සඳහා යෙදවීමට ප්‍රමාණවත් නොවීම හා ඒ වෙනුවෙන් දෙපාර්තමේන්තුව වියදම් දැරීම නිවැරදි නොවන බැවින් නිර්දේශ ලබාදීම සඳහා ගාස්තු අයකරනු ලබන අතර එම ගාස්තු මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන අදාළ නිර්දේශ නිකුත් කිරීමේදී වැයවන වියදම් ප්‍රතිපූර්ණයට යොදවාගනු ලැබේ.<br>රු. 6,008,171 ක මුදල වැලි බලපත්‍ර ගාස්තු සඳහා නිර්දේශ නිකුත් කිරීම වෙනුවෙන් අංක 6000-0-0-13-36-0-0 දරන පොදු තැන්පතු ගිණුම යටතේ පවත්වාගෙන යනු ලබන තැන්පතුවකි. අදාළ තැන්පතු නිදහස් කිරීමේදී රික්විසිෂන්පත් මුදල් රෙගුලාසි 206 ප්‍රකාරව සෑම විටම | දෙපාර්තමේන්තුව විවිධ කාර්යන් තුළින් රැස්කරන ආදායම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන එම ආදායම් එකතු කිරීමට විධිමත් පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතු අතර, එම ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.<br>තැන්පත් කළ යුත්තේ ඒ සඳහා අනුමත ලැබීම් පමණක් වන අතර එහි ඇති මුදල් ඊට අදාළ නිශ්චිත කාර්යයන් සඳහා පමණක් වැය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කර ගෙවීම් සිදු කරයි. | |
| (ii) | තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් වූ අංක 6000-0-0-13-0-36-0-0 දරන තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.192,455,677 ක් වූ අතර, ඉන් ඇතැම් තැන්පතු අදාළ කාර්ය සඳහා යොදවා නොගෙන 2016 වර්ෂයේ සිට රඳවාගෙන තිබුණි. එසේ රඳවාගන්නා ලද තැන්පතු අතරින් රු. 500,000 වඩා වැඩි වටිනාකම් සහිත තැන්පත් 48ක එකතුව රු.167,757,978ක් විය. | තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් අංක 6000-0-013-0-36-0-0 දරන තාවකාලික රඳවා ගන්නා තැන්පතු ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට 2016 වර්ෂයට අදාළ රු. 32,179.96 ක තැන්පතු මුදලක් පවතින අතර එම මුදල මේ වන විට රජයේ ආදායමට බැර කර ඇත.<br>තවද රු. 500,000 වඩා වැඩි වටිනාකම් සහිත තැන්පතු 48 ක රු. 167,757,978 ක ශේෂයෙන් මේ වන විට රු. 67,145,258.68 ක් නිරවුල් කර ඇත. | දෙපාර්තමේන්තුව වෙත විවිධ කාර්යන් සඳහා ලැබෙන මුදල් පොදු තැන්පත් ගිණුමෙහි දිගුකාලීනව රඳවා තැබීමට කටයුතු නොකළ යුතු අතර එම මුදල් අදාළ කාර්යන් සඳහා නොපමාව යොදවාගත යුතුය. |

(ඇ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------------ | ----------- |
| (i) | 2022 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂ එකතුව රු.98,669,997,608 ක් ලෙස සටහන් කිරීමේ දී වත්කම් ගිණුම් 9 ක එකතු වටිනාකම රු.600,435,665 ක් අඩුවෙන් හා වත්කම් ගිණුම් 2 ක එකතු වටිනාකම රු.386,600 ක් වැඩියෙන් දක්වා තිබුණි. 2021 මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු. 99,270,046,673 ක් වූයෙන් මූල්‍ය නොවන වත්කම්වල පෙර වර්ෂය අවසාන ශේෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.600,049,065 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ශේෂ වල වෙනස්කම් පිළිබඳ වර්ෂ අවසානයේ භාණ්ඩාගාරය වෙතින් විමසීම් කළ විට, 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් හා තුලනය වීම ප්‍රමාණවත් බවට උපදෙස් ලැබුණු අතර ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් වල වත්කම් ශේෂයන් හා දෙපාර්තමේන්තු ලෙජර් ගිණුම් වල වත්කම් ශේෂයන් තුලනය වන අතර එම ශේෂ භාණ්ඩාගාර ගිණුම් ශේෂ සමඟ ද තුලනය වේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉකුත් වර්ෂ අවසන් ශේෂ සංසන්දනාත්මකව පරීක්ෂා කර නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගර ලේකම් නිකුත් කළ 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන චක්‍රලේඛය අනුව මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද සමාලෝචිත | දැනට දරනු ලබන සියලු වියදම් අදාළ ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති වියදම් ලෙස ප්‍රාග්ධනිත කරනු ලබන අතර, ව්‍යාපෘතිය අවසන් වූ පසු එහි වියදම් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ගිණුම් ගත කරනු ලැබේ. | එක් එක් ව්‍යාපෘතිය යටතේ අත්පත් කරගනු ලබන වත්කම් වෙන් වෙන්ව හඳුනාගත හැකිවන පරිදි උප ලේඛන පිළියෙල කර මූල්‍ය නොවන වත්කම් වෙන් වෙන්ව |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 6141403 යටතේ වැව් ජලාශවල වටිනාකම ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරවූ ව්‍යාපෘති 46 ක් වෙනුවෙන් දරන ලද රු.73,242,085,249 ක් මුළු පිරිවැයම ගිණුම්ගත කර තිබුණු අතර එම වටිනාකම තුළ ඇතුළත් ගොඩනැගිලි, ප්‍රවාහන උපකරණ, වෙනත් යන්ත්‍ර හා උපකරණ සහ වෙනත් මූල්‍ය නොවන වත්කම් වෙන්ව හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | | හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |
| (iii) | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 61121 යටතේ ප්‍රවාහන උපකරණ රු.4,379,010,064 ක හා සංකේත අංක 61122 යටතේ වෙනත් යන්ත්‍ර හා උපකරණ රු.1,054,019,558 ක වටිනාකම් ගිණුම්ගත කර තිබුණද එම වටිනාකම තහවුරු කළහැකි ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙම වටිනාකම සැකසී ඇත්තේ දෙපාර්තමේන්තුවට අයත් සියලුම කලාප කාර්යාල වල හා ප්‍රධාන කාර්යාලයට අයත් සියලුම වාහන, කෘෂිකාර්මික උපකරණ, යන්ත්‍ර සූත්‍ර උපකරණ, කාර්යාල උපකරණ, පරිගණක උපකරණ, සන්නිවේදන උපකරණ යන සියලුම ස්ථාවර වත්කම් වල වටිනාකම්ය. එම උපකරණ වලට අදාළ සියලු තොරතුරු හා වටිනාකම් වලට අදාළ CIGAS පරිගණක මෘදුකාංගය යටතේ පිළියෙල කළ ස්ථාවර වත්කම් ලේඛනය විද්‍යුත් ලිපිනයට මේ සමඟ ඉදිරිපත් කරමි. | එක් එක් ව්‍යාපෘතිය යටතේ අත්පත් කරගනු ලබන වත්කම් වෙන් වෙන්ව හඳුනාගත හැකිවන පරිදි උප ලේඛන පිළියෙල කර මූල්‍ය නොවන වත්කම් වෙන් වෙන්ව හඳුනා ගෙන ගිණුම් තැබිය යුතුය. විගණනය සඳහා අවශ්‍ය වත්කම් තහවුරු ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සංකේත අංක 6111 යටතේ ගොඩනැගිලි වටිනාකම රු.2,592,069,648ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ අංශය මගින් ගොඩනැගිලි 2562 ක ලේඛනයක් සකස්කර තිබූ නමුත් එහි ගොඩනැගිලි වටිනාකම දක්වා නොතිබුණු අතර ඒ හේතුවෙන් එම වටිනාකමෙහි නිරවද්‍යතාවය තහවුරු නොවුණි. | පිළිගනිමි. ගොඩනැගිලි වටිනාකම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. ගණනය කිරීම් ලැබුණු පසු නිවැරදි වටිනාකම් ඇතුළත් කිරීමට කටයුතු කරමි. | ගිණුම් ගත කරනු ලබන මූල්‍ය නොවන වත්කම් ශේෂය තහවුරු කළ හැකි වන පරිදි එක් එක් වත්කමේ වටිනාකම දැක්වෙන පරිදි උපලේඛන පිළියෙල කළ යුතුය. |
| (v) | දෙපාර්තමේන්තුවේ කලාප අධ්‍යක්ෂ කාර්යාලවල හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ඉඩම් අක්කර 4,735 පර්චස් 123 ක් හා බණ්ඩාරවෙල, ගාල්ල, නුවර, පොළොන්නරුව, | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් සියලු ඉඩම් හා ගොඩනැගිලි නිවැරදිව හඳුනාගෙන ඒවායේ |

| | | | |
|---|---|---|---|
| | මොනරාගල, හම්බන්තොට වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවල පිහිටි ගොඩනැගිලි 392 ක් තක්සේරු කර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | | වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (vi) | වෙලි ආරක්ෂණ ව්‍යාපෘතිය මඟින් ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය වෙත පවරා දී තිබුණු ස්වයංක්‍රිය ජල මාපක හා වැසි මාපක 106 ක් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශයන්හි මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ව්‍යාපෘතිය මඟින් පවරා දී ඇති ස්වයංක්‍රීය ජල මාපක හා වැසි මාපක මූල්‍ය ප්‍රකාශයන්හි මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අග්‍රිම සැලැසුම් කිරීම, අග්‍රිම ඉල්ලුම් කිරීම හා අග්‍රිම උපයෝජනය සම්බන්ධයෙන් අනාවරණය වූ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | -------------------------------- | ------------- |
| සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව සැලසුම් කරන ලද කාර්යයන් ඉටුකිරීම සඳහා සැලසුම් කර තිබුණු මුළු අග්‍රිම අවශ්‍යතාවය වූ රු.19,341,901,000 දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබුණු නමුත් ලැබී තිබුණු මුළු ප්‍රතිපාදනය රු.10,538,704,000 ක් එනම්, ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 54.4 ක් පමණක් වීම නිසා රු.8,803,197,000 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | පිළිගනිමි. රට තුළ පැවති අයහපත් ආර්ථික තත්වය මත අයදුම් කළ අක්මුදල් සියල්ල නොලැබුණි. එම තත්ත්වය මෙම වසරේද පවතී. | අග්‍රිම සැලසුම් කිරීමේ දී ප්‍රායෝගික තත්ත්වයන් සලකා බලා විචලතා අවම වන පරිදි පුරෝකතනය කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන ලබා ගැනීම, උපයෝජනය හා ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------------- | ----------- |
| (අ) | ඇස්තමේන්තු සකස් කිරීමේ දී | ඉදිකිරීම් ද්‍රව්‍ය සපයා ගැනීමේ | අයවැය සකස් |

| | | | |
|---|---|---|---|
| | අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව මුදල් වෙන්කර ගැනීම, සැලසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම යන හේතු නිසා සමාලෝචිත වර්ෂයේ රු. 940,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබූ ව්‍යාපෘති වැය විෂයයන් 5කින් රු.283,000,000 ක් වෙනත් වැය විෂයන්ට මාරුකර තිබුණි. මේ අයුරින් සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කර නොගෙන සියයට 30 කට වැඩි ප්‍රමාණයක් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබීම නිසා සැලසුම්ගත සංවර්ධන කාර්යන් ඉටු වී නොතිබුණි. | දුෂ්කරතා ඉන්ධන ලබා ගැනීම දුෂ්කරතා මෙන්ම කාර්තුමය වශයෙන් අයවැය ප්‍රතිපාදන ලබාදීම හේතුවෙන් සමහර ව්‍යාපෘති වල ප්‍රගතිය අපේක්ෂිත පරිදි ළඟා කරගැනීමට නොහැකි විය. | කිරීමේදී අවශ්‍යතා හඳුනාගෙන හැකිතාක් දුරට විචලතා අවමවන පරිදි වියදම් ඇස්තමේන්තු කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අයවැය ලේඛනය මගින් ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්, යටිතල පහසුකම් සංවර්ධන වැය විෂයයන් යටතේ එක් එක් සංවර්ධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා වෙනත් වැය විෂයයන් 3 ක් යටතේ වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් රු.90,000,000 ක් මාරු කරගෙන තිබුණි. | ව්‍යාපෘතිවල අක් මුදල් නොලැබීම මත වියදම් සිදු කිරීමට නොහැකි වී ඇත. | අයවැය සකස් කිරීමේදී අවශ්‍යතා හඳුනාගෙන හැකිතාක් දුරට විචලතා අවමවන පරිදි වියදම් ඇස්තමේන්තු කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 255/2017 හි 02(ඇ) ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවට ලබා දී තිබූ උපදෙස්වලට පටහැනිව 2022 දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 5 කට අදාළව රු.129,908,705 ක බැරකම්වලට එළඹ තිබුණි. | වෙන්කර තිබූ ප්‍රතිපාදන සීමාව තුළ බැරකම් වලට එළඹ තිබූ අතර ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම නිසා 2022 දෙසැම්බර් 31 දින වන විටත් එම බැරකම් නිරවුල් කළ නොහැකි විය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මුදල් වර්ෂයට අදාළ ගෙවීම් එම මුදල් වර්ෂයේ දී නිදහස් කළ යුතු අතර, කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන යාමට කටයුතු නොකළ යුතුය. එසේ සිදු කිරීම අත්‍යාවශ්‍ය වන්නේ නම් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව බැඳීම් හා බැරකම් ලේඛනය පවත්වා නොතිබූ අතර බැරකම් පිළිබඳ තොරතුරු පමණක් ඉදිරිපත් කර බැඳීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ. 94.2 යටතේ බැඳීම් වලට එළඹ නැත. කෙසේ වෙතත් මේ පිළිබඳව අවධානය යොමු කරමින් නැවතත් කලාප කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 255/2017 ට අනුකූලව බැරකම් හා බැඳීම් වෙන් වෙන්ව හඳුනාගෙන ලේඛන ගත කර ගිණුම් මගින් ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | යාන් ඔය ජලාශය ඉදි කිරීමේ ව්‍යාපෘතියට අදාළව පස් කියුබ් 1,355,907ක් හා වැලි කියුබ් 16,571ක් සඳහා රාජ්‍යභාග වශයෙන් රු.38,044,762 ක් හිඟව පවතින බව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2018 අගෝස්තු මස දැනුම් දී තිබුණි. අදාළ හිඟ මුදල මූල්‍ය ප්‍රකාශනයන්හි බැරකමක් හෝ බැඳීමක් ලෙස දක්වා නොතිබුණි. | යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය වෙත රාජ්‍යභාගය ගෙවීම සම්බන්ධයෙන් අවසන් නිගමනයකට එළඹ නැති අතර මේ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින් ඇත. එබැවින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ගෙවිය යුතු රාජ්‍යභාගය බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නැත. | අදාළ සියලු බැරකම් හා බැඳීම් හඳුනාගෙන ලේඛන ගත කර ගිණුම් මගින් ඉදිරිපත් කළ යුතුය. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සඵලදායිත්වය සඳහා කලින් කල සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව පිළිගනිමි.<br>දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර පාලන පද්ධතියේ සමාලෝචනය සතිපතා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සතිපතා පැවැත්වෙන ජ්‍යෙෂ්ඨ නිලධාරී රැස්වීම මගින් සිදුකරන අතර, එම රැස්වීම් වල සාකච්ඡා සටහන් අංශ ප්‍රධානීන් වෙත | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නිකුත් කරනු ලැබේ. එම සාකච්ඡා සටහන් සාරාංශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | |
| (ii) | විගණකාධිපතිවරයාට අවශ්‍යා වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.13 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාල 14ක් හා ප්‍රාදේශීය කාර්යාල 52 ක් හා තවත් ආයතනික අංශ රැසක් පවතින බැවින්, විගණන විමසුමක් සඳහා පිළිතුරු සැපයීමේ දී දිවයින පුරා ක්‍රියාත්මක එම කාර්යාල සියල්ලගෙන්ම තොරතුරු කැඳවීමට සිදුවීම, මෙම ප්‍රමාදයට හේතුවයි. ඉදිරියේදී පිළිතුරු වඩාත් කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගනිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් සියලුම විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම සිදු වන බවට සහතික විය යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>---------------<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | <br><br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 11 වැනි වගන්තිය | වාරිමාර්ග දඩ අරමුදලක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | වාරිමාර්ග ආඥා පනත යටතේ දක්වා ඇති වරදවල් සහ අලාභානි සම්බන්ධයෙන් අයකරනු ලබන මුදල් පොදු තැන්පත් ගිණුමට බැර කර අදාළ හානි පූර්ණය කිරීම සඳහා වැය කිරීමත් ඉතිරි මුදල් හා රාජ්‍යභාගය රජයේ ආදායමට බැර කිරීමත් සිදුකරනු ලබයි. | වාරිමාර්ග සංශෝධන පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දඩ අරමුදලක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) | XXIV වැනි පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති | ණය ලබා ගත් නිලධාරීන් අතරින් මිය ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,266,323ක්, විශ්‍රාම ගොස් තිබූ සේවකයන් 92 දෙනෙකුගෙන් අයවිය යුතු රු.9,412,408 ක් සහ වැඩ තහනමට ලක් වූ | 2022 දෙසැම්බර් 31 දිනට මිය ගිය 19 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු.2,266,323.63 කින් 4 දෙනෙකු සඳහා වන රු. 426,124ක් 2023.06.30 දින වන විට අයකර ගෙන ඇති අතර තව දුරටත් අයවිය යුතු මුදල රු.1,840,199 කි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ආපසු නොගෙවූ ණය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. ණය අයකර |

| | | | |
|---|---|---|---|
| | නිලධාරීන්ගෙන්, සේවය හැර ගිය නිලධාරීන්ගෙන් හා සේවය අත්හිට වූ නිලධාරීන් 36 දෙනෙකුගේ අය විය යුතු රු.3,693,751 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන් තුළ වර්ෂ තුනකට වඩා පැරණි රු. 2,846,837 ණය ශේෂයක් හා අවුරුදු පහකට වැඩි රු.1,705,310 ක ණය ශේෂයක් විය. | 2020 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය 92 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු. 9,412,407.87 කින් 17 දෙනෙකු සඳහා වන රු. 1,234,507ක් 2023 ජුනි 30 දින වන විට අයකර ගෙන ඇති අතර තව දුරටත් අයවිය යුතු රු. 8,177,900.87 ක ශේෂය අයකර ගැනීමට ක්‍රියාකරමින් පවතී.<br>2023 ජුනි 30 දිනට ණය ශේෂ අය වූ 21 දෙනාගෙන් 16 දෙනෙකුගේ හිඟ ණය ශේෂ මාසික වාරික ලෙස අය වේ.<br>උක්ත ණය ශේෂයන් තුළ ඇතුළත් වර්ෂ තුනකට වඩා පැරණි ණය ශේෂය වන රු. 2,846,837.47 න් රු.223,358ක මුදලක් 2023.06.30 දින වන විට අය වී ඇති අතර තව දුරටත් රු. 2,623,479.47 ක් අය කර ගත යුතුය.<br>ණය ශේෂයන් තුළ ඇතුළත් වර්ෂ පහකට වඩා පැරණි තව දුරටත් අය විය යුතු රු. 1,626,545.48 ක ශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (ii) XIX වැනි පරිච්ඡේදයේ 5.2.1 හා 5.3.1 වගන්ති | දෙපාර්තමේන්තුවට අයත් කලාප 14 ක පිහිටි නිල නිවාසවල පදිංචි නිලධාරීන්ගෙන් හා සේවකයින්ගෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව නිල නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. | මින් ඉදිරියට නිවාස කුලී අය කර ගැනීමේ දී ආයතන සංග්‍රහය ප්‍රකාරව නිවැරදි ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස උපදෙස් ලබා දී ඇත. | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස වල පදිංචි නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහයේ නියමයන්ට අනුව නිල නිවාස කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ 104-109 | 1979 සිට 2012 අතර කාලයේ සිදුවී තිබුණු රු. 18,191,201 ක හානි හා පාඩු 30 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 සිට 109 අනුව හානි හා පාඩු ලේඛනයෙහි තවදුරටත් කටයුතු කරමින් පවතින අලාභ සම්බන්ධ සිදුවීම් 22ක් ඇත. | මු.රෙ.104 සිට 109 දක්වා වූ රෙගුලාසිවලට අනුව හානි හා පාඩු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ 756 | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වල මෙහෙයුම් හා නඩත්තු වැඩ සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා නිකුත්කර, ඉංජිනේරු සහකාරවරුන් භාරයේ ඇති ද්‍රව්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් පරීක්ෂා කර නොතිබුණි. | වාර්ෂික ගබඩා ද්‍රව්‍ය සමීක්ෂණ පැවැත්වීමේදී කටයුතු කළයුතු ආකාරය සම්බන්ධයෙන් පවතින චක්‍රලේඛ යාවත්කාලීන කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | ඉංජිනේරු සහකාරවරුන් භාරයේ ඇති ද්‍රව්‍ය මු.රෙ.756 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයට ලක් කළ යුතුය |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ | | | |
| (i) | මාර්ගෝපදේශ 3.4 | හිරියාල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් මිල සැඳහුම් ක්‍රමය (Shopping) භාවිතා කර ඇඳගල අමුණ ඉදිකිරීමට රු.මිලියන 5 ට වැඩි මිලදී ගැණුම් සිදුකර තිබුණි. | පිළිගනිමි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුනිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාර මිල දී ගැනීම් සිදු කළ යුතුය. |
| (ii) | මාර්ගෝපදේශ 8.9.1 | රු.500,000 ඉක්මවූ භාණ්ඩ කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත්, හිරියාල වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය මගින් ක්‍රියාත්මක මිලදී ගැනීම් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. | පිළිගනිමි. නිවැරදි ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කරගනිමින් කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නියමයන් ප්‍රකාරව රු.500,000 ඉක්මවූ භාණ්ඩ මිල දී ගැනීම් කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් ලියා අත්සන් කළ යුතුය. |
| (ඉ) | 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.6 ඡේදය | වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ මාස 02 ක් ඇතුළත පියවා ගෙන නොමැති නම් තුන්වන මාසය තුළ දී අදාළ ස්ථාන මාරුව සිදු කළ දෙපාර්තමේන්තුවේ මාසික ගිණුම් සාරාංශය මඟින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් රු.537,530 ක හිඟ ණය ශේෂයක් අය කර ගත යුතුව පැවතුණි. | වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 537,530ක ණය මුදල මාසික වාරික වශයෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට අනුව කටයුතු කර හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ | දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු පද්ධතිය නිවැරදි ලෙස හා | තාක්ෂණික මෙහෙයුම් හා පාලන තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම පිණිස භූගෝලීය තාක්ෂණ | 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ |

| | | | |
|---|---|---|---|
| | චක්‍රලේඛය | යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. | දත්ත පද්ධතියක් මේ වන විට පවත්වා ගෙන යමින් තිබේ. ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියේ (www.irrigation.gov.lk) භූ ගෝලීය තොරතුරු තාක්ෂණ බිහිදොර හරහා ප්‍රවිෂ්ට විය හැක. | උපදෙස් පරිදි දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යන තොරතුරු පද්ධතිය නිවැරදිව හා යාවත්කාලීනව නඩත්තු කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තා කළ යුතුය. |
| (උ) | 1982 අංක 23 දරන වාරිමාර්ග දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ (අ) ඡේදය | දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාරවරුන් විසින් මාසික ද්‍රව්‍ය වාර්තා ඊළඟ මාසයේ වැඩකරන දින 5 ක් ඇතුළත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. ඒ සඳහා උපදෙස් ලබාදී ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉංජිනේරු සහකාරවරුන් විසින් ද්‍රව්‍ය වාර්තා පවත්වාගෙන යාම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |

## 2.6 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මු.රෙ. 385(1)(අ) ප්‍රකාරව රු. 500 ට හෝ ඊට වැඩි මුදලක් ගෙවීමේදී එය මුදලින් නොගෙවිය යුතු වුවත් ඊට පටහැනිව හා නිසි අනුමැතියක් තොරව 2022 වර්ෂයේදී රු. 352,420,052 ක් වටිනා චෙක්පත් 1177 ක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු නමට නිකුත්කර තිබුණි. අනතුරුව කොට්ඨාශ සහකාර විසින් එම චෙක්පත් වල රේඛනය අවලංගු කර මුදල් කරගෙන අනුමැතියකින් තොරව ගෙවීම්ලාභීන් වෙත මුදලින් ගෙවීම් කර තිබුණි. | කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති අතර නිවැරදි ක්‍රමවේදයන් ඔස්සේ වංචා, දූෂණ හා අක්‍රමිකතාවයන් ඇති නොවන ආකාරයට එම කටයුතු පවත්වා ගෙන යන ලෙසත් මුදල් රෙගුලාසි චක්‍රලේඛ, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා අනෙකුත් නීති රීති වලට අනුකූල වෙමින් මනා මූල්‍ය පාලනයකින් කටයුතු කරන ලෙසටත් උපදෙස් ලබා දී ඇති අතර චෙක්පත් නිකුත් කිරීමේදී එම උපදෙස් වලට අනුව කටයුතු කරන ලෙසට ප්‍රාදේශීය කාර්යාලද දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | මු.රෙ. 385(1)(අ) ප්‍රකාරව ආදායකයා නමින් චෙක්පත් ලියා රේඛනය කර ගෙවීම් කළ යුතුය. එයට පටහැනිව කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. ප්‍රාදේශීය කාර්යාලයන්හි මුදල් ගෙවීම් සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය පද්ධතිය ශක්තිමත් කළ යුතුය. |
| (ආ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අංක 51 – 9694 දරන කැබ් රථය 2001 අගෝස්තු 13 දින කල්මුනේ පොලිස් බල ප්‍රදේශය තුළ ඉංජිනේරු | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අංක 51-9694 දරන කැබ් රථය සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගය සඳහන් කර මෝටර් රථ ප්‍රවාහන | අදාළ වාහනයේ ලියාපදිංචිය අවලංගු නොකිරීම තුළින් ලියාපදිංචි සහතිකය |

| | | |
|---|---|---|
| සහකාරවරයෙකු සමඟ සේවයේ යොදවා තිබියදී පැහැර ගැනීමට ලක්ව තිබුණි. මේ සම්බන්ධයෙන් කල්මුනේ මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක 22647/pc නඩුවේ වාර්තාව අනුව මෙම සිද්ධිය සැකකරුවන් නොදන්නා අපරාධයක් ලෙස තීන්දු කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පත් කර තිබූ පරීක්ෂණ මණ්ඩලය මෙම අලාභය රජයට සිදුවූ අලාභයක් ලෙස සලකා පොතෙන් කපා හැරීමට 2022 මාර්තු 31 දින නිර්දේශ කර තිබුණි. ඒ අනුව වාහනය පැහැරගෙන ඇති බව තහවුරු කරගත් විගසම එහි ආදායම් බලපත්‍ර නිකුත් කිරීම නවත්වන ලෙසත් ලියාපදිංචිය අවලංගු කරන ලෙසත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා වෙත දැනුම් දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් අදාළ රථය සඳහා 2022 ජුනි 29 දින සිට 2023 ජුනි 28 දින දක්වා වලංගු වන පරිදි ආදායම් බලපත්‍රයක් 2022 ඔක්තෝබර් 27 දින කුරුණෑගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වෙත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර තිබුණි. | කොමසාරිස් වෙත ලියාපදිංචි තැපෑලෙන් යවන ලද ලිපියේ පිටපතක් මේ සමග ඉදිරිපත් කරමි. | අවභාවිතයට ඉඩකඩ සැලසූ වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. දෙපාර්තමේන්තුවට අයත් භාවිතයෙන් ඉවත් කරනු ලබන වාහනයන්හි ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වු අඩුපාඩු පහත දැක්වේ**.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | ----------------------------- | ------------ |
| 2016 වර්ෂයේ අවසන් වූ දැදුරු ඔය ව්‍යාපෘතිය සඳහා ලංකා බැංකුව වාරියපොළ ශාඛාවේ 2008 මාර්තු 03 දින ආරම්භ කර තිබූ අංක 7042466 දරන ජංගම ගිණුම ව්‍යාපෘතියේ කටයුතු අවසන් වීමෙන් පසු විධිමත්ව වසා දැමීමට කටයුතු නොකර වාරියපොළ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ ගනුදෙනු සඳහා මේ දක්වා පවත්වාගෙන යමින් පැවතුණි. එහිදි මු.රෙ 381(1) අනුව මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | මු.රෙ. 381 (1) අනුව අංක 7042466 දරන ගිණුම ආරම්භ කිරීමට මහා භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතිය ලබා ගෙන ඇත. එම ව්‍යාපෘතියේ පොදු තැන්පත් ගිණුමට අදාළ කටයුතු සහ බැරකම් පියවන තුරු මෙම ගිණුම පවත්වා ගෙන ගොස් ඇති අතර එම ගිණුමේ නාමය වෙනස් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. | ව්‍යාපෘති කටයුතු අවසන් වීමෙන් පසු අදාළ බැංකු ගිණුම විධිමත් පරිදි වසා දැමීමට කටයුතු කළ යුතුය. බැංකු ගිණුමක් ආරම්භ කළ අරමුණට පරිබාහිර කටයුතු සඳහා භාණ්ඩාගර අනුමැතියකින් තොරව එම ගිණුම් භාවිතා නොකළ කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | -------------- |
| (අ) | සියඹලන්ගමුව ඔයේ සිට මහ ගල්ගමුව වැව දක්වා පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය | | |
| (i) | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා විසින් 2011 සැප්තැම්බර් 11 දින ඉදිරිපත්කර තිබූ "වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මහා/මධ්‍ය පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති පිළිබඳ දස අවුරුදු සැලැස්ම" යන මැයෙන් වූ අංක 11/1858/508/034 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2011 සැප්තැම්බර් 28 දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත උක්ත ව්‍යාපෘතිය 2012-2014 කාල සීමාව තුළ නිම කිරීමට අපේක්ෂා කර ආරම්භ කර තිබූ අතර වසර 9 ක් ගතවී තිබුණද මේ දක්වා නිමකර නොතිබුණි. | යෝජිත මහගල්ගමුව පෝෂිත ඇළෙහි ඉදිකිරීම් කටයුතු 2012 වර්ෂයේ ආරම්භ කර 2014 වසර තුළ අවසන් කිරීම සඳහා රුපියල් මිලියන 500 ක මුදලක් වෙන්කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති නමුත්, ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා ඇස්තමේන්තු අනුමත වී ඇත්තේ 2015 වසරේ දීය. ඒ අනුව ඇළෙහි කැණීම් හා නිර්මිත ඉදිකිරීම් ආරම්භ කර ඇත.<br>2020 – 2021 වර්ෂවල පැවති කොරෝනා වසංගත තත්ත්වයත්, නිලධාරීන් විටින් විට ස්ථානමාරු වී යාමත්, ලබා දී ඇති කොන්ත්‍රාත් අවසන් නොකර නවතා දැමීමත් නිසා ව්‍යාපෘති වැඩ ප්‍රමාද වීමට හේතු වී ඇත.<br>ඉතිරිව ඇති වැඩ කොටස් සම්පූර්ණ කිරීම සඳහා පළමුව අනුමත කර ඇති ඇස්තමේන්තුව සංශෝධනය කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. | නියම කරනු ලබන කාලසීමාව තුළ ව්‍යාපෘති නිම කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කර නිශ්චිතව වගකීම් පැවරිය යුතුය. එක් එක් අදියර අවසානයේ අපේක්ෂිත ප්‍රතිලාභ ඇගයීම් කර ප්‍රමාදවීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.<br>ව්‍යාපෘතීන් දීර්ඝකාලීන ප්‍රමාදයන් මගින් අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ අහිමි වීමේ ආවස්ථික පිරිවැය ගණනය කොට වාර්ෂික කාර්යසාධන වාර්තාව තුළ හෙළිදරව් කළ යුතුය. |
| (ii) | උක්ත ව්‍යාපෘතියෙහි ශක්‍යතා අධ්‍යන වාර්තා අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් පලුකඩවල අක්කර 800, මහගල්ගමුව අක්කර 400 ක් හා නව ඉඩම් අක්කර 200 ක් වශයෙන් අක්කර 1400 ක් සඳහා වාරි ජලය සැපයීම අරමුණු කර තිබූ අතර ඒ සඳහා 2014-2022 කාල සීමාව තුළ රු. මිලියන 375 ක් වැයකර තිබූ නමුත් එකී පිරිවැයෙන් ජාතික ආර්ථිකයට මේ දක්වා කිසිදු ප්‍රතිලාභයක් අත්වී නොතිබුණි. | මෙම ඉදිකිරීම විධිමත්ව සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කරමින් පවතී. විධිමත් අනුමැතියෙන් පසු ඉදිකිරීම් සිදු කිරීමට අපේක්ෂිතය. | විධිමත් සැලැස්මකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ආර්ථික ප්‍රතිලාභ අහිමි කිරීමට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු වඩා |

| | | | |
|---|---|---|---|
| | | | කාර්යක්ෂමව හා පිරිවැය අවම වන පරිදි සිදු කිරීමට කාල වකවානු නිශ්චය කර සැලසුම් කර එම සැලසුම් ප්‍රකාරව ක්‍රියාත්මක විය යුතුය. |
| (iii) | ව්‍යාපෘතිය සඳහා පාරිසරික අධ්‍යයන වාර්තාවක් සකස්කර අනුමැතිය ලබාගෙන නොතිබූ අතර මු.රෙ 35 (4) සහ 36 අනුව ප්‍රාථමික අනුමැතිය හා අවසාන අනුමැතිය ලබාගැනීමකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. තවද වාරි ජලය සැපයීමට අවශ්‍ය ඉඩම් විගණිත දින තෙක් හඳුනාගෙනද නොතිබුණි. | මෙම ඉදිකිරීම විධිමත්ව සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කරමින් පවතී. විධිමත් අනුමැතියෙන් පසු ඉදිකිරීම් සිදු කිරීමට අපේක්ෂිතය. | පාරිසරික අධ්‍යයන වාර්තාවන් හා මු.රෙ. 35(4) හා 36 ප්‍රකාරව ප්‍රාථමික හා අවසාන අනුමැතියකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් වගකීම් විරහිතව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (iv) | මෙම ව්‍යාපෘතිය සඳහා මු.රෙ 20 අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර නොතිබූ අතර කුරුණෑගල වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් වරින් වර ඇස්තමේන්තු අනුමත කරමින් සැලසුමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. මේ හේතුවෙන් කිලෝමීටර් 14 ක් දිගට තැනින් තැන කැණීම් සිදුකර තිබූ නමුත් ඇළමාර්ග නිසිපරිදි සකස්කර නොතිබීම හේතුවෙන් එම ස්ථානයන්හී ජලය එක්රැස් වීම තුළ රෝග ඇතිවීම, ගමනාගමනයට බාධා පැමිණීම, මිනිසුන් හා වනසතුන්ගේ ආරක්ෂාවට තර්ජනයක් ඇතිවීම ආදි පාරිසරික හා සාමාජීය ප්‍රශ්න රාශියක් නිර්මාණය වී තිබුණි. | -එම- | ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර ගැනීමකින් හා විධිමත් සැලැස්මකින් තොරව ඇළ මාර්ගය අවිධිමත්ව ඉදි කිරීමට කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. මධ්‍යම හා මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එක් එක් අදියරයන් හඳුනා ගැනීම, සැලසුම් සංශෝධනයන් ආදී කරුණු සම්බන්ධව නිශ්චිත පටිපාටීන් හඳුන්වා දිය යුතුය. |
| (v) | මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 375 ක් හෙවත් සියයට 75 ක් වැයකර තිබූ නමුත් හතරවන කිලෝමීටරය තුළ පවතින සිනුත් වැව දක්වා ජලය රැගෙන යා හැකි පරිදි නිමකර | මෙම ඉදිකිරීම විධිමත්ව සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කරමින් පවතී. විධිමත් අනුමැතියෙන් පසු ඉදිකිරීම් සිදු කිරීමට අපේක්ෂිතය. | ආර්ථික ප්‍රතිලාභ ලබාගත හැකි පරිදි ව්‍යාපෘතියේ කටයුතු සැලසුම් කිරීම හා කළමනාකරණය සම්බන්ධයෙන් නිශ්චිත |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | | පටිපාටීන් හඳුන්වා දිය යුතුය. |
| (vi) | දෙවන කිලෝමීටරය හා තුන්වන කිලෝමීටරය අතර ගල් ඉවත් කිරීම සඳහා රු. මිලියන 6.7 ක ඇස්තමේන්තුවක් 2020 දෙසැම්බර් මස අනුඥාත කර තිබූ අතර ඒ යටතේ සෘජු ශ්‍රම ක්‍රමය යටතේ ඇළමාර්ගයේ පිහිටි කළුගල් කියුබ් 3,276.25 ක් ඉවත් කළ බවට වැඩ සහතික කර තිබූ නමුත් ගල් ඉවත්කර නොමැති ස්ථානයන්හිද ගල් ඉවත්කළ බවට සාවද්‍ය ලෙස මිනුම් ඉදිරිපත් කර ශ්‍රමය, යන්ත්‍ර හා ද්‍රව්‍ය සඳහා ගෙවීම් කර තිබුණි. එසේ තිබියදී ඉටුකරන ලද වැඩ කොටස් පිළිබඳ නිශ්චිත සහතික කිරීමකින් තොරව 2+400 සිට 2+875 දක්වා වූ කොටසේ ගල් ඉවත් කිරීම සඳහා නැවත රු.20,236,000 ක ඇස්තමේන්තුවක් අනුඥාත කර තිබුණි. | මෙම කාර්යයද සෘජු ශ්‍රමය යටතේ සිදු කර ඇති අතර 2+875 න් ඔබ්බට ඒ ආසන්නම කොටස 2+000 - 2+875 අතර ගල් විදින අවස්ථාවේදීම විදීම සිදු කර ඇත. ඉදිරියේ දී ප්‍රතිපාදන ලැබීමත් සමඟ මුළු කොටසේම කළු ගල් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.<br>ඇළෙහි පස් පිරවීම, කළුගල් ඉවත් කිරීම, කැණීම් සිදු කිරීම හා අවශ්‍ය නිර්මිත ඉදිකිරීම සඳහා නව සංශෝධිත ඇස්තමේන්තුව සකස් කරමින් පවතී. එම ඇස්තමේන්තුව අනුමත වීමෙන් පසු ඉතිරි වැඩ කොටස් අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | දෙපාර්තමේන්තුව විසින් ස්වකීය සේවකයින් හා ද්‍රව්‍ය භාවිත කර ඉටු කරනු ලබන කොන්ත්‍රාත් (Force Account) සඳහා යන්ත්‍ර භාවිතය, ශ්‍රමය භාවිතය, අමු ද්‍රව්‍ය භාවිතය මිණුම් හා වැඩ අවසන් වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නව පටිපාටීන් හඳුන්වා දිය යුතුය.<br>ව්‍යාජ මැනුම් හා බිල්පත් ඉදිරිපත් කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (vii) | සියඹලන්ගමුව ඔයේ සිට මහගල්ගමුව වැව දක්වා ජලය ලබාගැනීමේ ව්‍යාපෘතියට අදාළව 2022 දෙසැම්බර් 31 වන විට ඉඩම් පවරා ගැනීම හා වන්දි ගෙවීමද ඇතුළුව තවදුරටත් නිම කළ යුතු කටයුතු 7 ක් පැවතියද සමාලෝචිත වර්ෂය තුළදී රු.8,000,000 ක් වූ ප්‍රතිපාදන පමණක් ඒ සඳහා වෙන් කර තිබුණි. | මෙම ඉදිකිරීම් විධිමත්ව සිදුකිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කරමින් පවතින බැවින් විධිමත් අනුමැතියකින් පසු ඉදිකිරීම් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. | එක් එක් අදියරය අවසානයේ දී ආර්ථික ප්‍රතිලාභ අත්වන පරිදි ක්‍රියාකාරී සැලසුම් සකස් කොට වාර්ෂික ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |
| (ආ) | මුතුකණ්ඩිය ජලාශයේ වැලි රොන්මඩ හා දියලු පස් ඉවත් කිරීමේ ව්‍යාපෘතිය.<br>මුතුකණ්ඩිය ජලාශයේ වැලි හා රොන්මඩ තැන්පත්ව ඇති බවත් එම වැලි හා රොන්මඩ ඉවත්කර වැවේ ජලධාරිතාවය ඉහළ නංවන ලෙස මුතුකණ්ඩිය ඒකාබද්ධ ගොවි සංවිධානය හා රණමයුර ගොවි සංවිධානය කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යවරයාගෙන් ඉල්ලීම් කර තිබුණි. අදාළ ඉල්ලීම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබූ අතර වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අමින් ආර ඔයෙහි වැලි හා රොන්මඩ ඉවත් කිරීමට රණමයුර ගොවි සංවිධානය වෙතත් මියෙල්ලා | | |

| | | | |
|---|---|---|---|
| | ඔයෙහි වැලි හා රොන්මඩ ඉවත් කිරීමට මුතුකණ්ඩිය ඒකාබද්ධ ගොවි සංවිධානය වෙතත් ලබා දීමට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව මියෙල්ලා ඔය හා කිවුල් ආර ප්‍රදේශයේ GPS ඛණ්ඩාංක 13 ක් යටතේ වැලි, රොන්මඩ හා දියලු පස් මීටර් කියුබ් 133,400 ක් ඉවත් කිරීම සඳහා කොන්දේසි 32 කින් යුතුව මුතුකණ්ඩිය ඒකාබද්ධ ගොවි සංවිධානය වෙත අංක ENV/575(Uva ii) දරන ලිපිය මඟින් 2019 පෙබරවාරි 21 දින පවරා තිබුණි. අමින් ආර ඔයෙහි GPS ඛණ්ඩාංක 4 ක් යටතේ වැලි රොන්මඩ හා දියලු පස් ඉවත් කිරීම සඳහා කොන්දේසි 40 කින් යුතුව රනමයුර ගොවි සංවිධානය වෙත අංක DI/MO/W03/05/01/2021 දරන 2021 ඔක්තෝබර් 12 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලබාදී තිබුණි. | | |
| (i) | මුතුකණ්ඩිය ඒකාබද්ධ ගොවි සංවිධානය කොන්ත්‍රාත් පිරිනැමීමේ ලිපියේ කොන්දේසි ප්‍රකාරව රු.1,000,000 ක නැවත ගෙවනු ලබන තැන්පතුවක් ලබාදී නොතිබු අතර උප කොන්ත්‍රාත්කරු වූ ස්වර්ණදේවි එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් 2021 මාර්තු 4 දින සිට වසරක කාලයක් වෙනුවෙන් උක්ත වටිනාකමට ඉදිරිපත් කර තිබුණු බැඳුම්කර ලිපිය දෙපාර්තමේන්තුව භාරගෙන තිබුණි. අදාළ ලිපියේ කොන්දේසි අනුව අධීක්ෂණ ගාස්තු ලෙස මාසිකව රු. 50,000 ක් බැගින් මාස 15 ක කාලය වෙනුවෙන් අයවිය යුතුව පැවති රු.750,000 ක් අය කරගෙන නොතිබුණි. | රුපියල් 1,000,000 ක් මුදලින් හෝ චෙක්පතකින් ලබාදෙන ලෙස දන්වා ඇත්තේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සම්පත් වලට හානියක් සිදු වුවහොත් එය නැවත පියවා ගැනීමේ අපේක්ෂාවෙන් වන අතර අදාළ බැංකු ඇපකරය මඟින් එලෙස කළහැකි බව තහවුරු කර ගෙන එය භාර ගෙන ඇත. මෙහිදී මෙම බැඳුම්කර ලිපිය භාර ගැනීම මඟින් ගොවි සංවිධානය වෙත ලබා දී තිබු අවසරය වෙනත් ආයතනයකට පැවරීමක් හෝ විකිණීමක් අපේක්ෂා නොකර ඇති අතර ජලාශයේ රොන්මඩ, වැලි හා දියළු පස් ඉවත්කර ධාරිතාව වැඩි කර ගැනීමේ කටයුත්ත පහසු කර ගැනීම පමණක් අපේක්ෂා කර ඇත. | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දුන් නියෝග වලට පටහැනිව වෙනත් පාර්ශවයන් වෙත ජලාශයේ වැලි කැණීම් සඳහා ඉඩ ප්‍රස්තා නිර්මාණය කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කිරීමට පත්වීම් බලධාරියා වෙත යොමු කළ යුතුය. |
| (ii) | රණමයුර ගොවි සංවිධානය වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ලිපිය අනුව අයවිය යුතු රු.1,000,000 ක නැවත ගෙවනු ලබන තැන්පතුව ලබාදී නොතිබුණද වැවේ රොන්මඩ ඉවත් කිරීමට අවසර ලබාදී තිබුණි. පැවරුම් ලිපිය අනුව භාරන ලද රොන්මඩ සහ | භූ විද්‍යා හා පතල් කාර්යාංශයෙන් නිකුත් කරනු ලබන ප්‍රවාහන බලපත්‍රයේ කොන්දේසි අනුව සහ මාර්ගය අබලන් වීම නිසා ප්‍රවාහන අපහසුකම් හේතුවෙන් කැණීම් කරන ලද දියළු පස් ජලය පිරෙන සීමාවට ඉහළින් ගොඩ ගසා ඇත. | අනුමත ලිපියේ සඳහන් කොන්දේසි වලට අනුකූලව කටයුතු කරන බවට, සෑම ක්ෂේත්‍ර පරීක්ෂණයක දීම තහවුරු කිරීම සඳහා පරීක්ෂණ ලැයිස්තු |

| | | | |
|---|---|---|---|
| | අපද්‍රව්‍ය සතියක කාලසීමාවක් තුළ වැවෙන් පිටතට ගෙනයා යුතු වුවද භාරන ලද දියලුපස් කියුබ් 1,500 ක් පමණ තවදුරටත් වැව තුළ ගොඩ ගසා තිබුණි. | | හඳුන්වා දිය යුතුය. කොන්දේසි කඩ කළ ගොවි සංවිධානය අසාදු ලේඛන ගත කළ යුතුය. |
| (iii) | අදාළ ගොවි සංවිධාන 2 විසින් ජලාශයේ රොන්මඩ ඉවත්කර ජලාශයේ ජල ධාරිතාවය ඉහළ නැංවීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබුණද වැලි හා රොන්මඩ ඉවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අවසර ලබාදුන් ස්ථානවල කැණීම් සිදුකර ජලාශයේ ජල ධාරිතාවය ඉහළ නැංවීමට කටයුතු කර නොතිබුණු අතර ජලාශයේ ආර කොටසේ වැලි හා පස් කැණීම් සිදු කර තිබුණි. | ලබා දෙන ලද GPS ඛණ්ඩාංක වැවේ පිරිසැපයුම් මට්ටම (FSL) තුළ පිහිටා ඇති අතර එම ප්‍රදේශයේ ඇති රොන්මඩ ඉවත්කිරීම වැවේ ධාරිතාවය වැඩි වීමට බලපාන ප්‍රධාන ප්‍රදේශය වේ. ඒ අනුව කැණීම් සිදු කරන ලද ස්ථාන පිරි සැපයුම් මට්ටම තුළ පිහිටා ඇති බැවින් එමගින් වැවේ ධාරිතාව වැඩි වෙන අතර විගණන පරීක්ෂණයෙන් නිරීක්ෂණය කර ඇත්තේ වැලි නිස්සාරණය කිරීම සඳහා යොදා ගත් වැව් බැම්මේ මුදුන් මට්ටම ඉහළින් පිහිටි ප්‍රදේශයක් වේ. | අනුමත ලිපියේ සඳහන් කොන්දේසි වලට අනුකූලව කටයුතු කරන බවට, සෑම ක්ෂේත්‍ර පරීක්ෂණයක දීම තහවුරු කිරීම සඳහා පරීක්ෂණ ලැයිස්තු හඳුන්වා දිය යුතුය. කොන්දෙසි කඩ කළ ගොවි සංවිධානය අසාදු ලේඛන ගත කළ යුතුය. |
| (iv) | අදාළ ගොවි සංවිධාන 2 සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබාදුන් එකඟතාවය ඇතුළත් ලිපිවල කොන්දේසි ප්‍රකාරව, අදාළ කාර්යය අධීක්ෂණයට වාරිමාර්ග දෙපාර්තමේන්තු නිලධාරියෙකු යෙදවීම වෙනුවෙන් අධීක්ෂණ හා පරිපාලන ගාස්තු ලෙස දිනකට රු. 2,000 ක මුදලක් ව්‍යාපෘති යෝජක විසින් ගෙවිය යුතු වේ. එසේ අයවිය යුතු අධීක්ෂණ හා පරිපාලන ගාස්තු රු.718,000 ක් දෙපාර්තමේන්තුවට අයකරගෙන නොතිබුණි. | 2000/= බැගින් ගෙවීමට ඉල්ලීම් කර ඇත්තේ අදාළ වැඩබිම් සඳහා අනියම් පදනම මත අධීක්ෂකවරයෙකු යෙදවීම සඳහා වන අතර, මෙම මුදල් නොලැබීම මත එලෙස අධීක්ෂකවරයෙකු යොදවා නොමැත. | අනුමත ලිපියේ සඳහන් කොන්දේසි වලට අනුකූලව කටයුතු කරන බවට, සෑම ක්ෂේත්‍ර පරීක්ෂණයක දීම තහවුරු කිරීම සඳහා පරීක්ෂණ ලැයිස්තු හඳුන්වා දිය යුතුය. කොන්දේසි කඩ කළ ගොවි සංවිධානය අසාදු ලේඛන ගත කළ යුතුය. දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | --------------------------------- | -------------- |
| (අ) | යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය<br>යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන වැව් බැම්ම ඉදිකිරීම, සැඳලි | යාන්ඔය ඉදිකිරීම් සඳහා ගිවිසුම් වලට එළඹීම අමාත්‍යාංශය විසින් | මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන්හි |

| | | | |
|---|---|---|---|
| | බැම් 04 ක් ඉදිකිරීම, වම් ඉවුරු ඇළ කි.මී. 18 ක් දිගින් යුතුව ඉදිකිරීම හා දකුණු ඉවුරු ඇළ කි.මී.12 ක් දිගින් යුතුව ඉදිකිරීමට යෝජිතව පැවතුණි. ඒ යටතේ වූ වම් ඉවුරු ඇළ හැර අනෙකුත් කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත, ඇ.ඩො. මිලියන 176 ක සෘජු කොන්ත්‍රාත්තුවක් ලෙස China CAMC Engineering Co. Ltd (CAMCE) සමාගම සමඟ 2011 නොවැම්බර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. එම කොන්ත්‍රාත් ගිවිසුමේ විෂය පථය ප්‍රධාන බැම්ම හා සැදලි බැම් 04 ඉදිකිරීමට පමණක් සීමා වන පරිදි හා කොන්ත්‍රාත් වටිනාකම ඇ.ඩො. මිලියන 150 ක් වන පරිදි 2013 අගෝස්තු 16 දින සංශෝධනය කර තිබුණි. වම් ඉවුර ඇළ ඉදිකිරීම සඳහා ඇ.ඩො.මිලියන 39.5 ක ගිවිසුමක් 2017 දෙසැම්බර් 12 දින අදාළ කොන්ත්‍රාත්කරු සමඟම අත්සන් කර තිබුණි. දකුණු ඉවුර ඇළ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ දේශීය කොන්ත්‍රාත්කරුවන් මඟින් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි.<br>මූලික ගිවිසුම අනුව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හරහා චීන ණය සපයන ආයතනයකින් කොන්ත්‍රාත් මුදලින් සියයට 85 ක ප්‍රමාණයක් ණය මුදල් වශයෙන් ද කොන්ත්‍රාත් මුදලින් සියයට 15 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය විසින් ද දැරීමට එකඟ වී තිබුණු අතර ණය මුදල ලබා ගැනීම සම්බන්ධව චීන බැංකුව සමඟ පැවැත්වූ සම්මුති සාකච්ඡා අසාර්ථක වීම හේතුවෙන් වසර 3 ක් තුළ මෙම ව්‍යාපෘතිය දේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක කර නිම කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත 2013 වර්ෂයේ දී මූලික ගිවිසුම සංශෝධනය කර තිබුණි. ඒ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | කැබිනට් නිර්දේශය අනුව සිදු කර ඇත. | කොන්ත්‍රාත් පරිපාලනයට සම්බන්ධ කරුණු, ප්‍රතිපත්තිමය කරුණු ලෙස අර්ථ දක්වා ක්‍රියා නොකළ යුතුය. අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේ දී නිරීක්ෂණයන්හි සඳහන් කරුණු ඇතුළුව සාර්ව ආර්ථික බලපෑම පිළිබඳ විස්තරාත්මක තොරතුරු වාර්තා කළ යුතුය. |
| (i) | චීන රජයෙන් ලබාදෙන ණය අපේක්ෂාවෙන් තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව සෘජු කොන්ත්‍රාත් | යාන්ඔය ඉදිකිරීම් සඳහා ගිවිසුම් වලට එළඹීම අමාත්‍යාංශය විසින් කැබිනට් නිර්දේශය අනුව සිදු කර | මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන්හි කොන්ත්‍රාත් |

| | | | |
|---|---|---|---|
| | ක්‍රමය යටතේ වීන කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම තුළ තරඟකාරී මිල කැඳවීම් තුළින් ලබා ගත හැකිව තිබූ වාසි ලැබී නොතිබුණි. | ඇත. | පරිපාලනයට සම්බන්ධ කරුණු, ප්‍රතිපත්තිමය කරුණු ලෙස අර්ථ දක්වා ක්‍රියා නොකළ යුතුය. අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේ දී නිරීක්ෂණයන්හි සඳහන් කරුණු ඇතුළුව සාර්ව ආර්ථික බලපෑම පිළිබඳ විස්තරාත්මක තොරතුරු වාර්තා කළ යුතුය.<br>සෑමවිටම ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගතව කටයුතු කළ යුතුය. |
| (ii) | විදේශ ණය අපේක්ෂාවෙන් EPC කොන්ත්‍රාත් ගිවිසුමක් ලෙස ඇමරිකානු ඩොලර් මඟින් ගෙවීම් කිරීමේ කොන්දේසි ඇතුළත් කර තිබූ අතර විදේශ අරමුදල් ලැබී නොතිබුණද ගිවිසුම් කොන්දේසි වෙනස් නොකිරීම හේතුවෙන් රටෙහි විදේශ සංචිතවලට අහිතකර ලෙස බලපා තිබුණි. | යාන්ඔය ඉදිකිරීම් සඳහා ගිවිසුම් වලට එළඹීම අමාත්‍යාංශය විසින් කැබිනට් නිර්දේශය අනුව සිදු කර ඇත. | ව්‍යාපෘති සම්බන්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමේ දී සාර්ව ආර්ථික බලපෑම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු වාර්තා කළ යුතුය. |
| (iii) | මූලික සැලසුම් අනුව ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී නිම කළ යුතුව පැවතිය ද අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් කාල සීමාව 2022 දෙසැම්බර් දක්වා දීර්ඝ කර තිබූ අතර පිරිවැය ඇස්තමේන්තුවද රු.මිලියන 36,855 සිට රු.මිලියන 48,553 දක්වා වැඩි කර තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලු හේතුවෙන් කාලය දීර්ඝ වී ඇත. | කාලය දීර්ඝ කිරීමෙන් අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ළඟා කර ගැනීමට සිදු වන අහිතකර බලපෑම සම්බන්ධව ප්‍රමාණවත් අවධානයකින් ක්‍රියාකළ යුතුය. අතිරේක පිරිවැය දැරීමට ප්‍රථම අදාළ ප්‍රමාදයන් කොන්ත්‍රාත්කරුගෙන් බැහැරව සිදු වී ඇති බව තහවුරු කර ගත යුතුය. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කළ යුතුය. |
| (iv) | 2021 ජූලි 5 දිනැති අංක අමප/21/1123/317/035 දරන අමාත්‍ය | මෙම ව්‍යාපෘතිය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර | මහා පරිමාණ ව්‍යාපෘති අවසන් කිරීමෙන් පසු |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩල තීරණය පරිදි ව්‍යාපෘතියේ කටයුතු 2022 දෙසැම්බර් 31 දිනට නිම කළ යුතුව පැවති නමුත් ව්‍යාපෘතිය නිම කිරීමට අදාළ තවදුරටත් ඉටු කළ යුතු කාර්යයන් පිළිබඳ වාර්තාව, ව්‍යාපෘතිය අවසන් කිරීමේ ගිණුම, ව්‍යාපෘතියේ වත්කම් පවරා දීම නිසි පරිදි සිදු වී ඇති බව තහවුරු කිරීමට අදාළ ලේඛන හා EPC කොන්ත්‍රාත් ගිවිසුම් 2 ට අදාළව අනාගතයේදී පැන නැඟිය හැකි ආරවුල් බේරුම්කරණය හා වෙනත් නෛතික කාර්යයකදී සේවායෝජක අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ලේඛන සකස් කර නොතිබියදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය භාරගෙන තිබුණි. | දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. | භාර ගැනීමේ දී අනුගමනය කළ යුතු නිශ්චිත පටිපාටීන් දක්වා උපදෙස් නිකුත් කළ යුතුය. |
| (v) | ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රදේශ සඳහා පානීය ජලය හා කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර් 2,287 ක් වගා කිරීමට අවශ්‍ය ජලය ලබාදීම, අනුරාධපුර දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රදේශ සඳහා පානීය ජලය හා කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 5,360 ක් සඳහා ජලය ලබාදීම, වාහල්කඩ, පදවිය, ගෝමරන්කඩවල යන කෘෂිකාර්මික ප්‍රදේශවල ඉතා ශීඝ්‍රයෙන් පැතිර යන වකුගඩු රෝගය පාලනය කිරීම සඳහා පිරිසිදු පානීය ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිලාභ ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවද ත්‍රිකුණාමලය හා අනුරාධපුර දිස්ත්‍රික්කයන් හි යෝජිත පානීය ජල ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණ අතර වම් ඉවුර හා දකුණු ඉවුර ඇළ මාර්ග යටතේ අලුතින් වගා කිරීමට යෝජිත ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් නිදහස් කිරීමේ කටයුතු ද අවසන් වී නොතිබුණි. කුඩා වැව් පද්ධතිහි බෙදුම් ඇළ ඉදි කිරීමද අවසන් කර නොතිබුණි. වකුගඩු රෝගය පාලනය සඳහා දායකත්වයක් ලැබී ඇත්ද යන්න තහවුරුකර නොතිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය යටතේ දැනට නිම කර ඇති කාර්යයන් උපරිම ආර්ථික ප්‍රතිලාභ ජනනය වන ආකාරයට | යාන්ඔය ජලාශය ඉදිකිරීම සඳහා චීන CAMCE සමාගම සමඟ 2011 නොවැම්බර් 03 මූලස්ථායී වැඩ සඳහා ගිවිසුම්ගත MIWRM/CONS/YANOYA/2011/01 දරන ඇමරිකානු ඩොලර් මිලියන 176 වන ගිවිසුමේ අයිතම අංක 4.10 යටතේ ගොඩනැඟිලි පහසුකම් සඳහා ඇමරිකානු ඩොලර් 2,913,420.00 වෙන් කර ඇත. එහෙත් මෙම ගිවිසුම 2013 අගෝස්තු 16 දින ඇමරිකානු ඩොලර් මිලියන 150 ලෙස සංශෝධනය කර ඇත. ප්‍රමාණවත් තරම් ප්‍රතිලාභ ලැබී ඇත. මේ වන විට මහ කන්නය සඳහා කුඹුරු අක්කර 11550 ක් වගා කරනු ලැබේ. | අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ළඟා කර ගැනීම සම්බන්ධව විශ්ලේෂණාත්මක වාර්තා සකස් කර පසුවිපරම් කළ යුතුය. අරමුණු ඉටුකර නොගැනීම සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට පරීක්ෂණ ආරම්භ කළ යුතුය. ඉටුකර නොගත් අරමුණු ඉටුකර ගැනීම සඳහා සැලසුම් සහගතව නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපයෝජනය කර ගැනීම සඳහා වූ සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් දරන ලද රු.මිලියන 38,349ක පිරිවැයට, ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට එක් වී නොතිබුණි. | | |
| (vi) | ජලාශය හා වම් ඉවුරු ඇළ ඉදිකිරීම සඳහා ගෝමරන්කඩවල, හොරොව්පතාන, කැබිතිගොල්ලෑව, පදවිය, පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි රජයට අයත් ඉඩම් කට්ටි 887 ක් හා පෞද්ගලික පාර්ශවයන් වෙත වන්දි ගෙවා අත්පත් කර යුතු ඉඩම් කට්ටි 3,919 ක් පැවතුණි. ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම හා වන්දි ගෙවීම යන කටයුතු සඳහා වැදගත් වන තොරතුරු ලේඛනයක් හෝ යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතියක් පවත්වා ගෙනගොස් නොතිබුණු අතර ලේඛන විධිමත් පරිදි පවත්වාගෙන ගොස්ද නොතිබුණි. ඒ හේතුවෙන් ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව හා වන්දි ගෙවීම් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමතකර ඇති නිර්ණායකයන්ට අනුකූලව නිසි පුද්ගලයින් වෙත නිවැරදි තක්සේරු මත සිදුකර ඇති බවට විගණනයේදි තහවුරු කරගත නොහැකි විය. තවද ව්‍යාපෘතිය යටතේ පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය හා එම පවරාගත් ඉඩම් භාවිතා කර ඇති ආකාරය පිළිබඳව ද විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. තක්සේරු වාර්තා ලැබීමේ ප්‍රමාදයන් හේතුවෙන් ගෙවීම් කටයුතු ප්‍රමාද වුව ද ලේඛන නඩත්තු කරමින් පවතී. | ඉඩම් අත්පත් කර ගැනීම, වන්දි ගෙවීම හා නැවත පදිංචි කිරීම් සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත්ව තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යායුතු අතර ලේඛන විධිමත්ව නඩත්තු කළ යුතුය. |
| (vii) | ව්‍යාපෘතියට අදාළව ඉඩම් කට්ටි 2,438 ක් සඳහා පමණක් වන්දි ගෙවීම් අවසන් කර තිබුණු අතර තවත් ඉඩම් කට්ටි 1,481 කට අදාළ වන්දි ගෙවීම් අවසන් කර නොතිබුණි. | තක්සේරු වාර්තා ලැබීමේ ප්‍රමාදයන් හේතුවෙන් ගෙවීම් කටයුතු ප්‍රමාද වුව ද ලේඛන නඩත්තු කරමින් පවතී. | ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම හා වන්දි ගෙවීම යන කටයුතු කඩිනමින් නිම කළ යුතුය. |
| (viii) | යාන්ඔය වම් ඉවුරු ඇළ ඉදිකිරීම සම්බන්ධව චීන කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබූ EPC කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ඉටු කළ යුතුව තිබූ ඇමරිකානු | සැලසුම් කටයුතු සිදු කිරීමද කොන්ත්‍රාත්කරු විසින් සිදුකර ඇති අතර ඉදිකිරීම් සිදුකරන අවස්ථාවේ ක්ෂේත්‍රයට ගැළපෙන ලෙස | EPC කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් නිම කළ යුතු සියලු |

| | | | |
|---|---|---|---|
| | ඩොලර් 3,478,910 ක් වූ කාර්යයන් ඉටු කර නොතිබුණු නමුත් ඒ සඳහා සම්පූර්ණයෙන්ම වැඩ සහතික කර ගෙවා තිබුණි. එහිදී,<br>1. ඇස්තමේන්තු අයිතම අංක 3.5.5 යටතේ ඇළ මාර්ගය හරහා අතුරු ඇළ මාර්ග හා ගොවීන්ට ගමන් කළ හැකි පරිදි පයිප්ප පාලම් (Pipe bridge across main canal) 13 ක් සකස් කළ යුතුව පැවති නමුත් 11 ක් පමණක් සකස් කර තිබූ අතර ඒවාද ගොවීන්ට ගමන් කළ හැකි පරිදි සකස් කර නොතිබුණි.<br><br>2. ඇස්තමේන්තු අයිතම අංක 4.2 යටතේ මිනිස් ශ්‍රමයෙන් හා විදුලියෙන් ක්‍රියාත්මක කළ හැකි ගේට්ටු 32 ක් නිර්මාණය කළ යුතුව පැවතියද ගේට්ටු 15 ක් පමණක් නිර්මාණය කර තිබූ අතර ඒවායේ විදුලි මෝටර් ක්‍රියාකරවීමට අවශ්‍ය විදුලි බලය සපයා නොතිබියදී සම්පූර්ණ මුදලම ගෙවා තිබුණි.<br><br>3. වම් ඉවුර ඇළ තත්පරයට ඝණ අඩි 300 ක ධාරිතාවයෙන් යුක්තව සකස් කිරීමට සැලසුම් කර තිබුණද එහි කිලෝමීටර් 7+720 දක්වා වූ කොටස පමණක් ඊට අනුරූපීව සකස් කර තිබූ අතර එතැන් සිට කිලෝමීටර් 18.21 දක්වා වූ කොටස තත්පරයට ඝණ අඩි 150 ක ධාරිතාවයෙන් යුක්තව ඉදිකර තිබීම හා කිලෝමීටර් 7+720 කොටසේ ඉදිකිරීමට යෝජිත ජලාශය ඉදිකර නොතිබීම හේතුවෙන් මුල් කොටසේද තත්පරයට ඝන අඩි 300 ක ධාරිතාවකින් ජලය නිකුත් කිරීමට නොහැකිව පැවතුණි. | සැලසුම් සංශෝධනය කර ඇත.<br>පයිප්ප දෙකක් යොදා ඉදි කරන ලද නිර්මිත හේතුවෙන් මුළු ගණන වෙනස් වී ඇත.<br>ඉදිකිරීම් කටයුතු සිදු කරන අවස්ථාවේ අවශ්‍යතාවය අනුව ගේට්ටු ස්ථාන ගත කර ඇත. විදුලි බල සම්බන්ධතාවය එම ප්‍රදේශයට නොමැති බැවින් විදුලි මොටර් සවි කර නොමැත.<br>ඇළේ ධාරිතාවය එකම ප්‍රමාණයට සැලසුම් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. විධිමත් පරිදි භාර ගෙන නොමැත. කාර්යසාධන වාර්තාව කොන්ත්‍රාත්කරු වෙත ලබා දී ඇත. | වැඩ නිම කර නොතිබිය දී, සියලු වැඩ අවසන් කර ඇති බවට සහ නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවන ඉදිකිරීම් සඳහා කාර්යසාධන සහතික නිකුත් කර ගෙවීම් සහතික කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (ix) | මූලික කොන්ත්‍රාත් ගිවිසුම අනුව ගොඩනැගිලි පහසුකම් සඳහා ඇ.ඩො 2,913,420 ක් ගෙවීම් කර තිබූ නමුත් | පසුව සංශෝධනය කර ඇත. | මූලික සැලසුම් අනුව ඉදිකිරීමට යෝජිත ගොඩනැගිලි පසුව |

| | | | |
|---|---|---|---|
| | ඒ යටතේ ඉදි කරන ලද ගොඩනැගිලි පිළිබඳ විස්තරයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | | සංශෝධනය සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන ඇති බවත්, දරන ලද පිරිවැයට අදාළ සියලු සහතික කිරීම් ඇතුළත් වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (x) | වැඩබිම සඳහා ප්‍රවේශ වීමේ හා ඉවත්වීමේ කටයුතු වෙනුවෙන් ජලාශය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව යටතේ ඇ.ඩො. 4,672,247 ක් හා වම් ඉවුරු ඇළ ඉදිකිරීම කොන්ත්‍රාත්තුව යටතේ ඇ.ඩො. 486,358 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත්කරු මේ දක්වා වැඩබිමෙන් ඉවත්වී නොමැති අතර එහි ඇති තාවකාලික කාර්යාල ගොඩනැගිලි, ගල් අඹරන යන්ත්‍ර සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ සඳහා කොන්ත්‍රාත්කරු විසින් ආරක්ෂක සේවා සපයා ගනිමින් භූමිය තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. | යන්ත්‍ර ඉවත් කිරිමට නීතිමය බාධා නිසා ඉවත් කර නොමැත. | කාර්යසාධන සහතිකය නිකුත් කළ දිනෙන් පසු වැඩ බිමෙන් විධිමත් පරිදි ඉවත් වීමකින් තොරව පරිහරණය කරනු ලැබූ රජයේ ඉඩම් හා දේපල වල වටිනාකම තක්සේරු කොට බදු කුලිය අය කර ගත යුතුය. |
| (xi) | මෙම ව්‍යාපෘතිය යටතේ ජලාශය ඉදිකිරීම හා වම් ඉවුරු ඇළ ඉදිකිරීම සඳහා චීන කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගත වීමේදී EPC කොන්ත්‍රාත් ලේඛන භාවිතා කර තිබුණද එහිදී ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා රාජ්‍යභාග ගෙවීම සම්බන්ධයෙන් වූ 7.8 විධිවිධාන, විශේෂ විධිවිධාන මඟින් සංශෝධනය කර තිබුණි. එහිදී පස් හා කළු ගල් කැණීම සඳහා අනුමැතිය හා රාජ්‍යභාග ගෙවීම සේවායෝජක (Employer) විසින් සපයා ගත යුතු බවත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාල සීමාව තුළ පස් හා කළු ගල් ගාස්තු ගෙවීමකින් තොරව කොන්ත්‍රාත්කරු හට ලබා ගත හැකි බවත් දක්වමින් සංශෝධනය කර තිබුණි. එහිදී උක්ත ව්‍යාපෘති 2 හි කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු විසින් භාවිතා කර තිබුණු වැලි කියුබ් 81,905 ක් කළු ගල් කියුබ් 201,784 ක් පස් කියුබ් 157,234 ක් වෙනුවෙන් කැළෑ ආඥා පනතේ 20 වන වගන්තිය යටතේ රජයට | මේ සම්බන්ධයෙන් දැනට ගත හැකි ක්‍රියාමාර්ගයන් නොමැත. | ගිවිසුම් කොන්දේසි හා වලංගු නීතිරීති පිළිබඳ දැඩි අවධානයෙන් කටයුතු කළ යුතු වුවද ඒ පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු නොකර ගිවිසුම් සංශෝධනය කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.<br>කොන්ත්‍රාත්කරු විසින් භාවිත කරන ලද වැලි කළුගල් හා පස් වෙනුවෙන් රජයට අයවිය යුතු ඉඩම් පරිහරණ ගාස්තු හා රාජ්‍යභාගය ගෙවීමට අවශ්‍ය පියවර ගත යුතුය. තවද මෙම කරුණු සම්බන්ධයෙන් 2018 අංක 19 දරන |

| | | |
|---|---|---|
| හිමිවිය යුතුව තිබූ ඉඩම් පරිහරණ ගාස්තුව රු.මිලියන 2,196 ක් හා 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත අනුව තවදුරටත් අයවිය යුතු වූ රු.මිලියන 27කට අධික රාජ්‍යභාගය මේ දක්වා අය වී නොතිබුණි. | | ජාතික විගණන පනතේ 38(1) වගන්තිය ප්‍රකාරව නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කළ යුතුය. |
| (xii) කොන්ත්‍රාත්කරු විසින් 2018 දෙසැම්බර් 21 දින ඉදිකිරීම් නිම කර තිබූ අතර වසර 5 ක් ගත වීමෙන් පසුව ද රාජ්‍යභාග හා ඉඩම් පරිහරණ ගාස්තු ගෙවීමකින් තොරව කැණීම් කරන ලද ගල් හා වැලි ඛනිජ ද්‍රව්‍ය තොග වැඩබිම් භූමියේ ගොඩ ගසා පැවතුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. | රාජ්‍යභාගය හා ඉඩම් පරිහරණ ගාස්තු ගෙවීමකින් තොරව කැණීම් කර වසර **5**කට වඩා වැඩි කාලයක් ගොඩගසා ඇති ගල් හා වැලි රජයට පවරා ගැනීමට හා නියමිත ගෙවීම් සිදු කර වෙනත් ව්‍යාපෘතියක් සඳහා විධිමත්ව භාරදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකාවේ මහා වාරිමාර්ග ව්‍යාපාරවල ගොවිපල ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරිම අධ්‍යයනය සඳහා වූ නියමු ව්‍යාපෘතිය.<br><br>වාරි කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාවය සහ සම්පත් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවිම**,** කෘෂිකාර්මික කටයුතු නවිකරණය හා යාන්ත්‍රීකරණය**,** වර්තමානයේ මුහුණදෙන දේශගුණික විපර්යාස ජය ගැනීම හා ජපානය සහ ශ්‍රී ලංකාව අතර තාක්ෂණය හුවමාරුකර ගැනීම සඳහා ඉඩම් ඒකාබද්ධ කිරීම පිළිබඳ අධ්‍යනය කිරිමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ජපන් වාරිමාර්ග හා ජල අපවහන ආයතනයේ (JIID) සභාපති සහ වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් 2021 මාර්තු 31 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රජය රු. 38,024,115 ක් ද, ජපන් වාරිමාර්ග හා ජල අපවහන ආයතනය ජපන් ආධාර රු. 8,766,667 ක් **(**USD 43,627) ද වශයෙන් එකතුව රු. 46,790,782 ක් | | |

වැයකර තිබුණි.

| | | | |
|---|---|---|---|
| (i) | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ගිවිසුම 2021 මාර්තු 31 දින අත්සන් කර තිබුණද ඊට පෙර 2018 වසරේ ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර තිබුණි. 2019-2021 කාලය තුළ දෙපාර්තමේන්තු  නිලධාරීන් 22 ක් විදෙස් පුහුණුවීම්වලට සහාභාගී කරවා තිබුණි. එහිදි නිලධාරීන් ව්‍යාපෘතියේ කටයුතුවලට දායකත්වය ලබාදිය යුතු බවට ගිවිසුම් මඟින් එකඟතාවයක් ලබාගෙන නොතිබූ අතර  පුහුණුව ලබාදුන් නිලධාරීන් 22 ක් අතරින් නිලධාරීන් 09 ක්, විශ්‍රාම යාම, වෙනත් ආයතන සඳහා ස්ථාන මාරුවීම සහ වෙනත් රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කර තිබීම හේතුවෙන් ඔවුන්ගෙන් නියමු ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොතිබුණි. ඒ අතුරින්  2019 වර්ෂයේ ජූලි මාසයේදී සහ අගෝස්තු මාසයේදී විශ්‍රාම යාමට නියමිතව තිබූ නිලධාරීන් දෙදෙනෙකු 2019 පෙබරවාරි මාසයේදී ජපානයේ පුහුණු පාඨමාලාව සඳහා සහභාගී කරවා තිබුණු අතර පුහුණුවෙන් මාස කිහිපයකට පසු උක්ත නිලධාරීන් විශ්‍රාම ගොස් තිබුණි. | ඉංජී එම්.ඩබ්.පී.ද සිල්වා මයා වාරිමාර්ග අධ්‍යක්ෂ අනුරාධපුර සිට උසස් වීමක් ලැබ ප්‍රධාන කාර්යාලයේ සේවය සඳහා වාර්තා කර ඇත.<br>මෙම ව්‍යාපෘතියේ කටයුතු භාරව වාරිමාර්ග කළමනාකරණ අංශයේ රාජකාරි කළ ආර්.පී.එම් දිසානායක මහතා මෙකී පුහුණුව සඳහා සහභාගී වී ඇති අතර, වාරිමාර්ග කළමනාකරණ අංශය තුළ මේ වනවිටත් උග්‍ර කාර්ය මණ්ඩල හිඟයක් පවතින බවත්, ඒ සඳහා ඊට සුදුසු වෙනත් නිලධාරීන් තවමත් නොමැති බවත් දන්වා ඇත.<br>එමෙන්ම එවකට ප්‍රාදේශිය ලේකම් ලෙස කටයුතු කළ විජේසිංහ මහතා ද පුහුණුවෙන් පසු මාස 07 කට ආසන්න කාලයක් ඉඩම් සම්බන්ධ කටයුතු ඉටුකර සේවය කර විශ්‍රාම ගොස් ඇත.<br>එම්.එම්.එස්.බී.හේරත් මයා විදේශ පුහුණුවෙන් පසුව වසර 03කට වැඩි කාලයක් මෙම ව්‍යාපෘති බල ප්‍රදේශයේ නේවාසික ව්‍යාපෘති කළමනාකරු වශයෙන් සේවය කර, සේවා අවශ්‍යතා සහ සෞඛ්‍යමය හේතූන් මත ස්ථාන මාරුවීම් ලබා ඇත.<br>ඉංජී.ආර්.ඒ.ආර්.විදුර ක්‍රිෂාන්ත මයා විදේශ පුහුණුවෙන් පසුව විවාහ වීමේ අවශ්‍යතාවය මත ඊට සමීප සේවා ස්ථානයකට ස්ථාන මාරුවීම් ලබා  ඇත. සන්ධ්‍යා අබේසේකර මිය සේවා උසස් වීමක් මත අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) ලෙසින් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ රාජකාරී කරන අතර එම නිලධාරීනිය  මෙම ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා ආරම්භයේ පටන් මේ දක්වා  අඛණ්ඩව දායකත්වය ලබා දෙයි. පී.කේ.ලලනි සකුන්තලා මිය සේවා උසස් වීමක් මත හා එවකට පුරප්පාඩුව ඇති සේවා ස්ථානයකට ගොස් ඇත. | විදේශ පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ දී, ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය නිර්ණායක තීරණය කර, ඒ අනුව නිලධාරීන් තෝරා ගත යුතුය.<br>ව්‍යාපෘතිය අවසන් වන තෙක් අදාළ නිලධාරීන් සාමාන්‍ය ස්ථානමාරු ක්‍රමයෙන් බැහැරව ව්‍යාපෘතියේ රාජකාරී කරන බවට කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹිය යුතුය.<br>විදේශ පුහුණු පාඨමාලා තුළින් ලබා ගන්නා දැනුම හා පුහුණුව අදාළ ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා යොදා ගත හැකි වන පරිදි හා සම්පූර්ණ ව්‍යාපෘති කාලය තුළම සේවය ලබා දිය හැකි පරිදි නිලධාරීන් වැඩි සංඛ්‍යාවකට පුහුණු අවස්ථා සැලසෙන පරිදි විදේශ පුහුණු පාඨමාලා සඳහා තෝරා ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | එම්.ඩබ්.ඉෂාරා ඔෂිනී මිය ප්‍රසූත නිවාඩු ලබා ඇත. | |
| (ii) | ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 60 කට වැඩි නොවන පිරිවැයක් දැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද බිම් සැකසීම හා ඇළ වේලිවලින් කොටසක් පමණක් සකස් කිරීමට රු.මිලියන 119.3 ක් ඇස්තමේන්තු අනුමත කර තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉක්මවා රු.මිලියන 59 ක පිරිවැයක් දැරීමට ඇස්තමේන්තු අනුඥාත කර තිබුණි. | මෙම පර්යේෂණ හා අධ්‍යයන ව්‍යාපෘතිය මුලින් සකස් කරන ලද්දේ 2019 වසරේ ක්‍රියාත්මක කිරීමට වුවද 2019 හා 2020 වර්ෂයේ දී ප්‍රතිපාදන ද ලබා දී නොමැත.<br>2021වර්ෂයේ දී ප්‍රතිපාදන ලෙස ලබා දී ඇත්තේ රු.මිලියන 20ක් පමණ වන අතර එය කුඹුරු ඉඩම් සකස්කිරීම සඳහා පමණි. නමුත් අපේක්ෂිත කාර්යයන් සියල්ල සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණි.<br>2022 වසර තුළ මෙහි ඉතිරි වැඩ සියල්ල අවසන් කිරීමට සැලසුම් කර තිබුණද රට තුළ උද්ගත වූ ආර්ථික අර්බුදය හේතු කොටගෙන භාණ්ඩ මිල ඉහළ යාම නිසා දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව විසින් ලබා ගත් තීරණ ද මත ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරන ලදී. | අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ව්‍යාපෘති වටිනාකම ඉක්මවා ඇස්තමේන්තු කිරීම අවශ්‍ය වන්නේ නම් නැවත අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත යුතුය. අනුමැතිය ඉක්මවා ඇස්තමේන්තු අනුඥාත කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම සඳහා පත්වීම් බලධාරියා වෙත යොමු කළ යුතුය. |
| (iii) | දෙපාර්තමේන්තුවේ නාච්චාදුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් මෙම නියමු ව්‍යාපෘතියේ බිම් සකස් කිරීම හා ඉදිකිරීම් කටයුතු භාරගෙන ක්‍රියාත්මක කර තිබුණි. 2018 වර්ෂයේ සිට අවස්ථා කිහිපයකදී ව්‍යාපෘතියේ කටයුතු සඳහා සකස්කළ ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණු අතර එහි පළමු ඇස්තමේන්තුව යටතේ රු.මිලියන 22 ක් වැය කර තිබියදී එකී කාර්යයන් සඳහා 2022 වර්ෂයේ තවත් රු.මිලියන 22.6 ක ඇස්තමේන්තු අනුඥාත කොට පළමු ඇස්තමේන්තුව යටතේ ඉටුකළ කාර්යයන් සඳහාම නැවත රු.මි.17.3 ක් ගෙවා තිබුණි. | 2021 සැප්තැම්බර් 30 වන දින දැනට සිදු කර ඇති මැනුම් සංශෝධනය කිරීම යන මැයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් නව මැනුම් නියෝගයක් නිකුත් කර ඇත.<br>නමුත් ඒ වනවිට 2021 යල කන්නය අවසන්ව තිබූ අතර, ගොවි මහත්වරුන් විසින් අතහැර දමන ලද කන්නය තුළ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් වැඩ අවසන් කළ යුතු නිසා කඩිනමින් වැඩ සිදු කර ඇත. එම නිසා සංශෝධිත මැණුමෙන් පසුව ද දෙවරක් කට්ටි සැලැස්ම වෙනස් වූ අතර, නැවත 2022 වැඩ ආරම්භ කරන අවස්ථාවේදී , ඒ වනවිට සිදු කර තිබූ මැනුමට අනුව ක්ෂේත්‍රයේ කටයුතු සිදු කර ඇත. 2022 වැඩ ආරම්භ කරන විට 2021 වර්ෂයේදී සිදු කළ ඇතැම් වැඩ නැවත වෙන වෙනම සිදු කිරීමට සිදුව තිබිණි . ඒ | ව්‍යාපෘති කාර්යයන් සඳහා නිශ්චිත කාල වකවානු දක්වමින් වගකීම් පැවරෙන ආකාරයට ක්‍රියාකාරී සැලසුම් සකස්කර ඒ අනුව කටයුතු කළ යුතුය.<br>මෙහිදී ප්‍රාදේශීය ලේකම් විසින් මායිම් පෙන්වා දීමට ප්‍රථම ඉඩම් කට්ටි කිරීම නියරවල් දැමීම හා ඇළ පද්ධතිය සකස් කිරීමට තීරණය කළ හා උපදෙස් ලබා දුන් නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට පත් වීම් බලධාරියා වෙත යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සඳහා නැවත වියදම් දැරීමට සිදු විය. | |
| (iv) | ව්‍යාපෘතිය යටතේ කුඹුරු සකස් කිරීමේ කටයුතු සියයට 85 ක් නිම කර ඇති බව ප්‍රගති වාර්තා ඉදිරිපත් කර තිබුණද 2022 /2023 මහ කන්නය වගා කළ හැකි මට්ටමට කුඹුරු සකස් කර නොතිබුණු අතර ඇළ මාර්ග කොන්ක්‍රීට් කර සකස් කිරීම, ට්‍රැක්ටර් පැන්නුම් සැකසීම, ජල කළමනාකරණ සඳහා ජල හැරවුම් සැකසීම ආදී කටයුතුවලින් සියයට 3 ක් පමණක් නිමකර තිබුණි. කුඹුරු සඳහා ජලය සපයන FC 8 හා FC 9 ඇළ මාර්ගය මීටර් 260 ක් පමණ කොන්ක්‍රීට් පැති බැම්මක් හා ජල හැරවුම් 37 ක් පමණ කඩා ඉවත් කිරීම හා සැලසුම් කළ පරිදි ඇළ මාර්ග සකස් නොකිරීම හේතුවෙන් එතෙක් පැවති ජල පාලන කටයුතුද ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. | පර්යේෂණ අධ්‍යයනය ආරම්භයේ දී ම සඳහන්ව ඇත්තේ දැනට තිබෙන fc 08, fc 09 ඇළ මාර්ග ඉවත් කර එක් පුද්ගලයෙක්ට තනි ලියද්දක් වන සේ ලියදි සකස් කිරීමයි. මෙහිදී ලියැදි සකස් කරන විට පැරණි fc 08, fc 09 ඇළ මාර්ගය ද ඉවත්වී එතෙක් අගාවතට ජලය ගෙන යාමට නොහැකි වූ ඇළ වෙනුවට නව ඇළ මාර්ගයක් සැලසුම් කර ඇත. | සැලසුම් කළ පරිදි නව ඇළ මාර්ග සකස් කර ජල පාලන කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාමටත්, ගොවීන්ගේ වගා කටයුතු විධිමත්ව කරගෙන යාමටත් පහසුකම් සැලසිය යුතුය. |
| (v) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව 2021 අගෝස්තු සිට 2021 දෙසැම්බර් වන විට ව්‍යාපෘතියේ සියලු කටයුතු නිම කළයුතු වුවත්, 2022 අගෝස්තු වන විටත් බිම් සැකසීම් ඉඩම් ඔප්පු බෙදාදීම් අවසන් කර නොතිබුණි.<br>ව්‍යාපෘතිය ආරම්භයේ ඇළ මාර්ග සම්පූර්ණයෙන් කොන්ක්‍රීට් කර සකස් කිරීම, අක්කර එකකට එක් ලියද්දක් බැගින් වන සේ සකස් කිරීම, මැද ඇළ හා දෙපස කුණු ඇළවල් කොන්ක්‍රීට් කර සකස් කිරීම, සෑම කුඹුරකටම ට්‍රැක්ටර් පැන්නුමක්, ජල හැරවුම් සොරොව්වක්, ජල මාපකයක් සකස් කිරීම, වී වේලීමට ස්ථානයක්, ගබඩා කාමරයක්, වී කෙටීමට මෝලක්, පැළසිටුවීම හා වල් නෙළීම සඳහා යන්ත්‍ර ලබාදීම, කන්න 3 කට පසු එළදාව අක්කරයකට වී බුසල් 20 ත් 30 අතර ප්‍රමාණයෙන් වැඩිකර දීම ව්‍යාපෘති අරමුණු ලෙස දක්වා තිබුණද එම කිසිදු කාර්යයක් ව්‍යාපෘතිය තුළින් ඉටු වී නොතිබුණි.<br>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී | 2021/22 මහ කන්නයේ දී රසායනික පොහොර නොමැතිකමින් රටේම වී වගාව අඩාල වූ අතර නාච්චාදූව ව්‍යාපාරයේ සියයට 95 පමණ ගොවීන් වගාව අත්හැර තිබුණි. 2022 යල කන්නයේ ද නාච්චාදූව මහා වාරි ව්‍යාපාරයේ ගොවීන් වගාවට යොමු කර ගැනීමට නිලධාරීන්ට විශාල මෙහෙයක් ගැනීමට සිදුවිය. | ව්‍යාපෘති කාර්යයන් සඳහා නිශ්චිත කාල වකවානු දක්වමින් වගකීම් පැවරෙන ආකාරයට ක්‍රියාකාරී සැලසුම් සකස්කර ඒ අනුව කටයුතු කළ යුතුය.<br>සැලසුම් කළ පරිදි ව්‍යාපෘතියේ වැඩ කටයුතු නිම නොකිරීම හේතුවෙන් කන්න 06ක වගා කටයුතු වල හා එම ගොවි පවුල් වලට සිදු වූ බලපෑම පිළිබඳ ආවස්ථික පිරිවැය ගණනය කර නියමු ව්‍යාපෘතිය අවසානයේ ඉදිරිපත් කරන ව්‍යාපෘති වාර්තාව තුළ ඇතුළත් කිරීම මඟින් අනාගතයේ මෙවැනි කටයුතු හා ප්‍රමාදයන් සිදු වීම |

| | | |
|---|---|---|
| නාච්චාදූව වගා කළ කුඹුරු අක්කර 65 (හෙක්ටයාර 26.3) ක 2020 යල හා 2020/ 2021 මහ කන්නයේ වගාව කැප කිරීමට ගොවීන්ගේ එකඟතාවය ලබා ගෙන 2021 යල කන්නයේ සිට ගොවීන්ට වගා කිරීමට හැකි වන පරිදි කුඹුරු සකස් කර දීමට එකඟවී තිබූ නමුත් විගණිත දින වූ 2022 අගෝස්තු මස දක්වා නියමු ව්‍යාපෘති අවසන් කර නොතිබීම හේතුවෙන් ගොවීන්හට 2020 සිට 2023 දක්වා කන්න 06 ක් වගා කටයුතු සිදුකිරීමට නොහැකි වී තිබුණි. එමගින්, එක් කන්නයකදී වී මෙට්‍රික් ටොන් 104 බැගින් කන්න 06 කදී මෙට්‍රික් ටොන් 624 ක පමණ වී අස්වැන්න ජාතික ආර්ථිකයට අහිමිවී තිබූ අතර එහි වටිනාකම දළ වශයෙන් රුපියල් මිලියන 62ක් පමණ විය. | | වැළැක්වීමට පෙළඹවීමක් ඇති කළ යුතුය. |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------- | -------------------------------- | -------------- |
| (අ) | මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ මත රු. මිලියන 6,000 ක ඇස්තමේන්තුව මත 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 159.4 ක් වැය කර තිබූ කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය හා රු. මිලියන 2,230 ක ඇස්තමේන්තුව මත 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 10 ක් වැයකර තිබූ දෙමටගල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබුණි. 2021 ආරම්භ කර තිබූ මෙම ව්‍යාපෘති නිම කිරීමේ ප්‍රතිශතය 2022 දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් සියයට 4.95 ක් හා සියයට 0.25 ක් විය. | උපදෙස් මත අවසන් කර ඇත. | දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක සියලු ව්‍යාපෘති පිළිබඳ සමාලෝචනයක් සිදු කර ප්‍රමුඛතා හඳුනා ගත යුතුය. එම තොරතුරු මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ මත පදනම්ව ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට වග බලා ගත යුතුය. |
| (ආ) | වඩමාරච්චි කලපුවෙහි ජල සම්පත් සංවර්ධනය කිරීම මගින් යාපනය අර්ධද්වීපයේ ජනතාවට පානීය ජලය | මෙය විශාල ප්‍රමාණයේ ව්‍යාපෘතියක් වන අතර පානීය ජලය ලබා ගැනීම සඳහා සැලසුම් | සංයුක්ත සැලැස්ම, ප්‍රමුඛතා ලේඛන හා කාර්යසාධන වාර්තා |

| | | | |
|---|---|---|---|
| | සැපයීම සඳහා 2019 වර්ෂයේදී රු.මිලියන 2,000 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණද එය ඉටුකර නොතිබූ අතර වසර 3 කට පසුව 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 28 ක් වැයකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | කරන ලදී. | තුළ මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කර දරන ලද පිරිවැයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කළ යුතුය. |
| (ඇ) | දලුග්ගල වැවේ භූ විද්‍යා පරීක්ෂණ සඳහා 2022 වර්ෂය තුළ රු.3,190,000 ක ඇස්තමේන්තුවක් අනුඥාත කොට වැයකර තිබුණද, එම වැව ඉදිකිරීමට අදාළ මූලික කටයුතු කිසිවක් ආරම්භ කිරීමකින් තොරව අතරමඟ නවතා තිබීම හේතුවෙන් දරා තිබූ වියදම අනාර්ථික වී තිබුණි. | දලුග්ගල වැවේ භූ විද්‍යාත්මක සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා රු.3,190,000ක ඇස්තමේන්තුවක් අනුඥාත කර වියදම් දරා ඇත. අලුතෙන් වැවක් ඉදිකිරීමේදී මැනුම් විමර්ශන කටයුතු, භූ විද්‍යාත්මක විමර්ශන කටයුතු සිදු කර, ඒ අනුව නිර්මාණ කටයුතු සිදු කොට ඇස්තමේන්තු සකස් කරනු ලැබේ. මේ වනවිට දලුග්ගල වැවේ නිර්මාණ කටයුතු සිදු කරමින් පවතී. | සංයුක්ත සැලැස්ම, ප්‍රමුඛතා ලේඛන හා කාර්යසාධන වාර්තා තුළ මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කර දරන ලද පිරිවැයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කළ යුතුය. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශය මඟින් ශක්‍යතා අධ්‍යන සිදුකර තිබූ පෙතියාගොඩ පිහිටි පොම්පාගාරය ඉදිකිරීම, කැකිරියෝබඩ අතිරේක පිටවාන ඉදිකිරීම, කැලණි ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රමයේ නිකවේලහි ගංවතුර පිටවීමේ ව්‍යුහය ඉදිකිරීම, මයියාව වැවේ පිටවාන වැඩිදියුණු කිරීම, මල්වතුඔය හරහා RCC පාලම ඉදිකිරීම, පෙරාරු අමුණ ඉදිකිරීම, කුඩාවිලච්චිය පිටවාන ඉදිකිරීම, ඇල්ල වැව පිටවාන ඉදිකිරීම, ඇල්ලේ වැවේ බැම්ම ඉදිකිරීම, එලවාන්කුලම අමුණ ඉදිකිරීම, විලලෝඩයි අමුණ ඉදිකිරීම, මල්වතු ඔය පිටවාන ඉදිකිරීම හා පාන්කුළම ජලාශයේ පිටවාන ඉදිකිරීම යන ව්‍යාපෘති 12 ක් 2023 මැයි 31 දක්වා ආරම්භ කර නොතිබුණ අතර එම ව්‍යාපෘති වෙනුවෙන් දරනු ලැබූ වියදම හඳුනාගත හැකිවන පරිදි ලිපිගොනු පවත්වාගෙන ගොස් නොතිබුණි. | එහි සඳහන් සමහර සැලසුම් එකම ව්‍යාපෘතියක කොටස් වන අතර ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අනෙකුත් ව්‍යාපෘති ආරම්භ කර නැත. | සංයුක්ත සැලැස්ම, ප්‍රමුඛතා ලේඛන හා කාර්ය සාධන වාර්තා තුළ මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතුය. දරන ලද පිරිවැයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.<br>දරන ලද පිරිවැය හා ඉටු කරනු ලැබූ කාර්යයන් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවන් සකස් කර වගකිවයුතු බලධාරීන් වෙත යොමු කළ යුතුය. |
| (ඉ) | ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය හා වාහල්කඩ | ඇළ පද්ධතියේ ඉදිකිරීම් කටයුතු සිදු කර ඇති අතර එය පද්ධතියේ දිගු කාලීන පැවැත්මට ඉවහල් වේ. ප්‍රතිපාදන නොලැබීම මත ඉදිකිරීම් | ව්‍යාපෘති ආරම්භ කිරීමේ දී ඒ සඳහා වියදමත් අනුමැතීන් ලබා ගැනීමට කටයුතු |

| | | |
|---|---|---|
| ගොවි ව්‍යාපාරවල ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 116 ක් ඇස්තමේන්තු කර ඉන් රු.මිලියන 31.2 ක් වැයකර තිබුණද ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ ප්‍රතිපාදන නොලැබීම මත අතරමඟ නවතා තිබීම හේතුවෙන් දරන ලද පිරිවැය නිෂ්කාර්ය වී තිබුණි. එහිදී වගාබිම් සඳහා ජල සැපයුම් ඉදිකිරීමට සැලසුම් කර ඒ සඳහා අවශ්‍ය හියුම් පයිප්ප 2,411 ක් මිලදී ගෙන ඉන් 1,017 ක් ගොවි සංවිධාන වෙත නිකුත් කර තිබුණද එමඟින් අපේක්ෂිත ජල සැපයුම් ඉදිකර නොතිබුණු අතර පයිප්ප 1,395 ක් පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ නිෂ්කාර්යව තබා තිබුණි. | සිදු කිරීමට නොහැකි වී ඇත. | කළ යුතු අතර, දරන ලද පිරිවැයට අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට අත්වන පරිදි ව්‍යාපෘතියේ වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. මිලදී ගත් හියුම් පයිප්ප සැලසුම් කළ පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක, 2012 වර්ෂයේ සිට ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 131,239 ක් වූ බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය, කුඹුක්කන්ඔය ජලාශ ව්‍යාපෘතිය, යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය, මොරාණ ජලාශය, රුගම - කිතුල්ගම ජලාශය (මුන්දෙණි ආරු ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය), වෙල්ලස්ස නවෝදය (මොණරාගල දිස්ත්‍රික්කයෙහි කඩිනම් වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය), උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය (අලිකොටආර ගබඩා ජලාශය සහ කුඩා ඔය ගබඩා ජලාශය), මහගල්ගමුව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම යන සංවර්ධන ව්‍යාපෘතීන් 9 හි සැලසුම් කළ කාලය වසර 2 සිට 8 දක්වා ප්‍රමාද වී තිබුණු අතර ව්‍යාපෘතීන්හි කාලය දීර්ඝ කිරීම සඳහා අවස්ථාවන් කිහිපයකදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. ප්‍රමාදයන් හේතුවෙන් මෙම | ප්‍රතිපාදන ලබා දීමේ ගැටලුව හා අනෙකුත් ප්‍රායෝගික හේතු නිසාවෙන් ව්‍යාපෘති අදාළ කාලය තුළ නිම කිරීමට නොහැක. | ව්‍යාපෘති මේ දක්වා නිම නොකිරීම පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදුකර අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘති තුළින් ලබාගැනීමට අපේක්ෂා කළ වාසි, සැලසුම්ගත පරිදි ලබාගැනීමට නොහැකි වී තිබුණු අතර මේ දක්වා නිමකර ද නොතිබුණි. | | |
| (ආ) | උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය (අලිකොටආර ගබඩා ජලාශය සහ කුඩා ඔය ගබඩා ජලාශය) | | |
| (i) | උමාඔය ද්‍රෝණියේ සිට දක්ෂිණ කලාපයේ කිරිදිඔය ද්‍රෝණියට ජලය ඝන මීටර් මිලියන 145 ක් වාර්ෂිකව හැරවීම ප්‍රධාන අරමුණ කොටගෙන වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය හා ඉරාන ෆරාබ් සමාගම, ඇමරිකානු ඩොලර් මිලියන 529.06 ක් හෙවත් රුපියල් මිලියන 74,325.75ක ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ගිවිසුමකට 2008 අප්‍රේල් 28 දින එළඹ තිබුණි. 2015 වසරේ නිම කළ යුතුව පැවති ව්‍යාපෘතියේ කාලය 2023 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට මූලස්ථායී වැඩ වලින් සියයට 97.39 ක් නිම කර තිබුණි. මේ යටතේ ජල විදුලි බලාගාරයේ නිම කිරීම් අවසන් අදියරේ පැවැති අතර 2023 වර්ෂය තුළ නිම කිරීමට යෝජිතව පැවතුණි. ජල විදුලි උත්පාදනයෙන් පසු නිකුත් කරන ජලය කිරිදි ඔය ද්‍රෝණියේ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබුණද ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිත කාලය මෙන් දෙගුණයක් එනම් වසර 14 ක් ගත වී තිබියදීත් යෝජිත ඉදි කිරීම් සියයට 50 ක් හෝ නිම කර නොතිබුණි. | අපේක්ෂිත පරිදි අවසන් කළ නොහැකි නමුත් සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇත. පසුගිය වසර දෙක තුළ රට තුළ පැවති වාතාවරණය හේතුවෙන් ප්‍රගතිය අඩාල වී ඇත. | එක් එක් අදියර අවසානයේ අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ළඟා කර ගත හැකි වන පරිදි සැලසුම් සකස් කර ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. දීර්ඝ කාලීන ප්‍රමාදයන් මඟින් අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ අහිමි වීමේ ආවස්ථික පිරිවැය ගණනය කොට වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ හෙළිදරව් කළ යුතුය. |
| (ii) | උමා ඔය පහළ නිම්න සංවර්ධන කටයුතු රුපියල් මිලියන 9,352.5ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් අදාළ ඇස්තමේන්තුව රුපියල් මිලියන 17,914ක් ලෙස සංශෝධනය කිරීමට 2021 අගෝස්තු 30 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. එම අනුමැතිය ලබා දීමේ දී මුදල් ඇමතිතුමා | වාරිමාර්ග ඇස්තමේන්තු බොහෝ විට විශාල ප්‍රදේශ පුරා විසිරී ඇති, විවිධ භූ විද්‍යාත්මක වෙනස්කම් සහිත ප්‍රදේශයන්හි සිදුකරනු ලබන ඉදිකිරීම් වේ. ඒ අනුව ගොඩනැගිල්ලක් හෝ මහාමාර්ගයක් ඉදිකිරීම් ආදී ඉදිකිරීම් මෙන් වඩාත් නිවැරදි ඇස්තමේන්තුවක් මුල් අවස්ථාවේ දී සකස් කිරීම අපහසු | මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු අතර ඒ සඳහා, ව්‍යාපෘතිය කෙරෙහි බලපාන සියලු බාහිර සාධක කෙරෙහි ප්‍රමාණවත් |

| | | | |
|---|---|---|---|
| | විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ කෙරෙහි නිසි අවධානය යොමු කර ඒ අනුව කඩිනම් පියවර ගන්නා ලෙස ද නියම කර තිබුණි. එනම් "වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බොහෝ මහා පරිමාණ ව්‍යාපෘතීන් ආරම්භ කර කෙටි කාලයක් තුළ ඒවායේ විෂය පථයේ කිසිම වෙනස් කමකින් තොරව ව්‍යාපෘති පිරිවැය සිය ගුණයකින් වැඩිවීමේ ප්‍රවණතාවය දැකිය හැක. තව ද මෙම ව්‍යාපෘතිවල බාහිර සාධක විශේෂයෙන්ම උද්ධමනය හා විදේශ විනිමය අනුපාතයෙන් ඇති වන වැඩි වීමට වඩා ඇස්තමේන්තු අනුපාත වැඩිවීම ඉතා ඉහළ මට්ටමක පැවතීම මෙම වාරිමාර්ග ක්ෂේත්‍රයේ ව්‍යාපෘතිවල දැකිය හැකි පූර්වාදර්ශයකි. එම නිසා ඇස්තමේන්තු අනුපාත නැවත සමාලෝචනය සුදුසුය" යන නිර්දේශය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | වේ. | අවධානයක් යොමු කර දැනට ක්‍රියාත්මක කරන ව්‍යාපෘති ඇස්තමේන්තු නැවත සමාලෝචනය කළ යුතුය. |
| (iii) | ව්‍යාපෘතිය මඟින් දැනට වගා කරනු ලබන ඉඩම් අක්කර 3500 ක් ඇතුළත්ව ඉඩම් අක්කර 15,000 ක් දෙකන්නය වගා කිරීමට ජලය සැපයීම සැලසුම් කර වසර 14 ක් ගත වී ඇතත් ජලය සැපයීමට යෝජිත නව ඉඩම් මේ දක්වා හඳුනාගෙන හෝ ලේඛනයක් සකස් කර නොතිබුණි. | මූලික සැලසුම් වලට අදාළව ජලය සැපයිය හැකි හා වගා කළ හැකි ඉඩම් සවිස්තරව හඳුනා ගැනීම මේ වන විට නිමකර ජල කළමනාකරණ වැඩ සටහන්ද සැලසුම් කරමින් පවතී. | ජලය සැපයීමට යෝජිත නව ඉඩම් හඳුනාගෙන ව්‍යාපෘතිය යටතේ දෙකන්නය වගා කිරීමට නියමිත ඉඩම් පිළිබඳ ලේඛනයක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | උමා ඔය ද්‍රෝණියේ ජලය වාර්ෂිකව ඝන මීටර් මිලියන 145ක් කිරිඳිඔය ද්‍රෝණිය වෙත හැරවීමෙන් පසු දකුණු පළාතේ කෘෂිකාර්මික කටයුතු සඳහා නිදහස් කිරීමට, තැන්පත් කර ගැනීම අරමුණු කොට ගෙන ඝන මීටර් මිලියන 22.5 කින් යුත් නව කුඩා ඔය ජලාශය ඉදි කිරීමට සැලසුම් කර තිබු නමුත්, උමා ඔය සිට කුඩා ඔය වෙත ජලය රැගෙන එන කිලෝමීටර 30ක් දිගින් යුත් සැලසුම්ගත ඇළ මාර්ගයට ඉහළින් සිටින සේ ජලාශයේ සැලැස්ම, නිසි අනුමැතියකින් තොරව සංශෝධනය කර තිබුණි. | ජලාශය සකස් කිරීමේ දී පැවති තාක්ෂණික ගැටලු හේතුවෙන් සිදු වී ඇත. | උමා ඔය සිට නිකුත් කරනු ලබන ජලය රඳවාගැනීමට නොහැකි වන පරිදි කුඩා ඔය ජලාශයේ සැලැසුම් නිසි අනුමැතියකින් තොරව සංශෝධනය කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන |

| | | | |
|---|---|---|---|
| | | | පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (v) | මෙම ජලාශයේ ඉදි කිරීමට අවශ්‍ය වැලි මීටර් කියුබ් 109,524 ජලාශයට යටවන ප්‍රදේශයෙන් සපයා ගැනීම අරමුණු කොට ගෙන මූලික ඇස්තමේන්තු සකස් කර තිබූ නමුත් ඉහත සඳහන් පරිදි ජලාශයේ සැලැස්ම වෙනස් කිරීමෙන් පසු හඳුනාගෙන තිබූ වැලි නිධිය ජලාශයෙන් පිටත සීමාව බවට පත්ව තිබිණි. එහිදී කුඩා ඔය ජලාශය ඉදි කිරීමට අවශ්‍ය වැලි කියුබ් 1ක් සඳහා රුපියල් 6,452ක් ඇස්තමේන්තු කර තිබුණ ද රුපියල් 10,100 වැනි මුදලකට බාහිර සැපයුම්කරුවෙකු මඟින් වැලි මිල දී ගැනීමට කටයුතු කර තිබූ අතර අදාළ සැපයුම්කරු විසින් ජලාශ බැම්මට මීටර් 200 ක් පමණ පහළින් පිහිටි ගාස්තු ගෙවීමකින් තොරව වැලි සපයා ගැනීමට සැලසුම්කර තිබූ ස්ථානයෙන් වැලි කියුබ් 21,286 ක් සපයා තිබූ අතර ඒ සඳහා රුපියල් මිලියන 190 ක් ගෙවා තිබුණි. | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී ක්ෂේත්‍රයේ තත්ත්වයට අනුව තීන්දු ගැනීමට සිදු වේ. වැලි සපයා ගැනීම සඳහා මුදලක් වැය වන අතර එය දුර ප්‍රමාණයට අනුව වෙනස් විය යුතුය. | ව්‍යාපෘති සැලසුම වෙනස් කිරීමේ දී ඒ තුළින් වන බලපෑම ඇගයීමට ලක් නොකිරීම නිසා ඛනිජ සම්පත් අවභාවිතයට ඉඩ සැලසූ නිලධාරීන් හා වැඩිමිලට වැලි මිලදී ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (vi) | ව්‍යාපෘතියේ එක් එක් කාර්ය සඳහා දරන ලද වියදම් පිළිබඳව වෙන් වෙන්ව ගිණුම් තබාගෙන නොතිබූ අතර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ද පිළියෙල කර නොතිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2023 ජනවාරි මස ප්‍රගති වාර්තාවට අනුව 2021 වර්ෂය දක්වා වාරිමාර්ග අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 9,870.92 ක් හා 2022 වර්ෂයේ වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 2,006.67ක් වශයෙන් රුපියල් මිලියන 11,878 ක් වැය කර තිබූ නමුත් එක් එක් කාර්ය යටතේ එක් එක් කාර්ය සඳහා දරන ලද පිරිවැයෙහි එකතුව රුපියල් මිලියන 6,567.22 ක් විය. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද පිරිවැයෙන් රුපියල් මිලියන 5,310 ක් වැය කළ කාර්යය නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි විය. | වෙන් වෙන්ව ගිණුම් තබන ලෙස උපදෙස් ලබා දී ඇත. | ව්‍යාපෘති කටයුතු සඳහා වාර්ෂික අයවැය ලේඛනයක්, ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. ඒ මත පදනම්ව ප්‍රතිපාදන වෙන් කොට ගිණුම් සංකේත හඳුන්වා දී ගිණුම් තබා ගත යුතුය. ඊට අමතරව වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vii) | ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර අනුඥාත කරනු ලැබූ එක් එක් ඇස්තමේන්තු යටතේ නිමකරන ලද වැඩකොටස් පිළිබඳ සහතික කිරීම් හා වැඩ අවසන් වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. ඉංජිනේරු සහකාරවරුන්ගේ දෛනික මිනුම් පොත් පදනම් කොට ගෙන ද්‍රව්‍ය, ශ්‍රමය හා යන්ත්‍ර සඳහා ගෙවීම් කර තිබුණි. | ඇස්තමේන්තු ලේඛනයක පවත්වාගෙන යන ලෙස උපදෙස් ලබා දී ඇත. | අනුඥාත කරනු ලැබූ එක් එක් ඇස්තමේන්තුව යටතේ නිමකරන ලද වැඩ කොටස් පිළිබඳ මිනුම් වාර්තා හා බිල්පත් සකස් කොට නිශ්චිත සහතික කිරීමක් සහිතව වැඩ අවසන් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (viii) | මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11,877 ක් හෙවත් සියයට 120 ක් වැයකර තිබූ නමුත් දකුණු ඉවුරු ඇළ යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන්ගෙන් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් නිම කර නොතිබුණි. | වැව හා අදාළ කටයුතු සඳහා වැඩි මුදලක් වැයවන අතර එක් එක් වැඩ විෂය සම්බන්ධයෙන් වෙන් වෙන්ව නොව සමස්තය සැලකිය යුතුය. | ව්‍යාපෘති ආරම්භයේදී හඳුනාගත් ප්‍රධාන අරමුණු ඉටුවන පරිදි ප්‍රමුඛතා හඳුනා ගෙන, අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ළඟාකර ගත හැකි වන පරිදි අදියර වශයෙන් සැලසුම් සකස් කර ඒ අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------- | --------------- |
| (අ) | මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත-ක්‍රමෝපායකරණය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය) යටතේ වූ දෙටගමුව, මොරගොල්ල, ඌරාඋල හා පයිලේගම යන වැව් 4 හි මේ වන විට පවතින ක්‍රියාකාරකම් ප්‍රයෝජනයට ගත හැකි පරිදි තිරසාර ලෙස නිම කර ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළ අවසන් කිරීමට තීරණය කර තිබුණි. | | |
| **(i)** | එහිදී මොරගොල්ල, ඌරාඋල හා පයිලේගම වැව් ප්‍රතිසංස්කරණය කළයුතු ආකාරය පිළිබඳ ප්‍රමුඛතාවයන් තීරණය | ප්‍රතිපාදන සීමා සහිත වීම, ඉන්ධන හිඟය හා ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිලගණන් ඉහළ යාම මීට හේතු වී | මෙම වැව් ප්‍රතිසංස්කරණය වෙනුවෙන් මේ දක්වා |

| | | | |
|---|---|---|---|
| | කිරීමෙන් තොරව ද්‍රව්‍ය මිල දී ගෙන තිබීම හා ඉදිකිරීම් සිදුකිරීම නිසා එම වැව් මගින් වගා කටයුතු සඳහා ජලය සැපයීමට විගණිත දින වූ 2023 මැයි 31 දක්වා නොහැකිවී තිබුණි. තවද 2023 අයවැය තුළින් මුදල් වෙන්කිරීම සීමා වීම නිසා මෙම වැව් ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් මේ දක්වා දරන ලද රු.140,963,871 ක වියදමද නිෂ්කාර්ය වී තිබුණි. | ඇත. | දරන ලද රු. මිලියන 141 ක් පමණ වූ පිරිවැයෙහි ආර්ථික ප්‍රතිලාභ ළඟා කරගත හැකි වන පරිදි මිල දී ගත් ද්‍රව්‍ය ප්‍රමුඛතා දී ගත් ද්‍රව්‍ය ප්‍රමුඛතා පදනමක් මත ඉදිකිරීම් සඳහා යොදා ගෙන ප්‍රමුඛතා හඳුනාගෙන වැව් ප්‍රතිසංස්කරණය කිරීමටත් වැව් ප්‍රතිසංස්කරණ කටයුතු නිම කර ජනතාව වෙත ප්‍රතිලාභ ළඟාකරගත හැකි තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | උක්ත ව්‍යාපෘතිවල ඇතුළත් රු. මිලියන 28.64 ක (ලාභාන්තිකය රහිත) ඇස්තමේන්තු වටිනාකම හා සැසඳීමේදි මොරගොල්ල වැව හා පයිලේගම වැවෙහි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 90 සහ සියයට 96 ක් වූ අතර වැව් ඉදිකිරීමේ භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 23 හා සියයට 81 ක් විය. | ඉදිකිරීම් ද්‍රව්‍ය හා ශ්‍රමයේ මිල වැඩි වීම නොසලකා ඉදිකිරීම් සිදු කිරීමෙන් මෙය ඇති වී ඇත. ඇස්තමේන්තු සංශෝධනයට පියවර ගෙන ඇත. | ඇස්තමේන්තු අනුමත කිරීමේදී එක් එක් වැඩ අයිතමයන් සඳහා අනුමත සීමාවන් ඉක්මවා වියදම් දැරීමට ප්‍රථම අනුමැතිය ලබාගත යුතුය. |
| (iii) | මොරගොල්ල වැව ප්‍රතිසංස්කරණය සඳහා අනුමත කර තිබූ රු.මිලියන 49.9 ක ඇස්තමේන්තුව තුළ ඇතුළත් රු.මිලියන 37.9 ක් වූ සිවිල් වැඩ පිරිවැයෙන් රු.මිලියන 30.3 ක් හෙවත් සියයට 80 ක් වැය කර තිබුණු නමුත් ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 37 ක් විය. එසේ ප්‍රමාණවත් භෞතික ප්‍රගතියක් වාර්තා වී නොතිබියදීත් 2019, 2020, 2021 හා 2022 වර්ෂ අවසානයේ ඉතිරි ප්‍රතිපාදන වැයකිරීමේ අරමුණින් පෙර වර්ෂවල මිලදී ගත් අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් තොරව තොග වශයෙන් නැවතත් ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. වැව ප්‍රතිසංස්කරණයට අදාළව අනුමත කළ ඇස්තමේන්තුව තුළ වැවේ පිටවාන ඉදිකිරීමට රු.මිලියන 28.6 හෙවත් මුළු ඇස්තමේන්තුවෙන් සියයට 75 වෙන්කර | ඉදිකිරීම් අඛණ්ඩව සිදු කිරීමේ අරමුණින් ද්‍රව්‍ය මිල දී ගෙන ඇත. | වර්ෂ අවසානයේ ඉතිරි ප්‍රතිපාදන වැයකිරීමේ අරමුණින් අමුද්‍රව්‍ය මිලදී නොගත යුතුය. ඍජුශ්‍රම පදනම මත කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී සිදු වන මෙවැනි අවිධිමත්භාවයන් වැළකෙන පරිදි ඒ හා සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය. නිවැරදි තාක්ෂණික පිරිවිතරයන්ට අනුව |

| | | | |
|---|---|---|---|
| | තිබූ අතර ඒ සඳහා 2022 වර්ෂය තුළ රු. 9,872,170 ක් වැය කර වානේ කම්බි 5,150 Kgක් මිලදීගෙන ඉන් 1,884 Kgක් පමණක් භාවිතා කර තිබුණි. මේ අනුව මිලදී ගත් කම්බි ප්‍රමාණයෙන් සියයට 63ක් ඉතිරි වී තිබුණි. | | සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කර අඛණ්ඩව පසු විපරම් කළ යුතුය. |
| (iv) | මොරගොල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු වගාකරන භූමි ප්‍රමාණය අක්කර 50 සිට අක්කර 200 දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබුණු නමුත් ඒ සඳහා අවශ්‍ය කුඹුරු හඳුනාගෙන නොතිබුණු අතර වගාවට ජලය ගෙනයාමට අවශ්‍ය ඇළ මාර්ග සකස්කිරීම අනුමත ඇස්තමේන්තුවට ඇතුළත්කර නොතිබුණි. | මුල් අදියර යටතේ වැව සඳහා ප්‍රමුඛතාවය ලබා දී ඇත. | අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමේදී ඉටු නොකළ කාර්යයන් ක්‍රියාකාරී සැලසුම් හා ප්‍රමුඛතා ලේඛන තුළ ඇතුළත් කර අඛණ්ඩ පදනමින් පසු විපරම් කළ යුතුය. |
| (v) | ඌරාඋල වැවේ බැම්ම ඉදිකිරීමෙන් පසු වැව් බැම්මේ ආරක්ෂාවට රළපනාවක් දැමීමට අවශ්‍ය 6X9 කළුගල් කියුබ් 240.26 ක් රු. 3,499,500 මුදලක් වැය කර 2021 වසරේ මිලදී ගෙන වැව ඉදිකිරීම් භූමියේ ගොඩගසා තිබුණු අතර එම වර්ෂයේම මිලදී ගෙන තිබූ රු.2,324,850 ක් වටිනා 12 mm කම්බි 1761 ක් වසරකට වැඩි කාලයක් ඉදිකිරීම් භූමියේ ගොඩ ගසා තිබුණද වැව් බැම්ම 2023 ජනවාරි වනතෙක් ඉදිකර නොතිබුණි. | ප්‍රතිපාදන ලබා දීමේ ගැටලු හේතුවෙන් ඉදිකිරීම් ඇන හිට ඇත. | ඍජුශ්‍රම පදනම මත කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී සිදු වන මෙවැනි අවිධිමත්භාවයන් වැළකෙන පරිදි, අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා එක් එක් ව්‍යාපෘතිය සඳහා ද්‍රව්‍ය මිල දී ගැනීම හා උපයෝජනය පිළිබඳ නිර්ණායකයන් ඇතුළත් කර, චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය. දරන ලද පිරිවැයට උපරිම ආර්ථිකමය ප්‍රතිලාභ එක් වන පරිදි ඉදිකිරීම් කටයුතු කඩිනමින් ඉටු කළ යුතුය. |

## 3.6 වෙනත් නිරීක්ෂණ

බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------- | ----------------------------- | ------------- |
| (i) | ගම්පහ, අත්තනගල්ල හා | මෙම කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු | දෙපාර්තමේන්තුවට |

| | | | |
|---|---|---|---|
| | මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩයේ සභාපතිවරයා සහ China Machinery Engineering Corporation සමාගමේ සභාපතිවරයා අතර 2013 මැයි 15 වන දින එළඹ තිබූ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඇ.ඩො. මිලියන 229.5 ක වටිනාකමකින් යුත් උක්ත ව්‍යාපෘතිය 2014 – 2017 කාලපරිච්ඡේදයේ ක්‍රියාත්මක කර අවසන් කිරීමට නියමිතව තිබුණි. එම ව්‍යාපෘතියේ මූලික ජල මූලාශ්‍රය වූ බස්නාගොඩ ජලාශය ඉදිකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, 2016 මාර්තු 22 හා 2019 ජූනි 12 යන දිනයන් හිදී අවබෝධතා ගිවිසුම් දෙකකට එළඹ තිබුණි. එසේ වුවද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව දක්වා ඇත. කොන්ත්‍රාත් ගිවිසුම මඟින් කොන්ත්‍රාත් ක්‍රියාත්මක එජන්සිය ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව නම් කර ඇත. අවශ්‍ය ප්‍රතිපාදන ජල සම්පාදන මණ්ඩලය මගින් ලබා ගැනීම සඳහා පමණක් අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත. මෙම සියලු කටයුතු අමාත්‍ය මණ්ඩල අනුමැතීන්ට යටත්ව අමාත්‍යාංශය මගින් සිදු කර ඇත. | ලබා දෙන ඉදිකිරීම් සඳහා අවබෝධතා ගිවිසුම් වලට එළඹීමට පෙර ව්‍යාපෘති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් බස්නාගොඩ ජලාශය ඉදිකිරීමේ කාර්යය සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීම මඟින් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටු (CAPC) නිර්දේශ ප්‍රකාරව හා ඒ සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රු.2,347,406,831 ක මිලකට චීනයේ සිනෝහයිඩ්‍රෝ සමාගම (Sinohydro Corporation Limited) තෝරාගෙන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.<br>ජලාශය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් උක්ත සමාගම සමඟ 2019 ජූනි 13 වන දින රු.2,394,354,968 ක (රු.46,948,137ක ජාතිය ගොඩනැගීමේ බදු ඇතුළත්ව) වටිනාකමකින් යුත් ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි.<br>අමාත්‍යාංශ ලේකම් විසින් මෙම ප්‍රසම්පාදන කාර්ය සඳහා පත්කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රු.මිලියන 2,093 ක ලංසුව රු. මිලියන | ජලාශ ඉදිකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු විශේෂඥ දැනුම සලකා බලා මෙහි ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය පවරා ඇත. ප්‍රසම්පාදන තීරණ අනුව කොන්ත්‍රාත්කරු තෝරාගෙන ඇති අතර අධීක්ෂණ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලැබේ.<br>ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය වගන්ති 7.9.2 අනුව ගණිතමය වශයෙන් නිවැරදිබාවය පරීක්ෂා කළ යුතු අතර එහිදී සිදු වී ඇති ප්‍රමාද දෝෂය නිවරැදි කර ඇත. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සංශෝධිත කොන්ත්‍රාත් වටිනාකම නිර්දේශ කිරිමට පෙර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ වගන්ති 2.6.1(v) ප්‍රකාරව ලංසුකරුගේ පැහැදිලි කිරීම් ලබා ගන්නා ලෙස ප්‍රසම්පාදන අස්ථිත්වයට දැන්වීම අතපසු වී ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලින් අතිරේක පිරිවැයක් හා අතිරේක කාලයක් වැයනොවන ආකාරයට සිදුකිරීමට වගබලා ගත යුතුය.<br>වගකීම් විරහිතව ක්‍රියා කර ඇති තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට අදාළ පත්වීම් බලධාරියා වෙත යොමු කළ යුතුය. තාක්ෂණික ඇගයීම් කමිටුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන නොසලකා කටයුතු කිරීම හා නොසැලකිලිමත්භාවය තුළ රජයට සිදු කර ඇති පාඩුව සම්බන්ධයෙන් 2018 අංක 18 දරන ජාතික |

| | | | |
|---|---|---|---|
| | 2,347ක් ලෙස නිවැරදි විය යුතු බවට ගණනය කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.6.1(v)ට පටහැනිව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ මිලට වඩා රු. 254,062,080 ක් වැඩි වටිනාකමකට කොන්ත්‍රාත්තුව පැවරීමට නිර්දේශ කර තිබුණි. එහිදි කොන්ත්‍රාත්කරු විසින් මූලික වැඩ (Preliminarien) සඳහා අදාළ මුදල පෙන්වා නොමැති බව දක්වා තිබුණද ඉදිරිපත් කළ මිල ගණන් තුළ ස්ථාපනය කිරීම, ගොඩනැගීම සහ වෙනත් සේවාවන් (Installation/ Construction and other Services) යටතේ උක්ත මුදල දක්වා තිබුණි. එසේ වුව ද ඒ පිළිබඳ නොසලකා තාක්ෂණික ඇගයීම් කමිටුව කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ වටිනාකමට රු. 254,062,080 ක් නැවතත් එකතු කිරීම තුළින් සාවද්‍ය ගණනය කිරීමක් සිදුකර තිබුණි. අනතුරුව රු. 254,062,080 ක් වැඩි වටිනාකමකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට 2019 පෙබරවාරි 13 දින ඉදිරිපත් කළ අංක Ir/63/2019 දරන අමාත්‍ය මණ්ඩලය සංදේශය මඟින් අනුමැතිය ලබාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිවයුතු තාක්ෂණ ඇගයීම් කමිටුවට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | | විගණන පනතේ 38(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කළ යුතුය. |
| **(iii)** | වාරිමාර්ග දෙපාර්තමේන්තුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමඟ 2019 ජුනි 12 දින දෙවන අවබෝධතා ගිවිසුමට එළඹෙන විටත් ප්‍රධාන කොන්ත්‍රාත් ගිවිසුමේ කාලය අවසන් වී තිබුණි. අවබෝධතා ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව මාස 18 ක කාලයක් තුළ අවසන් කළ යුතු අතර විගණිත දින වූ 2023 මැයි 31 දක්වා අවසන් කර නොතිබුණි. එහිදී උප කොන්ත්‍රාත්කරු වන දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයන් නිසා දැරීමට සිදුවන අමතර පිරිවැය හේතුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ කාර්යයන්ට සිදුවන අහිතකර බලපෑම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන | අවබෝධතා ගිවිසුමට පෙර සිදු වී ඇති ප්‍රමාද සඳහා දෙපාර්තමේන්තුවට බලපෑම් කිරීමේ හැකියාවක් නොමැති අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව උප කොන්ත්‍රාත්කරුවෙකු නොවේ. | මෙම කොන්ත්‍රාත්තුව භාර ගැනීමේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය, කොන්ත්‍රාත් පරිපාලනය, ගෙවීම් ක්‍රියාවලිය යන කාර්යයන් තුළ අතිරේක කාලයක්, අමතර පරිපාලන වියදමක් හා අවිධිමත්භාවයක් සිදුවී ඇත්ද යන්න පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තහවුරු කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලය සමග 2019 ජුනි 12 දින අවබෝධතා ගිවිසුමට එළඹෙන අවස්ථාව වන විටත් ප්‍රධාන කොන්ත්‍රාත් ගිවිසුමේ කාලය අවසන් වී තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව කොන්ත්‍රාත්තුව ප්‍රමාද කිරීම ප්‍රධාන කොන්ත්‍රාත්කරුට කාලය දීර්ඝ කර ගැනීමට සහ අතිරේක පිරිවැය ඉල්ලා සිටීමේ හිමිකමක් ඇතිවීමට හා එහි වගකීම උපකොන්ත්‍රාත්කරුවකු ලෙස ඉදිරිපත් වූ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත විතැන් කිරීමට හැකියාවක් පැවතුණි. | | |
| **(iv)** | දෙපාර්තමේන්තුව සමඟ වූ කොත්ත්‍රාත් ගිවිසුමෙහි 14.4 උප වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව සඳහා පළමු අතුරු ගෙවීම් සඳහා භෞතික කාර්යසාධනය සියයට 25 සම්පූර්ණ කළ යුතු වුවත් ඒ පිළිබඳ නොසලකා භෞතික කාර්යසාධනය සියයට 1.52 සම්පූර්ණ වූ අවස්ථාවේ සිට අතුරු ගෙවීම ආරම්භ කර තිබුණි. ඒ අනුව 2022 ඔක්තෝබර් 31 දින වන විට ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය සියයට 17.09 ක් වූ අතර 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ අතුරු ගෙවීම් 11 ක් මගින් රු.401,165,861 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර කොන්ත්‍රාත් ගිවිසුම මගින් එකඟ වූ ගෙවීම් පටිපාටියට බැහැරව ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| **(v)** | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ කටයුතු සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට රු. 32,641,534 ක් වෙන්කර තිබූ නමුත් විධිමත් අධිකාරී බලයකින් තොරව එම සැලසුම සංශෝධනය කර අදාළ මුදල කාර්යාලීය උපයෝගීතාවයන් හා කාර්යාලය සඳහා නිවාස කුලියට ගැනීම වෙනුවෙන් භාවිතා කර තිබුණි. | ගිවිසුම් පරිදි කොන්ත්‍රාත්කරුට වැඩ භාර දීමට නොහැකි වීම හා ඉදිකිරීම් කාලය මාස දහ අටක් වූ බැවින් ගොඩනැගිලි ඉදි කර භාවිතයට ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොවූ බැවින් ගොඩනැගිලි කුලීපදනම මත ලබාගෙන ඇත | කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර කොන්ත්‍රාත් ගිවිසුම මගින් එකඟ වූ ගෙවීම් පටිපාටියට බැහැරව ගෙවීම් කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(vi)** | කොන්ත්‍රාත් ගිවිසුම මඟින් ව්‍යාපෘති කළමණාකරණ කටයුතු සඳහා වෙන්කළ සමස්ත ප්‍රතිපාදනය රු.114,823,880 ක් සහ අවබෝධතා ගිවිසුම (MOU) ප්‍රකාරව ව්‍යාපෘතියේ කළමනාකරණ කටයුතු සඳහා වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු.119,817,787 ක් ලෙස සමස්තය රු.234,641,667 ක මුදලක් එනම් කළ වැඩකොටස්වල වටිනාකම වූ රු. 401,165,861න් සියයට 58ක් ව්‍යාපෘති කළමණාකරණය සඳහා වැයකර තිබුණි. | අවසන් කළ වැඩවලට සමානුපාතික කළමනාකරණ කටයුතු සඳහා වෙන්කර ප්‍රතිපාදන වියදම් කර ඇත. | කොන්ත්‍රාත් පරිපාලනය සඳහා වෙන්කරන ලද මෙහෙයුම් හා නඩත්තු පිරිවැය ආර්ථිකමය වශයෙන් වඩාත් ඵලදායි හා කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ආ) | කම්කරු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමට සේවකයින් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල මට්ටමින් බඳවාගෙන තිබූ අතර, එම සේවකයින්ට සමඟ මාස 03 ක කාලයක් සඳහා වලංගු වන පරිදි ගිවිසුම් අත්සන් කර තිබුණි. ඊට අදාළ ගෙවීම් කිරීමේදී සේවයට පැමිණි දිනය, වේලාව, අත්සන ඇතුළත් පැමිණීමේ ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම හා අදාළ දිනවල සේවයට වාර්තා කළ බවට තහවුරු ලේඛන වවුචර්වලට අමුණා නොතිබීම, ඉංජිනේරු සහකාරවරුන්ගේ මිනුම් පොතෙහි දැක්වෙන මිනුම් මත පදනම්ව ගෙවීම් අනුමත කිරීම හේතුවෙන් දෛනික වැටුප් ගෙවීමේදී සේවය කළ දින ගණන පිළිබඳ තහවුරුවකින් තොරව ගෙවීම් කර තිබීම, ගෙවීම් ලේඛන වලට අත්සන් කර තිබුණු නමුත් එහිදී අනන්‍යතාවය තහවුරු කරගෙන නොතිබීම යන ගැටළු පැනනැගී තිබුණි. | කම්කරුවන් නිශ්චිත කාර්යයක් සඳහා බඳවා ගැනීමේදී නිශ්චිත කොන්ත්‍රාත් ගිවිසුමක් අනුව බඳවා ගෙන ඇත. තවද අදාළ ඉදිකිරීම් කාර්යයට ගතවන කාලය අනුව මාස 03ක් නොඉක්මවන පරිදි ගිවිසුම් වලට එළඹ ඇති අතර, මාස 03න් පසුව ගිවිසුම් කාලය දීර්ඝ කිරීමක්ද සිදුකර නොමැත.<br>අදාළ කම්කරුවන්ගේ සේවය ලබා ගැනීමේදී නියමිත ක්ෂේත්‍රය සඳහා ඔවුන් වාර්තා කිරීම තහවුරු කර ගැනීම සඳහා එම ක්ෂේත්‍රය භාර ඉංජිනේරු සහකාර හෝ තාක්ෂණ සහායක භාරයේ දිනය, වේලාව සහ අත්සන සහිත පැමිණීමේ ලේඛන නඩත්තු කර ඇත. ඉංජිනේරු සහකාරවරුන්ගේ මිනුම් පොතෙහි දැක්වෙන මිනුම් පදනම්ව කොට්ඨාශ සහකාර හා සැලසුම් ශිල්පීන්ගේ අදාළ පරීක්ෂා කිරීම් වලින් අනතුරුව ගෙවීම් අනුමත කර ඇත. ඒ සඳහා දෛනික පැමිණීමේ සටහන් පත්‍ර වලද ඔවුන්ගේ පැමිණීමේ දින ගණන සටහන් කර ඇත. ගෙවීම් වවුචරයන්හි ලිපිගොනු යොමුව ලෙස මිණුම් පොතේ අංකය සඳහන් කර ඇති අතර, ගෙවීම් සහතික කිරීමේදී මිනුම් පොතේ සටහන්, අදාළ කම්කරු ගිවිසුම හා ඇස්තමේන්තුව මෙන්ම දෛනික සටහන් පත්‍රද පරීක්ෂා කරනු ලබයි. | ප්‍රාදේශීය කාර්යාල මඟින් බාහිර කම්කරුවන් සේවයේ යොදවා ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය පැමිණීමේ ලේඛන ඇතුලු පවත්වා ගත යුතු වාර්තා පිළිබඳ පොදු ආකෘතින් හඳුන්වා දෙමින්, ඊට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා ක්‍රියාවට නැංවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විවිධ ව්‍යාපෘතීන් යටතේ වැව්/ ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය නිවැරදිව ලැබී ඇති බවට තහවුරු කිරීමෙන් තොරව භාණ්ඩ ලැබීම් තුණ්ඩු නිකුත් කර තිබුණි. | ඉදිරියේ දී කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් දැනුවත් කරමින් උපදෙස් මාලාවක් නිකුත් කිරීමට කටයුතු කරමි. | ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවල නියමයන්ට අනුව ලැබීම් හා නිකුත් කිරීමේ නියෝග නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.7** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------------- | -------------------------------- | ----------- |
| (අ) | දෙපාර්තමේන්තුව යටතේ වන කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 14, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 හා යාන්ත්‍රික කාර්යාල 12 ඇතුළු ප්‍රාදේශීය කාර්යාලයන්හි ව්‍යාපෘතිය හා පිහිටීම පිළිබඳ තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | ඉදිරි වාර්තාව සඳහා එම තොරතුරු ඇතුළත් කිරීමට සටහන් කරගත් බව වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩසටහන් කළමනාකරණ) දන්වා ඇත. | දෙපාර්තමේන්තුව යටතේ වන වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල හා යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල ව්‍යාපෘති හා පිහිටීම පිළිබඳ තොරතුරු වාර්ෂික කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉදිරි ඉලක්කයන් දැක්වීමේදී ඇතැම් කරුණු යටතේ ඉටු කිරීමට අපේක්ෂා කරන කාර්යභාරය හා ඒවා ළඟාකර ගැනීමට අපේක්ෂා කරන කාල රාමුව දක්වා නොතිබුණි. | ඉදිරි ඉලක්ක දැක්වීමේදී ඉඩම් අක්කර 15000ක් සඳහා වාරිමාර්ග පහසුකම් සැපයීම හා බෝග විවිධාංගීකරණය මගින් බෝග තීව්‍රතාවය 2.0 ට ආසන්න මට්ටමට ගැනීම යන කාර්යභාරයන් වසර 2030 දී ළඟාකර ගැනීමට අපේක්ෂිත අතර ඇතැම් ඉලක්ක දීර්ඝකාලීන බැවින් ඒ සඳහා කාල රාමුවක් නිශ්චිතව ඉදිරිපත් කර නොමැත. | කාර්යසාධන වාර්තාවේ ඉදිරි ඉලක්කයන් දැක්වීමේ දී ඉටු කිරීමට අපේක්ෂා කරන කාර්යභාරය හා ඒවා ළඟාකර ගැනීමට අපේක්ෂා කරන කාල රාමුව ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2 වැනි පරිච්ඡේදයේ විදේශ ණය ආධාර යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ මහා පරිමාණ හා | දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ |

| | | | |
|---|---|---|---|
| | විසින් ක්‍රියාත්මක කළ මහාපරිමාණ හා මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති 19 ක් හා වෙනත් ව්‍යාපෘති 7 ක තොරතුරු දැක්වීමේදී එහිදී ඇතැම් ව්‍යාපෘතිවල ප්‍රගතිය දක්වා තිබුණු නමුත් අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු හා අභියෝග පිළිබඳවත් ඒවා නිම කිරීමේ ඉදිරි ඉලක්ක පිළිබඳවත් සඳහන් කර නොතිබුණි. | මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති 19 ක හා වෙනත් ව්‍යාපෘති 7 ක තොරතුරු වාර්ෂික කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර ඇත.<br>එම ව්‍යාපෘති වල ප්‍රගතිය අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු හා අභියෝග පිළිබඳ තොරතුරු ලබාදෙන ලෙස දන්වා ඇත. ඒ අනුව ඉදිරි වාර්තාව සඳහා එය ඇතුළත් කිරීමට සටහන් කරගන්නා ලදී. | මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ වාරි ව්‍යාපෘති අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු හා අභියෝග පිළිබඳවත්, ඒවා නිම කිරීමේ ඉදිරි ඉලක්ක පිළිබඳවත් වාර්ෂික කාර්යසාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවට බලය පැවරී ඇති සියලු කාර්යයන් යටතේ පාලනය කරනු ලබන ස්වභාවික හා භෞතික සම්පත් හා ප්‍රධාන කාර්යභාරයට ඇතුළත් තොරතුරු ජයග්‍රහණ, ප්‍රගතිය හා අභියෝග යටතේ අනාවරණය කර නොතිබුණි. | ඉදිරි වාර්තාව සඳහා එම දත්ත ඇතුළත් කිරීමට සටහන් කරගන්නා ලදී. | අදාළ කරුණු, වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දෙවන පරිච්ඡේදය තුළ ජයග්‍රහණ ප්‍රගතිය හා අභියෝග යටතේ අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.8 විදේශ ආධාර ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | -------------------------------- | ------------- |
| දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ (CRIP) ප්‍රතිපාදන යටතේ ශක්‍යතා අධ්‍යනයන් 6 ක් සිදු කිරීම සඳහා 2021 වර්ෂය දක්වා රු. මිලියන 430 ක් වැය කර තිබූ නමුත් ඒ යටතේ ඉදිරිපත් කර තිබූ වාර්තා අනුව දෙපාර්තමේන්තුවේ ඉදිරි සංවර්ධන ව්‍යාපෘතීන් සැලසුම් කර සංවර්ධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | CRIP වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අදියර කිහිපයකින් යුත් ව්‍යාපෘතියකි. මෙහි පළමු අදියරේ දී තෝරාගත් ගංගා ද්‍රෝණි 10ක අධ්‍යයන කටයුතු කළ අතර එහිදී හඳුනාගත් ජල කළමනාකරණයට අදාළ ගැටලු විසඳීම සඳහා විවිධ යෝජනා ඉදිරිපත් කර ඇත. මෙම තෝරාගත් යෝජනා අතරින් කොටසක් සඳහා ශක්‍යතා අධ්‍යයනයක් එම ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ සිදුකර ඇත.<br>වාරිමාර්ග අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතීන්හි ඉදිරි වැඩ කටයුතු සඳහා අවශ්‍ය සම්පත් හා උපදෙස් ලබාදෙන්නේ නම් ඒ අනුව ඉදිරියේදී කටයුතු කළ හැක. | දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී ගංගා ද්‍රෝණි සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සැලසුම් සකස් කිරීම ආදී මූලික කටයුතු සිදු කිරීමේදී මෙම අධ්‍යයන වාර්තා උපයෝගීකර ගත යුතුය. ඒ සඳහා අදාළ පිටපත් පුස්තකාලය හා අදාළ අංශ වෙත යොමුකළ යුතු අතර දෙපාර්තමේන්තුවේ දිගු හා කෙටිකාලීන සැලසුම් වලට ද එම යෝජනා ඇතුළත් කළ යුතුය. |

## 3.9 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | --------------------------- | ------------- |

(අ) 2021 වර්ෂය තුළ කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල 14 ක් යටතේ වූ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 52 ක් මඟින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත හා නඩත්තු වැඩ සම්බන්ධයෙන් විගණනයට කැඳවන ලද තොරතුරු සඳහා කලාප කාර්යාල 10 කට අයත් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31 ක් පමණක් තොරතුරු ඉදිරිපත් කර තිබුණි. එම තොරතුරු වලට අනුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31 මඟින් රු. මිලියන 6,304 ක වටිනාකමකින් යුත් කර්මාන්ත 1050 ක් ක්‍රියාත්මක කර තිබුණි. එම කර්මාන්ත අතරින් රු.මිලියන 5,594 ක් වටිනාකමින් යුත් කර්මාන්ත 776 ක් එනම් සියයට 74ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.7 ප්‍රකාරව ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) ක්‍රියාත්මක කර තිබුණි. පහත නිරීක්ෂණ කෙරේ.

*ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම:*

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (NPA procurement manual) 4.31. හා 4.3.2 අනුව පහත සඳහන් කාර්යයන් සඳහා ඇස්තමේන්තුගත මුදලින් ප්‍රතිශතයන් වෙන්කොට ඇත.

| | |
|---|---|
| Preliminary design and detail design costs | 3.5 |
| Supervision costs | 1.5 |
| Administration costs | 1.0 |
| | 6.0 |

ඒ අනුව දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක - 03/2020 මගින් ඉංජිනේරුමය පරිපාලන වියදම් ලෙස (Engineering Administration) ඇස්තමේන්තුගත මුදලින් (civil cost) **සියයට** 6 ක් වෙන්කිරීමට ප්‍රතිපාදන සලසා ඇත. එම සියයට 6 අධීක්ෂණ හා පරිපාලන වියදම් වලට පමණක් නොව මූලික සැලසුම් පත්, පිරිවිතර මිල ගණන් පත්‍ර (preliminary design and detail design costs) ආදිය සඳහා ද වෙන් කොට ඇත.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) මෙම ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ වැව්/ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ශ්‍රමය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අනුයුක්ත කම්කරුවන් මඟින් සපයාගත නොහැකි අවස්ථාවලදී පමණක් බාහිරින් සපයා ගතයුතු වුවත් සියලු පුහුණු හා නුපුහුණු ශ්‍රම අවශ්‍යතා ශ්‍රම සැපයුම් කරුවන්ගෙන් හෝ ගොවි සංවිධාන මඟින් හෝ තනි පුද්ගල කම්කරු ගිවිසුම් යටතේ සපයාගෙන තිබුණි. | පිළිතුරු සපයා නැත. | සෘජුශ්‍රම පදනම මත කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී සිදු වන අවිධිමත්භාවයන් වැළකෙන පරිදි, ශ්‍රමය සපයා ගැනීමේදී, සේවයේ යොදවා ගැනීමේදී, ගෙවීම් කිරීමේදී අනුගමනය කළ යුතු පටිපාටීන් හා භාවිතා කළ යුතු ලේඛනවලට අදාළ ආකෘති හඳුන්වා දෙමින් අභ්‍යන්තර |

| | | | |
|---|---|---|---|
| | | | පාලනය ශක්තිමත් කිරීම සඳහා චක්‍රලේඛ මඟින් උපදෙස් නිකුත් කළ යුතුය. |
| (ii) | මේ යටතේ වැව්/ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා දෙපාර්තමේන්තුව සතුව පවතින යන්ත්‍රෝපකරණ මඟින් අදාළ සේවා ලබාගත නොහැකි විටදී පමණක් අවශ්‍ය යන්ත්‍රෝපකරණ බාහිරින් සපයාගත යුතු වුවත් දෙපාර්තමේන්තුව සතුව පවතින 350 ක් පමණ වූ යන්ත්‍රෝපකරණ ඇණිය තුළ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින යන්ත්‍රෝපකරණ නිෂ්කාර්යව පැවතියදී බාහිර සැපයුම්කරුවන් වෙතින් කුලී පදනම මත යන්ත්‍රෝපකරණ සපයාගෙන තිබුණි. | දෙපාර්තමේන්තුව සතුව ලංකාවේ විවිධ ස්ථාන වල පවතින යන්ත්‍රෝපකරණ ක්‍රියාකාරී තත්ත්වයේ තිබුණද 2022 වසරේ පැවති ඉන්ධන අර්බුදය තුළ ඉන්ධන ලබාගැනීමේ දැඩි අපහසුතා පැවතුණි. එබැවින් හිඹිලියාකඩ වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ද අත්‍යවශ්‍ය කටයුත්තකදී බාහිර සැපයුම්කරුවෙකුගෙන් යන්ත්‍රෝපකරණ ලබාගැනීමට සිදුවූ බව ප්‍රධාන නේවාසික ඉංජිනේරු විසින් ප්‍රකාශ කර ඇත. | දෙපාර්තමේන්තුවට අයත් යන්ත්‍ර සූත්‍ර පවතින අවස්ථාවන්හිදී බාහිරෙන් කුලී පදනම මත යන්ත්‍ර සූත්‍ර සපයා නොගත යුතුය. එහිදී අනුගමනය කළ යුතු පටිපාටින් නිශ්චය කර චක්‍රලේඛ මඟින් උපදෙස් නිකුත් කළ යුතුය. |
| (iii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 අනුව ප්‍රසම්පාදන සැලැස්ම තුළ ප්‍රසම්පාදන ක්‍රමය නිශ්චය කර තිබිය යුතු අතර මාර්ගෝපදේශ 4.2.3(ඇ) අනුව ප්‍රසම්පාදන කාල සටහන ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතු වේ. එසේවුවද ඒ අනුව කටයුතු කර නොතිබූ අතර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 31 ක් මඟින් 2022 වර්ෂය තුළ ඉටු කරන ලද රු.මිලියන 6,304 ක් වූ ඉදිකිරීම් හා නඩත්තු කර්මාන්ත 1,050 ක ප්‍රසම්පාදන ක්‍රමවේදය ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් නිශ්චය කර තිබුණි. | පිළිතුරු සපයා නැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රමය නිශ්චය කර සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.3.2 ට අනුකූල ලෙස ඇස්තමේන්තු පිළියෙල නොකිරීම නිසා 2022 වර්ෂය තුළ සිදු කරන ලද රු. මිලියන 7,820 ක වටිනාකමින් යුත් ඉදිකිරීම් හා නඩත්තු වැඩ 1,493 ක අධීක්ෂණ හා පරිපාලන පිරිවැය අධි ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 92.2 ක් විය. | පිළිතුරු සපයා නැත. | ඇස්තමේන්තු අනුඥාත කිරීමට ප්‍රථම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුකූලව පිළියෙල කර ඇති බව තහවුරු කරගත යුතුය. |

## 3.10 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| | ---------------------- | ----------------------------- | --------------- |
| (අ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින්, හෝ දෙපාර්තමේන්තු ලිපිනය යටතේ වාහන 2004 ක් ලියාපදිංචි වී තිබුණද දෙපාර්තමේන්තුවේ වාහන ලේඛනය අනුව දෙපාර්තමේන්තුවට අයත් හා පරිහරණය කරනු ලබන වාහන සංඛ්‍යාව 1,124 ක් විය. ඒ අනුව වාහන 880 ක් දෙපාර්තමේන්තුව භාරයේ නොපැවතුණි. | දෙපාර්තමේන්තුව යටතේ සඳහන් කර ඇති වාහන 2004න් 1124 ක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇති අතර එම වාහන පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වෙත ඉදිරිපත් කර එම කාර්යාල වල වාර්ෂික ගබඩා සමීක්ෂණ වාර්තා පරීක්ෂා කරමින් තහවුරුකර ගැනීමේ කටයුතු සිදු කරගෙන යනු ලැබේ. ඉතිරි වාහන වලින් විශාල ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව තුළ නොමැති අතර ඒවා තහවුරු කර ගැනීමටද දෙපාර්තමේන්තුව තුළ ප්‍රමාණවත් ලේඛන නොපවතින බැවින් එම වාහන පවතින ස්ථාන පිළිබඳ විස්තර පහත පරිදි වේ,<br>• අපහරණ ක්‍රියාවලිය තුළින් ටෙන්ඩර් මඟින් අපහරණයට යොමුකර බාහිර පුද්ගලයින්ට ලබා දී ඇති නමුත් ලියාපදිංචිය පවරා ගෙන නොමැති වාහන.<br>• අපහරණ ක්‍රියාවලිය තුළින් ටෙන්ඩර් මඟින් අබලි වාහන ලෙස ලියාපදිංචිය අවලංගු කිරීමට යොමු කරමින් යකඩ ලෙස ලබා දී ඇති වාහන.<br>• ක්ෂේත්‍ර නිලධාරීන්හට විවිධ ව්‍යාපෘති මඟින් ලබා දී ඇති නමුත් ව්‍යාපෘතිය අවසානයේදී එම නිලධාරීන් විසින් අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොමැති වාහන (උදාහරණ: යතුරු පැදි)<br>වෙනත් දෙපාර්තමේන්තු වලට විවිධ ව්‍යාපෘති යටතේ ලබා දුන්නද ව්‍යාපෘති අවසානයේදී එම අදාළ දෙපාර්තමේන්තු විසින් පවරා නොගත් වාහන. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව/ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින් ලියාපදිංචි වී ඇති නමුත් දෙපාර්තමේන්තුව භාරයේ නොපවතින වාහන 880 පිළිබඳ සොයා බලා වාහන ලේඛනයේ නිවැරදි කිරීම් සිදු කළ යුතුය. වාහන සම්බන්ධයෙන් යම් අක්‍රමිකතාවයක් සිදුව ඇත්ද පරීක්ෂා කළ යුතුය. |
| (ආ) | දෙටගමුව වැවෙහි ඉදිකිරීම් සඳහා 2021 | දෙටගමුව ව්‍යාපෘතිය සඳහා රැගෙන | ගබඩා ද්‍රව්‍ය මිලදී |

| | | | |
|---|---|---|---|
| | මාර්තු 23 දින මිලදී ගත් වෙළඳපොළ වටිනාකම රු. 30,002,500 ක් වූ මිලිමීටර් 12 වානේ කම්බි 1100 ක් විධිමත් ලේඛනගත කිරීමකින් තොරව කතරගම, මයිලගමේ ඒකක කාර්යාලයේ ගොඩගසා තිබුණි. | එනු ලැබූ මිලි මීටර් 12 වැරගැන්නුම් කම්බි වැල්ලවාය ප්‍රධාන ගබඩාව වෙත ගෙනවිත් නැවත කතරගම වැඩබිම වෙත රැගෙන යැමේදී අමතර ප්‍රවාහන වියදමක් දැරීමට සිදුවන බැවින් ඍජුවම කතරගම පිහිටි මයිලගම ඒකක කාර්යාලය වෙත රැගෙන යැම සිදුකර ඇත.<br>තවද මෙම ඉදිකිරීම් කටයුතු වලදී යෝජිත නිර්මිත වල යම් යම් ප්‍රමාණයන් පසුව වෙනස්වීම නිසා ඇනවුම් කළ තොගයට අදාළ වැරගැන්නුම් සියල්ල දෙටගමුව වැඩබිම සඳහා අවශ්‍ය නොවූ බැවින් ඉංජිනේරු සහකාර මහතා විසින් ඔහුට අවශ්‍ය ප්‍රමාණය පමණක් ද්‍රව්‍ය වාර්තා වලට ගෙන ඇත.<br>එසේ ඉතිරිව ඇති මෙම වැරගැන්නුම් ප්‍රමාණය නැවත ගබඩාව වෙත භාරදෙන ලෙස ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුගේ අංක හා 2022 දෙසැම්බර් 20 දිනැති ලිපිය මගින් ඉංජිනේරු සහකාර වෙත දැනුම් දීමට කටයුතු කර ඇත. | ගැනීම, නිකුත් කිරීම, භාවිතය සහ පොත්පත් පවත්වාගෙන යාම සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය.<br>තොග ලේඛන විධිමත් පරිදි පවත්වාගෙන නොයාම සම්බන්ධ වග කිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |
| (ඈ) | විගණිත දිනය වූ 2022 මාර්තු 08 දිනට හිරියාල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අනුයුක්ත කොට්ඨාශ සහකාරවරයාගේ ද්‍රව්‍ය සාරාංශය අනුව පැවති, ඉදිකිරීම් ද්‍රව්‍ය තොග ශේෂයන් හා ඇඳගල ඉදිකිරීම් භූමියේ හා ක්ෂේත්‍ර ගබඩාවේ පැවති තොග ශේෂයන් සැසඳීමේදී රු. 6,092,193ක ඌණතාවයක් විය. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. | තොග ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන,මුදල් රෙගුලාසි 101(3) ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඊට අමතරව ආයතන සංග්‍රහයේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.<br>ඉංජිනේරු සහකාරවරුන් වෙත ද්‍රව්‍ය නිකුත් කිරීම ද්‍රව්‍ය භාවිතය හා ලේඛන පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් සමීප අධීක්ෂණයකට ලක් වන පරිදි පාලන පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) දෙපාර්තමේන්තු තොග පොත අනුව 2021 දෙසැම්බර් 31 වන විට රු.5,146,400 ක් වටිනා සිමෙන්ති මිටි 7,662 ක් ඇඳගල අමුණ III අදියර සඳහා හිරියාල කොට්ඨාශ ඉංජිනේරු සහකාරවරයා වෙත නිකුත් කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට ඉන් සිමෙන්ති මිටි 2784 ක් ඉංජිනේරු සහකාරවරයා භාරයේ තිබුණු බව වාර්තා කර තිබුණි. එසේ වුව ද විගණනය විසින් අවස්ථා දෙකකදී සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවන්හිදී රු.2,269,718 ක් පිරිවැය වූ සිමෙන්ති මිටි 2,796ක ඌණතාවයක් පැවතුණි. | පිළිතුරු පසුව ඉදිරිපත් කරමි. | තොග ඌනතාවය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන, මුදල් රෙගුලාසි 101(3) ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඊට අමතරව විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |

**3.11 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයකු විසින් සිදුකරන ලද රිය අනතුරක් සම්බන්ධයෙන් වූ නඩු තීන්දු දෙකකට අදාළව අයවිය යුතුව තිබූ රු.3,908,000 ක මුදලක් 2021 දෙසැම්බර් 31 දිනට, නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරියට ගෙනවිත් තිබුණි. අදාළ ශේෂය එම නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගෙන නොතිබුණු අතර ඔහුගේ විශ්‍රාම වැටුපෙන් මාසිකව රු.10,000 ක් වැනි මුදලක් අයකිරීම හේතුවෙන් එම කාලය තුළ අයකරගෙන තිබූ මුදල රු.300,000 ක් පමණක් විය. 2021 අගෝස්තු මස අදාළ නිලධාරියා මියයාම හේතුකොටගෙන ඉහත නොපියවූ අග්‍රිම ශේෂය පියවාගැනීමට නොහැකිව තිබුණි. | අදාළ සිද්ධියට වගකිව යුතු පාර්ශවය වන විශ්‍රාමික ඉංජිනේරු මහතාගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගත හැකි සීමාව තුළ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් කරන ලද වාචික අදහස් විමසීම මත එකඟතාවය මත ඔහුගේ විශ්‍රාම වැටුපෙන් අයකර ගත හැකි උපරිම විශ්‍රාම මුදල වන මෙම මුදල අය කර එවා ඇත. ඒ අනුව එම මහතා විශ්‍රාම යන තෙක් අයකර ගැනීමට හැකි වූ මුළු මුදල රු. 300,000 කි. | අදාළ අනතුර සිදු වී වසර 18ක් ගත වන තුරු අලාභය අය කර ගැනීම ප්‍රමාද කළ හා විශ්‍රාම පාරිතෝෂිකයෙන් හිඟ මුදල අයකර නොගත් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන විනයානුකූලව කටයුතු කළ යුතුය. |

**3.12 අනාර්ථික ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.41,643,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් මත 2021 අගෝස්තු | බැරකම් පැවතීම සම්බන්ධව එකඟවෙමි. | දෙපාර්තමේන්තුවට අයත් යන්ත්‍ර සූත්‍ර පවතින |

| | | | |
|---|---|---|---|
| | 08 දින ආරම්භ කර තිබූ හුදලියාව වැව ප්‍රතිසංස්කරණය සඳහා 2022 දෙසැම්බර් 28 වන විට රු.15,455,953 ක් වැය කර තිබුණු අතර තවදුරටත් ගෙවිය යුතු රු.6,576,474 ක බැරකම් පැවතුණි. වැවෙහි රොන්මඩ ඉවත්කිරීමේ කටයුතුවලින් කොටසක් 2021 වර්ෂයේ ඔක්තෝබර් සිට 2022 පෙබරවාරි දක්වා සිදුකර තිබුණු අතර ඒ සඳහා පෞද්ගලික ආයතනයක් වෙතින් පස් සීරුම්, තල්ලු කිරීම් හා පැටවීම සඳහා භාවිතා කරන කුල්ලක් පමණක් සහිත යන්ත්‍රයක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. ඉහත කාර්යය සිදුකළ හැකි වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අංක RS–1373 දරන JCB යන්ත්‍රය හුදලියාව වැඩ බිමට ගෙනගොස් තිබුණද, එම යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. දෙපාර්තමේන්තුවට අයත් පස් සීරුම්/ කැපීම සඳහා භාවිතා කළ හැකි වර්ක්ස් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයද, අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයෙන් රැගෙන විත් තිබුණු ඩෝසර් යන්ත්‍ර 02 ක් සහ නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයට අයත් ලෝඩර් යන්ත්‍රයක්ද ක්ෂේත්‍රය ආසන්නයේ නවතා තිබුණු නමුත් එම යන්ත්‍රයද වැවෙහි කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. මේ අයුරින් දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත් යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමට හැකිව තිබියදී රියදුරන්ට හා එම සහායකයන්ට නිෂ්කාර්යව වැටුප් ගෙවමින්, කුලී පදනමින් පස් කැපුම් කටයුතු සඳහා පුද්ගලික පාර්ශවයන්ගෙන් වාහන ලබාගෙන තිබුණි. | නිකවැරටිය ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලයට අයත් PC 200 Excavator යන්ත්‍රය ඇබෝගම වැවෙහි ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගෙන තිබුණි. එම නිසා කුලී පදනම මත පුද්ගලික ආයතනයකින් නිසි පරිදි ගිවිසුම්ගතවී PC 200 Excavator යන්ත්‍රය සපයා ගනු ලැබිණි.<br>මෙම දෙපාර්තමේන්තුවේ RS-823 දරන JCB යන්ත්‍රය විගණන නිලධාරීන් පැමිණි 2022 අගෝස්තු 18 දිනට ප්‍රථමව 2022 අගෝස්තු 05 දින වැඩ ආරම්භ කළ පසු, පිළිවෙළින් 2022. අගෝස්තු 06, 07, 08, 09, 10, 13 හා 14 යන දින වල වැඩ කර ඇති අතර, ඉදිරිපස ජැක් වලින් Hydraulic oil ලීක්වීම නිසා එහි තවදුරටත් අලුත්වැඩියාවකින් තොරව වැඩ කිරීමට නොහැකි වීම නිසා, අලුත්වැඩියා කරන තෙක් PC-200 Excavator (කුලී පදනම මත ලබා ගත්) යන්ත්‍රයෙන් පමණක් රොන්මඩ ඉවත්කිරීම සිදු කර ඇත.<br>තව ද 2022 අගෝස්තු 28 දින අලුත්වැඩියා කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තු JCB යන්ත්‍රය හුදලියාව වැවෙහි ඉදිරි වැඩකටයුතු සඳහා යොදාගෙන ඇත. එමෙන්ම ඩෝසර් යන්ත්‍ර 02 ම ඒ අවස්ථාව වනවිට ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබූ අතර IDCT 128 යන්ත්‍රය අක්‍රිය වීමට ප්‍රථමව වැව් පතුලේ රොන්මඩ තල්ලුකර, එකතු කළහැකි ස්ථානවල ගොඩගසා ඇත.<br>තවද එම අවස්ථාවට ගැළපෙන හා ඊට සුදුසුම ක්‍රමයවූ PC 200 Excavator යන්ත්‍රය මගින් කපා ගොඩගසා පැටවීමට කටයුතු කර ඇත. | අවස්ථාවන්හිදී කුලී පදනම මත පිටස්තර යන්ත්‍ර සූත්‍ර සපයා ගැනීම සිදු නොකළ යුතුය. එහිදී අනුගමනය කළ යුතු පටිපාටීන් නිශ්චය කර චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය. දෙපාර්තමේන්තුව සතු යන්ත්‍ර නිශ්කාර්යව පැවතිය දී බාහිරින් කුලී පදනම මත යන්ත්‍ර ලබාගෙන සේවයේ යෙදවූ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව මගින් සිදුකළ වැවේ පතුලේ අඟල් 6 ක පස් ඉවත් කිරීමට අමතරව වැව මධ්‍යයේ දළ වශයෙන් වර්ගමීටර 1000 ක පමණ | හුදලියාව වැවෙහි ප්‍රතිසංස්කරණ කටයුතු 2021 අගෝස්තු 08 දින ආරම්භ කර ඇති අතර ගොවි සංවිධානයන්හි කැමැත්ත ඇතිව | ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම් කළ පරිදි අදාළ කාල සීමාව තුළ අවසන්කර එහි ප්‍රතිලාභ |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණයක තැනින් තැන අඩි 2 – 2 ½ පමණ ගැඹුරු විශාල වලවල් ඇතිවන අයුරින් පස් සෝදා වැලි ලබා ගැනීමට පස් ඉවත්කර තිබුණු අතර ඒ සම්බන්ධ තොරතුරු කිසිවක් ව්‍යාපෘතිය සතුව නොතිබුණි. වැවෙහි ජලය රැඳී පැවතීමට බාධා නොවන අයුරින්, රොන්මඩ ඉවත් කිරීමට හැකිව තිබුණද ඒ වෙනුවට වැවේ ජලය වසරකට ආසන්න කාලයක් සම්පූර්ණයෙන් ඉවත් කර පස් ඉවත්කර තිබීම හේතුවෙන් ගොවිතැනෙහි නියැළෙන ගොවීන්ට කන්න 3ක් වගා කිරීමට නොහැකි වී තිබුණි. | 2022 සැප්තැම්බර් මාසයේදී වැවෙහි පැවති ජලය ඉවත් කිරීම සඳහා වැව් බැම්ම කපා වැවෙහි ජලය ඉවත් කර ඇත.<br>2022 පෙබරවාරි මාසයේදී රටේ ඇති වූ ඉන්ධන අර්බුදය නිසා සංවර්ධන කටයුතු මුළුමනින්ම නතර විය. නැවත වැඩ ආරම්භ කිරීමට හැකිවුයේ 2022 අගෝස්තු මසදි වන අතර සංවර්ධන කටයුතු ප්‍රමාදවීමට ප්‍රධාන හේතුව වූයේ රටේ පැවති අර්බුදකාරි තත්ත්වයයි.<br>ප්‍රාදේශීය කාර්යාල ලැබුණු සීමිත ඉන්ධන ප්‍රමාණය කළමනාකරණය කර ගනිමින් රොන්මඩ ඉවත් කිරීමේ කාර්යය හා වැව් බැම්මේ, වාන් ඇළෙහි ඉතිරි වැඩ කටයුතු යුහුසුළුව සිදුකර ඇත. කුලී පදනම මත වාහන ලබා ගෙන ඇත්තේ අගෝස්තු මස අවසන් වනතුරු වන අතර එම පුද්ගලික යන්ත්‍රය වන PC 200 Excavator යන්ත්‍රය සඳහාද අදාළ පුද්ගලික ආයතනයට තෙල් සැපයීම අපහසුවූ බැවින් එම යන්ත්‍රයෙන් වැඩ ගැනීම අවසන් කර ඇත.<br>වැව මැද පස් ඉවත් කිරීම යන්ත්‍රෝපකරණ අධිකාරිය මගින් සිදු කරන ලද අතර, ඔවුන් මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කටයුතු සමඟ කිසිදු සම්බන්ධතාවයක් නොතිබූ බවත්, ඔවුන් වැව මැද කපා දමා ගොස් තිබූ වළවල් පිළිබඳ කිසිදු වගකීමක් මෙම දෙපාර්තමේන්තුවට ලබාගත නොහැකි බවත් දන්වා සිටිමි. | ජනතාවට ලැබීමට සැලැස්විය යුතුය. ව්‍යාපෘතියේ වැඩ කටයුතු සඳහා අවසරය දීමේදී පනවනු ලැබූ කොන්දේසි වලට අනුකූලව ඉටු කර ඇති බවට ව්‍යාපෘතිය අවසානයේ දී ප්‍රාදේශීය ඉංජිනේරු විසින් සහතියක් නිකුත් කළ යුතුය.<br>ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකරන සෑම අවස්ථාවක දීම අවසර පත්‍රයෙහි සඳහන් කොන්දේසි අනුව කටයුතු සිදු වන බවට ලිඛිතව තහවුරු කළ යුතුය.<br>රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බැවින් වැවේ පස් සෝදා වැලි ලබා ගැනීමට ඉඩ හැරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේදී ආරම්භ කරන ලද කුඩාවිලච්චිය ජලාශය පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ කුඩා ජලාශයේ වාන් දොරටු 5 ක් අලුතින් ඉදි කිරීමට නියමිතව තිබූ අතර රාජාංගණය ජලාශයෙන් ඉවත් කරන ලද හොඳ තත්ත්වයේ පැවැති වාන් දොරටු 5ක් අලුත්වැඩියා කර ඒ සඳහා යොදා ගැනීමට තීරණය කර තිබුණි. එම | පිළිතුරු සපයා නැත. | අනාර්ථික වියදම් වළක්වා ගැනීමට පියවර ගත යුතු අතර සැලසුම් කළ පරිදි පුනරුත්ථාපන කටයුතු නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යකඩ ගේට්ටු 5 අලුත්වැඩියාව සඳහා රු.94,073,866 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට යථෝක්ත ඇස්තමේන්තු මුදලින් රු.මිලියන 10 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඉන් රු.9,997,582 ක් වැය කර එක් ගේට්ටුවක් අලුත්වැඩියා කිරීම හා ඇස්තමේන්තු ප්‍රකාරව Sand Blasting Yard එක ඉදිකිරීම සිදුකර තිබුණි. ජලාශයේ ඉදිකිරීම් අවසන් නොකිරීම හා අලුත්වැඩියා කරන ලද ගේට්ටු ජලාශයේ ඉදිකිරීම් සඳහා යොදා නොගැනීම හේතුවෙන් ඒ සඳහා දරන ලද පිරිවැය අනාර්ථික වියදමක් වී තිබුණි. | | |
| (ඇ) | වේලිඔය අමුණේ වැලි තැන්පත් වීම හා ඉවත් කිරීම**.** | | |
| (i) | 2007 වර්ෂයේ දී ඉදි කර තිබූ වේලිඔය අමුණු තුළ 2017 ආරම්භය වන විට වැලි ඝනමීටර් 500,000 තැන්පත්ව පවතින බව වේලිඔය ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ඇස්තමේන්තු කර තිබූ අතර වේල්ලේ වැලි සොරොව්ව 2017 වර්ෂයන් පසුව විවෘත කොට නොතිබීම හේතුවෙන් ඉන් අනතුරුවද වසර තුනක කාල සීමාව තුළ විශාල වැලි ප්‍රමාණයක් අදාළ ස්ථානයේ තැන්පත් වී තිබුණි. උමාඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වේලිඔය ජලාශයේ සිට කිලෝමීටර 20 ක් පමණ දුරින් පිහිටි කුඩා ඔය ජලාශය ඉදිකිරීම් කටයුතු සිදු කර තිබුණු අතර ඒ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු ගත වැලි ප්‍රමාණය කියුබික් මීටර් 109,524 ක් විය. වාරිමාර්ග දෙපාර්තමේන්තුව කුඩා ඔය ජලාශයේ ඉදිකිරීම් කටයුතු ස්වකීය සේවකයින් සහ උපකරණ යොදා වැඩ කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ක්‍රියාත්මක කර තිබුණු බැවින් වේලිඔය ජලාශයේ තැන්පත්ව තිබූ වැලි එම ව්‍යාපෘතියේ යන්ත්‍ර සූත්‍ර භාවිතා කර අවම පිරිවැයක් යටතේ උකහා ගැනීමට හා ඒවා කුඩාඔය ජලාශයේ ඉදිකිරීම් සඳහා යොදා ගැනීමට අවස්ථාව පැවැතිණි. එසේ වුවද කුඩාඔය වැව් බැම්මේ මෙම වැලි | පිළිතුරු සපයා නැත. | ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යනයන් සිදු කිරීමේ දී සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඛණිජ සපයා ගැනීම සිදු කරනු ලබන ස්ථාන නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.<br>ස්වකීය සේවකයින් සහ උපකරණ යොදා වැඩ කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමය (force Account) යටතේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දීමේ දී පවතින සම්පත් උපරිම උපයෝජනය පිළිබඳ සැලකිල්ලට ගත යුතුය. ඊට පටහැනිව කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ඩ්‍රෙජින් ලංකා පුද්ගලික සමාගම වෙත වෙලිඔය අමුණේ වැලි ඉවත් කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අනුමැතිය ලබාදී තිබුණි. 2017 සිට 2020 දක්වා එහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 192 ක් වැයකර වැලි කියුබික් මීටර් 6,239 ක් පුද්ගලික සමාගමක් වෙතින් මිලදී ගෙන තිබුණි. | | |
| (ii) | අදාළ සමාගම 2018 වර්ෂයේ සිට ඉවත්කළ වැලි ප්‍රමාණය පිළිබඳ කිසිදු වාර්තාවක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ බලපත්‍ර නිර්දේශයන් මත ඩ්‍රෙජින් ලංකා (පුද්.) ආයතනයට 2018 වර්ෂයේ සිට වැලි ඉවත් කිරීමට අවශ්‍ය අවසරය ලබා දී ඇත. එසේම එම බලපත්‍ර කොන්දේසි අනුව රාජ්‍ය භාගය ලබා ගැනීම සිදු කරනුයේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසිනි. එබැවින් ඉවත්කළ වැලි ප්‍රමාණය පිළිබඳ වාර්තා වෙලිඔය ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු විසින් තබාගෙන නොමැති බව දන්වමි. | මෙම නිරීක්ෂණ කෙරෙහි ද අවධානය යොමුකර ජලාශයන්හි වැලි ඉවත් කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීමේ පටිපාටීන් නිශ්චය කොට ඊට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතීන් ශක්තිමත් කිරීම සඳහා නිශ්චිත චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය. වගකීම් පැහැර හරින ලද ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු ඇතුළු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | දෙපාර්තමේන්තුව සතු භූමි තුළින් ඛණිජ ඉවත් කිරීමේදී ගාස්තු අයකිරීමට විධිමත් ක්‍රමයක් හඳුන්වාදී නොතිබූ අතර වැලි කියුබ් එකක් සඳහා රුපියල් 150 බැගින් අය කරන ලෙස මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂක වෙත දැනුම් දී තිබූ නමුත් ඉවත් කළ වැලි සඳහා කිසිදු මුදලක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය සඳහා කුඩා හා මධ්‍යම වාරිමාර්ග පද්ධති වල නව සංවර්ධන කාර්යයන් සඳහා වන සංරචක යටතේ පිළිවෙළින් රු.මිලියන 950 ක් රු.මිලියන 310ක් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ දක්වා ඇත. ඒ අනුව මාසික ගිණුම් සාරාංශ අනුව වියදම් වර්ගීකරණය කළ විට වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය සඳහා 2022 වසර අවසන් වන විට රු.මී. 952,674 ක වියදමක් දරා ඇත. | ගාස්තු අය කිරීමට ක්‍රමයක් නොමැති බැවින් කැලෑ ආඥාපනතේ 20 වන වගන්තිය යටතේ 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇති ගාස්තු අනුව ඉඩම් පරිහරණ ගාස්තු අය කළ යුතුය. ඉඩම් පරිහරණ ගාස්තු අය කර ගැනීමට නිශ්චිත චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය. වගකීම් පැහැර හරින ලද වාරිමාර්ග අධ්‍යක්ෂවරයා ඇතුළු නිලධාරීන්ට එරෙහිව විනයානුකූල |

| | | | |
|---|---|---|---|
| | | | ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරිමාර්ග සංවර්ධන වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය<br>2016 ජනවාරි 20 දිනැති අංක 15/2034/729/008 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා එළඹ තිබූ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරිමාර්ග සංවර්ධන වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණි. | | |
| (i) | එහිදී වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ වියදම වූ රු. මිලියන 950 යටතේ අනුඥාත කර තිබූ රු.මිලියන 1,600 ක ඇස්තමේන්තුවලට අමතරව අමාත්‍ය මණ්ඩලය තීරණයට පටහැනිව, විධිමත් අනුමැතියකින් තොරව, මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය රු. මිලියන 1,700.5 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 47 ක් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික කටයුතු සිදුකර තිබුණි. | දෙබර ආර පෝෂිත ඇළේ සිට දෙටගමුව වැව දක්වා ප්‍රවාහන දුර කි.මී. 59 ක් වන අතර, කලුගල් කියුබ් එකක් සඳහා ප්‍රවාහන වියදම රු. 5446.93 ක් වේ.<br>එමෙන්ම පෝෂිත ඇළෙන් කඩා ඉවත් කරන ගල් නියමිත ප්‍රමාණයට සකස් කිරීමට, අමතර පිරිවැයක් දැරීමට සිදුවන නිසා දෙබර ආර පෝෂිත ඇළේ සිට දෙටගමුව වැව දක්වා ගල් ලබා ගැනීම ලාභදායක නොවේ.<br>නමුත් දෙබර ආර පෝෂිත ඇළෙන් කඩා ඉවත් කරනු ලැබූ ගල් ආසන්නයේ පිහිටි බලහරුව, ගල්වැව, වටගල ආර සහ තෙබුආර වැව්වල රළපනාව ඉදිකිරීම සඳහා යොදා ගෙන ඇත. | පිරිවැය අවම කර ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන පද්ධතීන් ශක්තිමත් කිරීම සඳහා කටයුතු කළ යුතුය.<br>අනුමත වියදම් සීමාව ඉක්මවා වැය කිරීමට ඇස්තමේන්තු නොකළ යුතුය. |
| (ii) | 2016 සිට 2019 දක්වා කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද එම කාලය තුළ නිමකර නොතිබුණි. 2020 ජනවාරි සිට 2022 සැප්තැම්බර් දක්වා ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රු.403,036,448 ක් වැය කර තිබූ අතර රු. මිලියන 1,025 ක මුළු මුදලක් වැයකර තිබුණි. ඒ අනුව අනුමත වැය සීමාව ඉක්මවා රු. මිලියන 650 ක ඇස්තමේන්තු අනුඥාත කිරීමටත් එම සීමා ඉක්මවා රු. මිලියන 75 ක් වැය කිරීමටත් මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂ කටයුතු කර තිබුණි. | වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය සඳහා කුඩා හා මධ්‍යම වාරිමාර්ග පද්ධතිවල නව සංවර්ධන කාර්යයන් සඳහා වන සංරචක යටතේ පිළිවෙලින් රු.මිලියන 950 ක් හා රු.මිලියන 310 ක් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ දක්වා ඇත. ඒ අනුව මාසික ගිණුම් සාරාංශ අනුව වියදම් වර්ගීකරණය කළ විට වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය සඳහා 2022 වසර අවසන් වනවිට රු.මිලියන 952.674 ක වියදමක් දරා ඇත.<br>නමුත් ව්‍යාපෘති වාර්තාවේ මහා හා මධ්‍යම වාරි පද්ධතිවල කෘෂිමාර්ග ඇතුළුව ප්‍රධාන වැඩ, ප්‍රධාන හා | ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබා දීමේදී අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව අනුමත සීමාව ඉක්මවා වියදම් නොදැරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අතුරු ඇළවල් පුනරුත්ථාපනය, නවීකරණය හා වැඩිදියුණු කිරීම සඳහා මෙන්ම සුළු වාරි පද්ධති වල මාර්ග හා ප්‍රවේශ මාර්ගද ඇතුළත්ව ප්‍රධාන වැඩ, ප්‍රධාන හා අතුරු ඇළ පද්ධති පුනරුත්ථාපනය, නවීකරණය හා වැඩිදියුණු කිරීම සඳහා පිළිවෙළින් රු.මිලියන 1200 ක් සහ රු.මිලියන 1085 ක් ව්‍යාපෘති වාර්තාවේ වෙන්කර ඇත. | |
| (iii) | මෙම ව්‍යාපෘතිය යටතේ මොණරාගල කලාපයට අයත් වැව් කිහිපයක රළපනාව සකස් කිරීම සඳහා රු. 9,570,000 ක් වැයකර කළුගල් කියුබ් 2,482 මිලදීගෙන තිබුණද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාල සීමාවට සමගාමීව 2016 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක උමාඔය පහළ නිම්න සංවර්ධනය හා දෙබරආර ඇළ ව්‍යාපෘති යටතේ ඇළ මාර්ග හා උමං මාර්ග ඉදිකිරීමේදී කළුගල් විශාල ප්‍රමාණයක් කැනීම් කර තිබුණද එම කළුගල් භාවිතයට ගැනීම තුළින් පිරිවැය අවම කරගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙබර ආර පෝෂිත ඇළේ සිට දෙටගමුව වැව දක්වා ප්‍රවාහන දුර කි.මී. 59 ක් වන අතර, කලුගල් කියුබ් එකක් සඳහා ප්‍රවාහන වියදම රු. 5446.93 ක් වේ.<br>එමෙන්ම පෝෂිත ඇළෙන් කඩා ඉවත් කරන ගල් නියමිත ප්‍රමාණයට සකස් කිරීමට, අමතර පිරිවැයක් දැරීමට සිදුවන නිසා දෙබර ආර පෝෂිත ඇළේ සිට දෙටගමුව වැව දක්වා ගල් ලබා ගැනීම ලාභදායක නොවේ.<br>නමුත් දෙබර ආර පෝෂිත ඇළෙන් කඩා ඉවත් කරනු ලැබූ ගල් ආසන්නයේ පිහිටි බලහරුව, ගල්වැව, වටගල ආර සහ තෙබුආර වැව්වල රළපනාව ඉදිකිරීම සඳහා යොදා ගෙන ඇත. | පිරිවැය අවම කර ගැනීමට අභ්‍යන්තර පාලන පද්ධතීන් ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. හැකි සෑම විටම පවතින සම්පත් උපරිම ලෙස භාවිතා කිරීමට චක්‍රලේඛ මඟින් උපදෙස් ලබා දිය යුතුය. |
| (ඊ) | හිඹිලියාකඩ වාරිමාර්ග යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවට අයත් යන්ත්‍රෝපකරණ 8 ක් 2022 වර්ෂයේ පැය 970.6 ක් ක්‍රියාත්මක කර අමතරව පුද්ගලික අංශයෙන් කුලී පදනම මත ලබාගත් යන්ත්‍රෝපකරණ සඳහා බාහිර සැපයුම්කරුවන්ට රු.24,523,761 මුදලක්ද ගෙවා තිබුණි. එසේ වුවද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ස්ථානයට කිලෝමීටර 10 ත් 51 ත් අතර දුරකින් මිනිපේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අයත් යන්ත්‍රෝපකරණ 9 ක් නවතා දමා තිබුණද ඒවා යොදා ගැනීමට ඇති හැකියාව සලකා බලා නොතිබුණි. එම යන්ත්‍ර වර්ෂය තුළ ක්‍රියාත්මක කර | ඉන්ධන ලබා ගැනීමේ ගැටලුව මත දෙපාර්තමේන්තුව සතු යන්ත්‍ර ක්ෂේත්‍රයේ යොදා ගැනීමට නොහැකි වී ඇත. | දෙපාර්තමේන්තුවට අයත් යන්ත්‍ර ක්‍රියාකරවන්නන් හා යන්ත්‍ර උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායිතාවයෙන් යුතුව උපයෝජනය වන බව තහවුරු කළ යුතුය. |

තිබුණේ යන්ත්‍ර පැය 987ක් පමණක් විය.

### 3.13 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2023 ඔක්තෝබර් 31 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 3ක් | පිළිතුරු සකස් කරමින් පවතී. | අදාළ ලිපි ලේඛනයන්හි සහතික කරන ලද පිටපත් ද සහිතව සියලුම විගණන විමසුම් සඳහා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඉ) වගන්තිය යටතේ නියම කර ඇති කාලසීමාවන් තුළ අදාළ විගණන විමසුම් ආමන්ත්‍රණය කර ඇති නිලධාරීන් විසින් විධිමත් පරිදි පිළිතුරු ඉදිරිපත් කළ යුතුය. |

### 3.14 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල යෝජනා ක්‍රම, වැව් හා ජලාශවල අනවසර ඉදිකිරීම් හා වගාකිරීම්. | | |
| (i) | දෙපාර්තමේන්තුවට අයත්ව පවතින ජල යෝජනා ක්‍රම, වැව් හා ජලාශ 387 කින් වැව් හා ජලාශ රක්ෂිත ප්‍රදේශ 116 ක රක්ෂිතයන්හි අනවසර පදිංචි හෝ වගාකිරීම් සිදුකර තිබුණි. 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 65 වන වගන්තියේ හා වාරිමාර්ග රක්ෂිත සීමා, දෙපාර්තමේන්තු ඉඩම් ආරක්ෂා කිරීම හා නිදහස් කිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014 දෙසැම්බර් 01 දින නිකුත් කර | අනවසර පදිංචි හෝ වගා කිරීම් ඇති වැව්/ ජලාශ සංඛ්‍යාව අදාළ වන්නේ කුමන වැව් සම්බන්ධයෙන්ද, මූලස්ථායි වැඩ හෝ ඇළ පද්ධති සම්බන්ධයෙන් ද, මූලස්ථායී වැඩ සම්බන්ධයෙන් නම් උඩාවත (upstream) හිද යටාවතෙහිද (downstream) ද යන්න අපැහැදිලිය. අංක 8/2014 චක්‍රලේඛයේ 1 හා 3 | අනවසර පදිංචිකරුවන් සම්බන්ධ තොරතුරු පද්ධතියක් සකස් කර යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. අනවසර ක්‍රියාකරකම් සම්බන්ධව වාරිමාර්ග ආඥාපනතේ සඳහන් නියමයන්ට අනුව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබූ අංක 08/2014 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධානයන් අනුගමනය කර මේ සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රකාරව රක්ෂිත ප්‍රදේශ හඳුනාගත යුතුය. ඒ පිළිබඳ යාවත්කාලීන තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යායුතුය. | |
| (ii) | ඇතැම් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවලට අයත් වැව්/ජලාශ සම්බන්ධයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 දෙසැම්බර් 01 දිනැති අංක 08/2014 දරන චක්‍රලේඛයෙහි 1 හා 3 ඡේද ප්‍රකාරව දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන වැව් හා ජලාශවල රක්ෂිත ප්‍රදේශ සීමා හඳුනාගෙන එහි වපසරිය පිළිබඳ තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණි. පෞරාණික වටිනාකමක් සහිත තිස්ස වැවේ වැව් රක්ෂිතය තුළ කුඹුරු වගාකර තිබුණද එකී අනවසර වගාකිරීම් සම්බන්ධයෙන් උක්ත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමකින් හා අනුමැතියකින් තොරව අනවසර වගාකිරීම් වැවේ සීමාවෙන් පිටතට සිටිනසේ වැව තුළ ඇළක් කපා බැම්මක් ඉදිකර වැව වටා පාරක් සකස් කරමින් පැවතුණි. | වාරිමාර්ග ආඥා පනතේ 115 වගන්තිය ප්‍රකාරව සර්වේයර් ජනරාල්ගේ හෝ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අධිකාරිය යටතේ සිදු කළ බව කියන කිසියම් පිඹුරකින් හෝ මැනුමකින්, කිසියම් ඇළක්, ජල මාර්ගයක් හෝ වැවක් අනවසරෙන් අල්ලාගෙන ඇති බව පෙනී යන්නේ නම්, ඊට පටහැනිව සතුටුදායක සාක්ෂි නොමැති අවස්ථාවක, එම පිඹුර හෝ මැනුම (Plan or Survey) එහි දක්වා ඇති කරුණු පිළිබඳ තීරණාත්මක සාක්ෂියක් ලෙස සලකනු ලැබේ.<br>ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල සහ කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල සතුව පවත්නා පිඹුරුපත් හෝ මැනුම් පිළිබඳව විමසීමක් සිදු කර ඇති අතර එකී තොරතුරු පදනම්ව සහ සඳහන් කර ඇති චක්‍රලේඛයේ උපදෙස් ද සැලකිල්ලට ගෙන වාරි පද්ධති වල රක්ෂිත සීමා පිළිබඳ තොරතුරු විධිමත්ව පවත්වාගෙන යමි.<br>මෙම ඉදි කිරීමට සම්බන්ධ සිදු වීම හා එහි වත්මන් තත්ත්වය පිළිබඳව ප්‍රා.වා.ඉ. (තිස්සමහාරාම) වෙතින් කරුණු විමසා ඇති අතර, තොරතුරු ලැබීමෙන් අනතුරුව කඩිනමින් ඉදිරිපත් කරමි. | අංක 8/2014 චක්‍රලේඛයේ 1 හා 3 ප්‍රකාරව රක්ෂිත ප්‍රදේශ හඳුනාගත යුතුය.<br>ඒ පිළිබඳ යාවත්කාළීන තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යායුතුය.<br>චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව තිස්ස වැවේ වැව් රක්ෂිතය හඳුනාගත යුතුය.<br>වැව් රක්ෂිතය තුළ අනවසර වගාකිරීම් සිදුකළ පුද්ගලයින්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 285 වැනි පරිච්ඡේදයේ 64 වැනි වගන්තිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඒ යටතේ පාලනය වන ප්‍රධාන හා මධ්‍ය පරිමාණ ජල යෝජනා ක්‍රම ප්‍රධාන ගංගා ද්‍රෝණි ජලපෝෂක හා රක්ෂිතයන්හි | වාරිමාර්ග ආඥා පනතේ විෂය පථයට අයත් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් යටතේ පාලනය වන වාරිමාර්ග වැඩවල ආරක්ෂාව, වාරිමාර්ග රක්ෂිතයන්හි අනවසර ක්‍රියාකාරකම් පාලනය කරමින් මෙහෙයුම් හා නඩත්තු සිදුකිරීම | වාරිමාර්ග ආඥා පනතේ 285 වැනි පරිච්ඡේදයේ 64 වන වගන්තියේ සඳහන් නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආරක්ෂාව, අනවසර ඉදිකිරීම් හා වගා කටයුතු පාලනය, ජලය අපවිත්‍ර කිරීමෙන් වලක්වා ගැනීම, අනවසර ජල භාවිතය පාලනය කිරීම හා වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි නඩත්තුව කළ යුතු වුවද ඒ සම්බන්ධ විධිමත් නියාමනයක් සිදුකිරීමට අවශ්‍ය නිර්ණායක නිකුත්කර නොතිබුණි. | වාරිමාර්ග ආඥා පනත මගින් සලසා ඇති ප්‍රතිපාදනයන් අනුගමනය කරමින් වාරිමාර්ග ආඥා පනත ප්‍රකාරව වර්තමානයේදී සිදු කෙරේ. | |
| (ආ)<br>(i) | ජල සම්පත් සංවර්ධනය සහ ගංවතුර පුරෝකතනය සඳහා භෞතිකව මිනුම් ලබා ගන්නා ජල මාපක 42 ක්, පර්යන්ත ජල මාපක 52 ක් හා ස්වයංක්‍රීය වැසි හා ජල මාපක 106 ක් ස්ථාපිත කර තිබුණද ඒවා භාවිතයෙන් දත්ත එක් රැස් කරන හා සාරාංශ කරන ආකාරය, දත්ත හා පිළියෙල කරන ලද තොරතුරු ගබඩා කර තබා ගන්නා ආකාරය, දත්ත හා තොරතුරු ඉල්ලුම් කරන පාර්ශව වෙත තොරතුරු ලබාදෙන හා තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කරන ආකාරය, ආපදා කළමනාකරණයේදී අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය වන ආකාරය, තොරතුරු ප්‍රසිද්ධ කරන ආකාරය යනාදිය සම්බන්ධයෙන් වගකිව යුතු දෙපාර්තමේන්තුවේ ජල විද්‍යා හා ආපදා කළමනාකරණ අංශය විසින් පිරිවිතර හා ක්‍රමවේද නිශ්චය කර නොතිබුණි. | සඳහන් කර ඇති සියලුම කරුණු සම්බන්ධයෙන් නිශ්චිත තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කරන බව සඳහන් කරමි. එහෙත් ලිඛිත අත්පොතක් පිළියෙල කර නොමැති බැවින් එවැනි අත්පොත් ඉදිරියේදී පිළියෙල කර ඉදිරිපත් කරමි. | දත්ත රැස්කිරීම, සකස් කිරීම, ගබඩා කිරීම හා බෙදාහැරීම සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ නිශ්චිත චක්‍රලේඛ උපදෙස් හා මාර්ගෝපදේශ නිකුත් කළ යුතුය. |
| (ii) | ජල මාපක 106 අතරින් ජල මාපක 77 ක් හා වර්ෂා මාපක 61 ක් අක්‍රියව පැවතුණි. ඒ අතරින් ඇතැම් ඒවා 2017 වර්ෂයේ සිට ක්‍රියාකිරීමට නොහැකි තත්ත්වයට පත්ව තිබූ නමුත් ඉකුත් වසර තුළදී ඒවා අළුත්වැඩියා කර සේවයේ යෙදවීමට කටයුතු කර නොතිබූ අතර ජල මාපකයන්හි දත්ත ලබාගැනීම සඳහා යොදවන ලද සේවකයින් වෙනමම ඒකක කාර්යාල පිහිටුවා ඒවා වෙත අනුයුක්ත කරද තිබුණි. | ස්වයංක්‍රීය ජල මාපක DSWRP ව්‍යාපෘතිය යටතේ වර්ෂ 2014 සවිකර ඇත. ඒවායින් ඇතැම් උපකරණ වල බිඳවැටීම් සිදුවන විට, ඒ වන විට ව්‍යාපෘතිය මගින් සපයා තිබූ අමතර කොටස් යොදාගෙන අලුත්වැඩියා කිරීම් සිදුකර ඇත. | අක්‍රියව පවත්නා ජලමාපක අලුත්වැඩියා කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. ජල මාපකයන්හි දත්ත ලබා ගැනීම සඳහා යොදවන ලද සේවකයින් ආසන්නයේ පිහිටි ප්‍රාදේශීය වාර්මාර්ග ඉංජිනේරු කාර්යාලන්හි අධීක්ෂණයට ලක්කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ කුඩා ජල විදුලි බලාගාර (Mini Hydro Power) 213 ක් මගින් 2022 වර්ෂයේ කිලෝ වොට් පැය (kwh) 1,375,965,915 ක් නිෂ්පාදනය කර තිබූ නමුත් මේ සඳහා වාරිමාර්ග | කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති සඳහා දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ නිකුත් කිරීමේදී<br>ජලවිද්‍යා අංශයේ නිර්දේශ, ජල සම්පත් සංවර්ධන අංශයේ | කුඩා ජල විදුලි බලාගාර ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීමේදි ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ පරිසර අංශය මඟින් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | නිර්දේශ, වාරිමාර්ග කලාප කාර්යාලයේ නිර්දේශ, ක්ෂේත්‍ර පරීක්ෂණයේ නිරීක්ෂණ හා පරිසර බලපෑම් අධ්‍යයන වාර්තාවේ කරුණු සලකා බලා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබාදේ. මෙම ක්‍රමවේදය 2022 වර්ෂයේදී ද කුඩා පරිමාණ ජල විදුලි බලාගාර සඳහා නිර්දේශ ලබා දීමේදී ක්‍රියාත්මක කර ඇත. | නිශ්චිත චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය. කුඩා ජල විදුලි බලාගාර සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතුය. |
| (ඈ) | 2017 ජූලි 18 දිනැති අංක අමප/17/1456/729/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා හා වැඩමුළු පැවැත්වීම සඳහා 2017 වර්ෂයේ දී අනුමැතිය ලබා ගෙන තිබූ නමුත් පසුගිය වසර 06 තුළම ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා කිසිවක් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා හා වැඩමුළු පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක මහාපරිමාණ හා මධ්‍යපරිමාණ ව්‍යාපෘති 19 ක් සඳහා රු. මිලියන 158,242 ක්ද වෙනත් ව්‍යාපෘති 7 ක් සඳහා රු. මිලියන 43,375 ක්ද ඇස්තමේන්තු කර තිබූ අතර මෙම ව්‍යාපෘති සඳහා 2022 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. මිලියන 60,056 ක් හා රු.මිලියන 15,787 ක් වැයකර තිබුණි. මේ අතරින් ව්‍යාපෘති 17 ක් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සියළුම මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 මැයි 21 හා 2019 ජූනි 24 දිනැති අංක DMA/PRF/10/2019/01 දරන විගණන මාර්ගෝපදේශ ලිපි අනුව දේශීය හා විදේශීය මූල්‍යනය සහිතව ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති කාර්යාලවල විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපනය කර අවම වශයෙන් වර්ෂයකට කමිටු රැස්වීම් හතරක්වත් පැවත්විය යුතු වුවද 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ දේශීය හා විදේශීය අරමුදලින් ක්‍රියාත්මක ව්‍යාපෘති 26 විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | 2022 පෙබරවාරි 07 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ 1/2022හි උපදෙස් අනුව (කළමනාකරණ චක්‍රලේඛ 01/2019 අනුව) ව්‍යාපෘති කාලය වසරකට වඩා වැඩි හා මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 5 ඉක්මවූ ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණන ඒකක පිහිටවිය යුතු බවත් ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් 02ක් පැවැත්විය යුතු බවත් අමාත්‍යංශ මට්ටමේදී අර්ධ වාර්ෂිකව කමිටු රැස්වීම පැවැත්විය යුතු බවත් දන්වා ඇත.<br>දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක ඉහත නිර්ණායක වලට යටත් ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘති අභ්‍යන්තර විගණන කමිටු පැවැත්වීමට නොහැකි වී ඇත. නමුත් 2022 වර්ෂයේ දෙපාර්තමේන්තුව සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වූ අතර සියලුම ව්‍යාපෘති වලට අදාළව පැන නැඟුණු කරුණුද සාකච්ඡා කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපනය කර අවම වශයෙන් වර්ෂයකට කමිටු දෙකක් පවත්වා එම ව්‍යාපෘතිවල මෙහෙයුම් කටයුතු නිසි අධීක්ෂණයට ලක්කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය 7007ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 5387ක් වූ අතර ඊට අමතරව දෛනික වැටුප්, ඉටුකළ කාර්ය හා වෙනත් ගෙවීම් පදනම් මත | පිළිතුරු සපයා නැත. | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සේවා ගිවිසුම් හා වෙනත් සේවා ගිවිසුම් යටතේ බඳවාගැනීම් සිදු නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සේවා ගිවිසුම් යටතේ විවිධ කටයුතු සඳහා බාහිර පුද්ගලයින් බඳවාගෙන ගෙවීම්කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට එවැනි කාර්ය මණ්ඩලය 334 ක් වූ අතර ඉන් 04 කාර්යාලවලට අනුයුක්ත කර තිබුණි. | | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.1.2(ආ) I වගන්තිය අනුව III වන ශ්‍රේණියේ සෘජු බඳවා ගැනීම් සඳහා වෘත්තීය සුදුසුකම ලෙස ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයෙන් වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව හදාරා සහතිකයක් ලබා තිබීම පිළිගෙන ඇති අතර එම පාඨමාලාව NVQ 6 මට්ටමේ විය යුතු විය. සේවා ව්‍යවස්ථාව අනුමත කර වසර 05 ක් ගතවී ඇතත් අදාළ ඉංජිනේරු ඩිප්ලෝමාව සඳහා NVQ 6 මට්ටම අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා NVQ – 06 මට්ටම ලබාගැනීමට අවශ්‍ය සියලු කටයුතු සිදුකර ඇති අතර 2014 ඔක්තෝබර් 02 දින සිට 2016 ඔක්තෝබර් 01 දින දක්වා වලංගු වන පරිදි තාවකාලික ලියාපදිංචියක්ද ලබා දී ඇත. ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචිය ලබාගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත. | වාරිමාර්ග ඉංජිනේරු ඩිප්ලෝමාව සඳහා NVQ – 06 මට්ටම අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තු සංවිධාන සටහන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරවාගෙන නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරු අනුව පිළියෙල කරන ලද සංවිධාන සටහන ඉදිරිපත් කරන ලදී. | දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |